සැ. යු. - 2023.12.22 දින පළ කරන ලද අංක 2364 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,365 - 2023 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2023.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(අ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු-ඇබෑර්තු	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	6154
අතුරු ව්‍යවස්ථා	6164
පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	6170

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජනවාරි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජනවාරි 05 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

6153 - B 82518— 5,403 (2023/11)

පළාත් පාලන නිවේදන

පදවිය ප්‍රාදේශීය සභාව

පදවිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් ලබා ගැනීම

පදවිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන ලේකම් වන ඩී. ඒ. තරංග රුවන් කුමාර වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පදවිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් සඳහා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර විධානය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ඒ. තරංග රුවන් කුමාර,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටු කරන නිලධාරී,
පදවිය ප්‍රාදේශීය සභාව.

විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටු කරන පදවිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අළුත් තක්සේරුවක් කිරීමට 1987 අංක - 15 ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තිය ප්‍රකාරව පදවිය බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අලුත් තක්සේරුවක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් පදවිය ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපල මත අලුත් තක්සේරුවක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරුමැද පළාත,
අනුරාධපුර.

12-631/1

පදවිය ප්‍රාදේශීය සභාව

පදවිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත, වරිපනම් බදු ප්‍රතිශතය නිවේදනය කිරීම

පදවිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන ලේකම් වන ඩී. ඒ. තරංග රුවන් කුමාර මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පදවිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත 4%ක වරිපනම් බද්දක් පනවා අය කිරීමට උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ඒ. තරංග රුවන් කුමාර,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටු කරන නිලධාරී,
පදවිය ප්‍රාදේශීය සභාව.

විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පදවිය බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට 4% වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකිරීම සඳහා පදවිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන පදවිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී. ඒ. ටී. ආර්. කුමාර ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරුමැද පළාත,
අනුරාධපුර.

12-631/2

බිංගිරිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ලේකම් කරුණානායක රාජපක්ෂ පතිරැන්නැහැලාගේ ගංගා රාණි කරුණානායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) සහ 146 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් කලාපයක් ලෙසට හඳුනා ගන්නා ලද වීරපොකුණ වරිපනම් කලාපය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට වියයුතු බවට 2023.12.20 දිනැති 2023/2233 අංක දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

කේ. ආර්. පී. ජී. ආර්. කරුණානායක,
ලේකම්,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 20 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීරපොකුණ වරිපනම් කලාපය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2023 වර්ෂයේ සිදු කරනු ලැබූ තක්සේරුව පදනම් කරගෙන 2024 වර්ෂයේ සිට එකී වරිපනම් කලාපය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද බිංගිරිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද, එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල බිංගිරිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක්ද බිංගිරිය ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*I වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*I වැනි තීරුව* *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2024.03.31	2024.01.31
දෙවන කාර්තුව	2024.06.30	2024.04.30
තුන්වන කාර්තුව	2024.09.30	2024.07.31
හතරවන කාර්තුව	2024.12.31	2024.10.31

12-737

සංශෝධනයයි

සූරියවැව ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) යටතේ 2017.06. 16 වන දින අංක 2,024 මගින් මහජනයා වෙත ප්‍රසිද්ධ කරන ලද සූරියවැව ප්‍රාදේශීය සභාවේ දියුණුකළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ *ගැසට්* නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලබනබව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවකට ලැබී ඇති බලතල ප්‍රකාර සූරියවැව ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂයේ අගෝස්තු මස 30 වැනි දිනැති තීරණ අංක 8(11) යටතේ තීරණය කරන ලද පහත සඳහන් තීරණය එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් අමාලි උපමාලිකා සංජීවනී ගුණසේකර වන මා විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාලි යූ. එස්. ගුණසේකර,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කෙමසාරිස්,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය..

2023 නොවැම්බර් මස 30 වැනි දින,
හම්බන්තොට පළාත් පාලන කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ තීරණයට හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ. ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවටත්, සූරියවැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන ලදී.

උපලේඛනය

සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අංක 103 දරන සූරියවැව ග්‍රාම නිලධාරි වසම ද,
අංක 105 දරන සමාජසේවා පුර ග්‍රාම නිලධාරි වසමේ කොටසක් වන ගල් වැව හංදිය ගම්මානයෙන් ද සමන්විත වේ.

12-736

සංශෝධනයයි

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

දියුණු කල ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) යටතේ 2013.09.13 දින අංක 1828 මගින් මහජනයා වෙත ප්‍රසිද්ධ කරන ලද අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීමේ *ගැසට්* නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවකට ලැබී ඇති බලතල ප්‍රකාරව අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ මැයි මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 8:4 යටතේ සභා සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උප වගන්තියෙන් පළාත් පාලන සහකාර

කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් අමාලි උපමාලිකා සංජීවනී ගුණසේකර වන මා විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාලි යූ. එස්. ගුණසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

2023 නොවැම්බර් මස 20 වැනි දින,
හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

මේ පිළිගැනීමේ යෝජනා සම්මුතියට හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාදීමට ක්‍රියා කළ යුතු බවටත් අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

01. කොටස

අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 187 දරන අඟුණකොළපැලැස්ස ග්‍රාම නිලධාරී වසමට අයත්-වන්නා වූ,

උතුරින්	:	ආචාරියගම ග්‍රාම නිලධාරී වසම් සීමාව සහ යකාගල ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	ආචාරියගම ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
දකුණින්	:	අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල සීමාවෙන් ද,
බටහිරින්	:	යකාගල ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදේශයත්

02. කොටස

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 188 නිලධාරී ආචාරියගම ග්‍රාම නිලධාරී වසමට අයත් වන්නා වූ,

උතුරින්	:	කංකානම්ගම ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල සීමාවෙන් ද,
දකුණින්	:	අඟුණාකොළපැලැස්ස ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
බටහිරින්	:	යකාගල ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදෙශයත්

03. කොටස

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 189 නිලධාරී යකාගල ග්‍රාම නිලධාරී වසමට අයත්වන්නා වූ,

උතුරින්	:	අළුත්වැව ග්‍රාම නිලධාරී වසම් සීමාව සහ හැලේකඩ ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	කංකානම්ගම ග්‍රාම නිලධාරී වසම් සීමාව සහ ආචාරියගම ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් සහ අඟුණකොළපැලැස්ස ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
දකුණින්	:	නෙටොල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශ සීමාවෙන් ද,
බටහිරින්	:	ජදුර ග්‍රාම නිලධාරී වසම් සීමාව සහ ගුරුන්නැහේගෙආර ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදේශයන්

04. කොටස

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 190 නිලධාරී අළුත්වැව ග්‍රාම නිලධාරී වසමට අයත්වන්නා වූ,

උතුරින්	:	බිංකම ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	කංකානම්ගම ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
දකුණින්	:	යකාගල ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
බටහිරින්	:	හැලේකඩ ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදේශයත් වේ.

12-639

සංශෝධනයයි

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) යටතේ 2013.09.13 දින අංක 1828 මගින් මහජනයා වෙත ප්‍රසිද්ධ කරන ලද අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ *ගැසට්* නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2012 වර්ෂයේ මැයි මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 8:4 යටතේ සභා සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් අමාලි උපමාලිකා සංජීවනී ගුණසේකර වන මා විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාලි යූ. එස්. ගුණසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

2023 නොවැම්බර් මස 20 වැනි දින,
හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

මේ පිළිගැනීමේ යෝජනා සම්මුතියට හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාදීමට ක්‍රියා කළයුතු බවටත් අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

01. කොටස :

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 187 දරන අඟුණකොළපැලැස්ස ග්‍රාම නිලධාරී වසමට අයත්-වන්නා වූ,

උතුරින්	:	ආචාරියගම ග්‍රාම නිලධාරී වසම් සීමාව සහ යකාගල ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	ආචාරියගම ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද,
දකුණින්	:	අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල සීමාවෙන් ද,
බටහිරින්	:	යකාගල ග්‍රාම නිලධාරී වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදේශයත්,

02. කොටස

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 188 නිලධාරි ආචාරියගම ග්‍රාම නිලධාරි වසමට අයත් වන්නා වූ,

උතුරින්	:	කංකානම්ගම ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල සීමාවෙන් ද,
දකුණින්	:	අඟුණකොළපැලැස්ස ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
බටහිරින්	:	යකාගල ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදේශයත්

03. කොටස :

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 189 දරන යකාගල ග්‍රාම නිලධාරි වසමට අයත්වන්නා වූ,

උතුරින්	:	අළුත්වැව ග්‍රාම නිලධාරි වසම් සීමාව සහ හැලේකඩ ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	කංකානම්ගම ග්‍රාම නිලධාරි වසම් සීමාව සහ ආචාරියගම ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් සහ අඟුණකොළපැලැස්ස ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
දකුණින්	:	නෙටෝල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශ සීමාවෙන් ද,
බටහිරින්	:	ජදූර ග්‍රාම නිලධාරි වසම් සීමාව සහ ගුරුන්නැහේගෙආර ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදේශයත්

04. කොටස :

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 190 දරන අළුත්වැව ග්‍රාම නිලධාරි වසමට අයත්වන්නා වූ,

උතුරින්	:	බිංකම ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
නැගෙනහිරින්	:	කංකානම්ගම ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
දකුණින්	:	යකාගල ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
බටහිරින්	:	හැලේකඩ ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද, මායිම්ව ඇති ප්‍රදේශයත් වේ.

12-671

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත යටතේ විරෝධතා කැඳවීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ එළ හරක් මස් වෙළෙඳාමක් සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යාම පිණිස 2024 වර්ෂය සඳහා බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇති අතර එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් කුමන කරුණක් නිසාදැයි යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරියේ 7(1) වගන්තිය යටතේ දැනුම් දෙමි.

ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2023 ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දීය.

"

උපලේඛනය

අයදුම්කරුගේ නම	*මස් වෙළෙඳාම් කරනු ලබන ස්ථානය*	*වෙළෙඳාමේ ස්වභාවය*
එම්. එච්. එම් රිස්වි මහතා 20, ජයසුන්දර මාවත, නාවලපිටිය	ආර්. එම්. ජාබිර් මහතා අංක 43/2, ඕවිට, නාවලපිටිය (බදු ගිවිසුමකට අනුව ලබාගත් ස්ථානයකි)	හරක් මස් වෙළෙඳාම

12-774

ආණ්ඩුකාරවර කාර්යාලය - උතුරුමැද පළාත

විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැබිතිගොල්ලෑව බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට 4% වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඩී. ඒ. ටී. ආර්. කුමාර ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

කැබිතිගොල්ලෑව සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත වරිපනම් බදු ප්‍රතිශතය නිවේදනය කිරීම

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍යය ඉටුකරන ලේකම්, එන්. ඩී. ඒ. තරංග රුවන් කුමාර වන මා විසින් 1987 අංක ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත 4% ක වරිපනම් බද්දක් පනවා අය කිරීමට උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදය කරමි.

ඩී. ඒ. තරංග රුවන් කුමාර,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යය ඉටුකරන නිලධාරී,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

01-762/1

ආණ්ඩුකාරවර කාර්යාලය - උතුරුමැද පළාත

විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අලුත් තක්සේරුවක් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තිය ප්‍රකාරව කැබිතිගොල්ලෑව බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අලුත් තක්සේරුවක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරුමැද පළාත,
අනුරාධපුර.

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව

කැබිතිගොල්ලෑව සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් ලබාගැනීම

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍යය ඉටුකරන ලේකම්, එන්. ඩී. ඒ. තරංග රුවන් කුමාර වන මා විසින් 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත

පැවරී ඇති බලතල ප්‍රකාරව කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් සඳහා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා විධානය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ඒ. තරංග රුවන් කුමාර,
ලේකම්,
බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යය ඉටුකරන නිලධාරී,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

01-762/2

කළුතර මහා නගර සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

252 වන අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කළුතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි එල්. පී. මනෝජා එස්. පතිරණ වන මම 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය සඳහා මහා නගර සභා සඳහා වූ සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම වර්ෂ 2023 ක් වූ දෙසැම්බර් මස 28 දිනැති තීරණ අංක KMC/RPPDF/D/2023/08 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 28 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා එම වගන්තිය අනුව ප්‍රසිද්ධ කරනු ලබන බව හා එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 252 වන අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියෙන් මහා නගර සභාවලට බලය දෙනු ලැබ ඇති බවත්, එම අතුරු ව්‍යවස්ථා ඉහත කී දෙවන වගන්තියේ තුන් වන (3) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට හා බලය දෙනු ලබන බව 1989 ජනවාරි මස 20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) පළාත් පාලන කොටසේ පළ කර ඇත.

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ පළමුවැනි උපවගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී පරිදි නිවේදනය කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා කළුතර මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2023 නොවැම්බර් මස 08 දින සිට වැළඳ ගන්නා බවටත් අදාළ විය යුතු බවටත් 252 වන අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

තව ද, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත අදාළ කර ගනිමින් බලාත්මක වන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/46 හා 2014.11.14 දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කරනු ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/07 හා 2015.12.28 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* නිවේදනය කරනු ලදුව අංක 1998 හා 2016 දෙසැම්බර් මස 16 දිනැති *ගැසට් පත්‍රයේ* පළකර ඇති නිවේදනයක් මගින් කළුතර මහා නගර සභාව විසින් වැළඳ ගන්නට යෙදුන සම්මත අතුරු ව්‍යවස්ථා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ තුන්වන උපවගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥාපනතේ 325 (ඊ) වගන්තියේ විධිවිධාන අනුව එතෙක් ගනු ලැබූ ක්‍රියාමාර්ග යන්ට අගතියක් නොවන පරිදි 2023 නොවැම්බර් 07 දිනෙන් පසුවට කළුතර මහා නගර සභා බල ප්‍රදේශය අයත් ප්‍රදේශ සඳහා අදාළ නොවිය යුතු බවට 252 වන අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය යටතේ සඳහන් විධිවිධාන යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කළ බව මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

03-783

කැකිරාව ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට අදාළ වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

2023 වර්ෂයේ නොවැම්බර් මස 30 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු රැස්වීමේදී යෝජනා අංක KSP/2023/11/30/217 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. ඒ. එස්. කේ. රත්නායක,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
කැකිරාව.

2023 නොවැම්බර් 30 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 146(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි දියුණු කළ ප්‍රදේශය තුළ පවතින සියලුම නිවාස වල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම 2023 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 7.5(7.5%) ක වරිපනම් බද්දක් පනවා අයකල යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 161(7) (i, ii, iii) වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමටත්,

තව ද, 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කැකිරාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල කැකිරාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5%ක වට්ටමක් කැකිරාව ප්‍රාදේශීය සභාව විසින් ලබාදෙන බවට තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II* වැනි තීරුව	*III* වැනි තීරුව
කාර්තුව	ගෙවිය යුතු දිනය	5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය
පළමු කාර්තුව	2024.01.31 දින හෝ ඊට පෙර	2024.01.31 දින
දෙවන කාර්තුව	2024.04.30 දින හෝ ඊට පෙර	2024.04.30 දින
තුන්වන කාර්තුව	2024.07.31 දින හෝ ඊට පෙර	2024.07.31 දින
හතරවන කාර්තුව	2024.10.31 දින හෝ ඊට පෙර	2024.10.31 දින

උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) උප වගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කැකිරාව බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියාව වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් 7.5 (7.5%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකිරීම සඳහා කැකිරාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන කැකිරාව ප්‍රාදේශීය උප සභාවේ ලේකම් පී. කේ. ඒ. පෙරේරා ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරු මැද පළාත.

2023 අගෝස්තු මස 16 වන දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

12-696/2

උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

විෂය භාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන කැකිරාව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අළුත් තක්සේරුවක් හෝ සත්‍යාක්ෂණයක් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගතයුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අළුත් තක්සේරුවක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් කැකිරාව ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අළුත් තක්සේරුවක් හෝ සත්‍යාක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරු මැද පළාත.

2023 අගෝස්තු මස 16 වන දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

12-696/3

අතුරු ව්‍යවස්ථා

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබූ හා 2022.09.13 දින පැවති මහා සභාවේ තීරණ අංක 5 (vii) දරන යෝජනාව මඟින් සම්මතව ඇති මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර නවීන් දිසානායක වන මවිසින් අනුමත කරන ලද බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නවීන් දිසානායක,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
සබරගමුව පළාත් සභාව.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර පවත්වාගෙන යාම, විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 දරන වගන්තිය හා 126 (xiv) වගන්තිය ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ඇහැලියගොඩ ආදාහනාගාරය පවත්වාගෙන යාම, විධිමත් කිරීම, පාලනය කිරීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

03. (අ) සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයේ කවර හෝ මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතුය.

(ආ) මියගිය යම් තැනැත්තෙකුගේ මරණ සහතිකයේ 7 වෙනි තීරුවේ ''මරණයට හේතුව හෝ භූමිදානය හෝ ආදහනය කරන ස්ථානය'' යන්නෙහි ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය නම් කර සඳහන් ව ඇත්තේ නම් මිස එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීමට හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

04. *(අ)* මෘත දේහයක් ආදාහනය කිරීමට අය කරන ගාස්තු ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මඟින් නියම කරනු ලැබිය හැකි අතර එවැනි යෝජනා සම්මතයක් මඟින් එකී ගාස්තුව කලින් කල සංශෝධනය කිරීමේ බලය සභාව සතු වේ.

(ආ) ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු *ගැසට්* පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ආදාහනාගාරය වෙන් කරවා ගැනීමට අයදුම්පත භාර ගන්නා ස්ථානයේ හා ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කළ යුතුය.

(ඇ) ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීමට අපේක්ෂා කරනු ලබන සෑම පුද්ගලයෙකු විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාව පළමු උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවා අවසර ගත යුතුය.

(ඈ) මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරයට භාර දීමෙන් පසුව ආදාහනය කරන අතරතුරේ දී හෝ ආදාහනය කිරීමට පෙරාතුව ආදාහනාගාරයේ යන්ත්‍ර සූත්‍රවල දෝෂයක් හෝ විදුලිය ඇනහිටීමක් හෝ නිසා මෘත දේහය භූමිදානය කිරීමට තීරණය කිරීමේ බලය සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා සතුය.

05. දෙවැනි වගන්තියේ දැක්වෙන අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන (මෙහි මින් මතු ''ඉල්ලුම්කරු'' යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු මෙහි පහත දැක්වෙන ලේඛන සමග මෙහි දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කර ගත් ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) මියගිය තැනැත්තා හා ඉල්ලුම්කරු අතර සම්බන්ධතාවය තහවුරු කිරීමට අදාළ කරගත හැකිවනු පිණිස,

1. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත
2. මියගිය අයගේ ජාතික හැඳුනුම්පත/මියගිය අයගේ උප්පැන්න සහතිකය (ඇත්නම්)
3. ඉල්ලුම්කරු පදිංචිව සිටි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ සහතිකය සහ

(ආ) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන ''අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් උප්පැන්න හා මරණය ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41 (ඉ) ඡේදය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර දෙමින් නිකුත් කළ සහතිකය හෝ අජීවී උපතකින් බිහිකළ මෘත ශරීරයක් නම්, උප්පැන්න හෝ මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කළ සහතිකය, සහ/හෝ,

(ඇ) මියගිය තැනැත්තා සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද මරණ සහතිකය.

06. මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍රයක් මත අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම් එවැනි අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මෙහි පස්වන උපලේඛනයේ ලේඛනගත කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. මේ ලේඛන අයදුම්පත් භාර ගන්නා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ පවත්වාගත යුතුය.

07. ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පතකට අනුව යම් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා භාර ගැනීමට තීරණය කරන ලද්දේ නම් පළමු වැනි උපලේඛනය අනුව පනවන ලද නියමිත ගාස්තු අයකර ගැනීමෙන් පසු සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනයට අනුකූලව පිළියෙළ කරන ලද අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතුය. එකී අවසර පත්‍රයට අනුව ආදාහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදාහනාගාරය භාරකරු වෙත ගෙනවිත් භාර දිය යුතු දිනය හා වේලාව එකී අවසර පත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතුය.

08. කිසියම් හේතුවක් මත මෘත ශරීරයක් භාර නොගන්නේ නම් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට අදාළ කරුණු ද සමග ඒ බව වහාම ඉල්ලුම්කරු වෙත මෙම අතුරු ව්‍යවස්ථාවේ තෙවන උපලේඛනයට අනුකූලව ලිඛිත දැන්වීමක් කරනු ලැබිය යුතුය.

09. ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීම සඳහා සතියේ සෑම දිනකම **පෙරවරු 9.00 සිට රාත්‍රී 8. 00** දක්වා කාලය තුළ කළ යුතු ය. අවස්ථාචෝචිත පරිදි එම කාලය තුළ ආදාහනය කළ නොහැකි මෘත ශරීරය පසු දින තෙක් ආදාහනාගාරයේ තබාගෙන පසුදින ආදාහනය කිරීමට හැකි වන්නේ ය.

10. සෑම අවසර පත්‍රලාභියෙකු විසින් ම නිකුත් කළ අවසර පත්‍රයේ නිරූපිත වේලාවන්ට හෝ ඊට පෙර මෘත දේහය ආදාහනාගාරය භාරකරුට භාර දිය යුතුය. එකී වේලාවට මෘත දේහය භාර දීමට ප්‍රමාදවීම හේතුවෙන් ඉල්ලුම්කරු හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තෙකුට සිදුවන යම් අපහසුතාවයක් හෝ අලාභයක් සම්බන්ධයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වගකීමකට යටත් නොවිය යුතුය.

11. ආදාහනාගාරයේ ආදාහනය කරන ලද එක් එක් මෘත දේහයක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ හයවන උපලේඛනයට අනුකූලව විස්තර ඇතුළත් කරන ලද ලේඛනයක් ආදාහනාගාර භාරකරු විසින් පවත්වාගෙන යා යුතුය.

12. *(අ)* සෑම මෘත දේහයක් ම ආදාහනය කර පැය හැත්තෑ දෙකක් ගත වීමට පෙර ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙක් විසින් මියගිය මෘත දේහයේ භෂ්මාවශේෂ භාර ගත යුතුය.

(ආ) මෘත දේහය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරය වෙන් කරවා ගන්නා අවස්ථාවේ මෘත දේහය ආදාහනය කිරීමෙන් පසු භෂ්මාවශේෂ තැන්පත් කර තැබීම සඳහා මරණකරුගේ නම සහ ලිපිනය සඳහන් භාජනයක් (තදින් මූඩිය වැසිය හැකි) මියගිය අයගේ ළඟම ඥාතීන් විසින් ආදාහනාගාර භාරකරු වෙත ලබා දිය යුතුය.

(ඇ) ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන භෂ්මාවශේෂ මියගිය අයගේ ළඟම ඥාතීන්ට හැර වෙනත් පුද්ගලයින්ට භාරදීමක් සිදු නොකළ යුතුය.

(ඈ) එසේ වුව ද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයාගේ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකිය.

(ඉ) ඉහත (ඈ) ඡේදය යටතේ භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගැනීමට දීර්ඝ කරන කාලය ආදාහනය සිදු කළ දින සිට සති 2 ට නොවැඩි විය යුතුය.

(ඊ) එසේ භෂ්මාවශේෂ ඉවත්කර ගැනීමට ඉඩ දෙන කාලය අවසන් වීමෙන් පසුව ද ඉවත් කර නොගත් භෂ්මාවශේෂ බැහැර කිරීමට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නියෝගය පරිදි ආදාහනාගාරයේ භාරකරුට බලය තිබිය යුතුය.

(උ) කිසියම් ඉල්ලුම්කරුවෙකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් භාර නොගත් භෂ්මාවශේෂ ආදාහනාගාර පරිශ්‍රයේ හෝ යම් සුසාන භූමියක වළ දැමීමට කටයුතු සැලැස්වීම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය.

(ඌ) ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන භෂ්මාවශේෂ 11 (අ) වැනි වගන්තියේ සඳහන් විධිවිධානයන්ට අනුව භාර දී ඇති භාජනයකට දමා ප්‍රවේශම් සහිතව තත් කාර්යය සඳහා වෙන් කොට ඇති කොටසේ හෝ කුටියෙහි ආදාහනාගාරයේ භාරකරු විසින් තැන්පත් කර තැබිය යුතුය.

13. *(අ)* කිසියම් ආදාහනාගාරයක කුටිරයට මෘත දේහය ඇතුළත් කර එකී ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටිරය ආවරණය කළ කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයන් හැර වෙනත් යම් තැනැත්තෙක් ඇතුල්වීම නොකළ යුතුය.

(ආ) සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියාගේ හෝ ආදාහනාගාර භාරකරුගේ අවසරය නොමැතිව යම් තැනැත්තෙකු ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම නොකළ යුතුය.

(ඇ) (ආ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද,

(i) මෘත දේහයක් ආදාහනය කිරීමට යම් තැනැත්තෙකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදාහනය සඳහා භාරදීමට ඔහු හෝ බලයලත් තැනැත්තෙකු සමග එකී අවස්ථාවට සහභාගී වන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් සහ,

(ii) ආදාහනය කරන ලද යම් මෘත දේහයක භෂ්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමග පැමිණෙන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තියක් ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීමට පෙර අවසර ලැබී ඇති තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතුය.

(ඈ) මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මත කිරීමේ දී ඇතිවන යම් ගැටලුවක දී සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය තුළ ;

(අ) සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,

(ආ) ආදාහනාගාර පරිශ්‍රය තුළ ඇති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් දේපළවලට අලාභහානි කිරීමට හෝ එසේ කිරීමට තැත් කිරීම.

(ඇ) ආදාහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම නොකළ යුතුය.

(ඈ) ආදාහනාගාරය වෙන් කරනු ලබන අයෙකුගෙන් යම් දේපළක් හෝ ගොඩනැගිල්ලකට හෝ උපකරණයකට අලාභයක් වුවහොත් සභාපතිවරයා නියම කරනු ලබන තක්සේරු වටිනාකම ගෙවීමට ආදාහනාගාරය වෙන් කරනු ලබන අය එකඟ විය යුතු ය.

15. *(අ)* මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාරය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(ආ) යම් විටක ආදාහනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදාහනාගාරය වසා තබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනයක් භාෂාත්‍රයෙන්ම මෘතදේහ ආදාහනය සඳහා අවසර පත්‍ර නිකුත් කරන කාර්යාලය හා ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කරනු ලැබුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව ඒ සඳහා නිසි බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු එකී වගන්තියේ සඳහන් දඩයකට යටත් වන්නේ ය. තව ද නොකඩවා එකී වරද සම්බන්ධයෙන් වරදකරුවන් වන්නේ නම් එකී වරද කරනු ලබන සෑම අවස්ථාවක් සඳහාම එකී වගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද එම තැනැත්තා යටත් වන්නේ ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල,

''සභාපතිවරයා'' යන්නෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

''බලයලත් නිලධාරියා'' යන්නෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පැවරූ නිලධාරියා ද,

''දහන කුටීරය'' යන්නෙන් ආදාහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරය හා පිටතින් සාදන ලද බාහිර කුටීරය ද,

''ආදාහනාගාර පරිශ්‍රය'' යන්නෙන් සම්පූර්ණ ආදාහනාගාරය සහ ඊට අයත් භූමිය ද,

''ආදාහනාගාර භාරකරු'' යන්නෙන් තත්කාලයේ දී ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත් කරනු ලැබ ඇති යම් සේවකයෙක් ද,

'භෂ්මාවශේෂ'' යන්නෙන් යම් මෘත දේහයක් ආදාහනය කිරීමෙන් අනතුරුව මෘතදේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂවන යම් ද්‍රව්‍යයන් ද,

''මෘත ශරීරය'' යන්නෙන් මියගිය යම් කිසි තැනැත්තෙකුගේ සම්පූර්ණ මෘතදේහය හෝ අජීවී දරු උපතක මෘතදේහය හෝ යම් මෘතදේහයකින් කිසියම් කොටසක් ද,

අදහස් වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් පවතින යම් අවස්ථාවක දී සිංහල පිටපත බලපැවැත්වේ.

පළමුවැනි උපලේඛනය

ආදාහනාගාර පාවිච්චි කිරීමේදී අය කරනු ලබන ගාස්තු :

1. බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට	රු. 10,000 0
2. බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට	රු. 12,000 0

..... බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු ලෙස සනාථ කිරීම

(i) එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය සනාථ කිරීමේ වාර්තාව.

(ii) .....මරණාධාර සමිතියේ හෝ ගම තුළ සාමාජිකත්වය දරන වෙනත් සමිතියක ලියාපදිංචි බවට සමිතියේ සහතිකය.

දෙවන උපලේඛනය
(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය)

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීම.

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :.....
ලිපිනය :.....
ජාතික හැඳුනුම්පත් අංකය:.....
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම:.....

02. මියගිය අයගේ සම්පූර්ණ නම :.....
ලිපිනය :.....
ජාතික හැඳුනුම්පත් අංකය :.....
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම :.....

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධය :.....
(තහවුරු කිරීමට 4 වෙනි අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න)

04. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය හා දිනය :.....
(මරණ සහතිකයේ පිටපතක් අමුණන්න)

05. මරණය ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නම සහ කොට්ඨාසය :.....

06. මරණයට හේතුව :.....

07. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් (4 වෙනි වගන්තියේ) (ආ) ඡේදයේ දැක්වෙන සහතිකය අමුණන්න.)

පරීක්ෂණ නිලධාරියාගේ නම සහ තරාතිරම :.....

පරීක්ෂණ පැවැත් වූ දිනය:.....

පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :.....

මෘත දේහය ආදාහන කිරීමට පරීක්ෂණ නිලධාරියා අවසර දී තිබේ ද?:.....

08. ආදාහනය කිරීමට ඉල්ලා සිටින වේලාව සහ දිනය :.....

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාරගනු ලබන බවටත් වැඩිදුරටත් දන්වා සිටිමි. අදාළ සහතිකය අමුණා ඇත.

දිනය :.....

අයදුම්කරුගේ අත්සන:.....

තුන්වන උපලේඛනය

..... මහතා/මහත්මිය වෙත

මෘත දේහයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති අයදුම්පත්‍රයට අවසර පත්‍රයක් නිතුත් කිරීම පහත දැක්වෙන හේතු මත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

(i) .....
(ii) .....
(iii). .....

. .....
සභාපති/
බලයලත් නිලධාරිගේ අත්සන
(නිල මුද්‍රාව).

දිනය .....

හතරවන උපලේඛනය

මෘත දේහයක් ආදාහනය කිරීමට නිකුත් කරන අවසර පත්‍රය

(01) .....යන අයගේ මෘත දේහය 20..... ක් වූ .....මස .....දින පෙරවරු/පස්වරු..... ට ආදාහනාගාරයේ දී ආදාහනය කිරීමට මෙයින් අවසර දෙමි. පසුපිට අයදුම් පත්‍රයේ දැක්වෙන තොරතුරු මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වෙනි වගන්තියේ සඳහන් ලේඛනයේ සටහන් කරන ලදී.

(02) 20.....දින අංක.....දරන ලදුපත මගින් රු..... ක් අය කරගෙන ඇත.

(03) මෙම අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 10 වෙනි අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදාළ ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදාහනය කිරීමට ක්‍රියා කරන්න.

(04) අවසර ලේඛනයේ අනුක්‍රමික අංකය .....වේ.

.....
සභාපති/
බලයලත් නිලධාරීගේ අත්සන.
(නිල මුද්‍රාව).

දිනය.....

පස්වෙනි උපලේඛනය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයෙන් මෘත දේහ ආදාහනය කිරීමට අයදුම්පත්‍ර භාර ගැනීමේ ලේඛනය

අනු: අංකය	මියගිය අයගේ නම	ජා.හැ.ප. අංකය	ස්ත්‍රී/පුරුෂ භාවය	මියගිය දිනය	මරණ සහතිකයේ ලියාපදිංචි කළ		ඉල්ලුම් කරුගේ		මරණ කරුගේ		මහෙස්ත්‍රාත්/ හදිසි මරණ පරීක්ෂක නියෝගය		අවසරපත් අංක	ලදුපතේ		ආදාහනය සඳහා වෙන් කළ	
					අංකය	දිනය	නම	මරණකරුට ඇති සෑකම	ලිපිනය	ජා.හැ.අංකය	යොමු අංකය	දිනය		අංකය	මුදල රු. ශත	දිනය	වේලාව
01.																	
02.																	

හයවෙනි උපලේඛනය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ, ආදාහනය කරන ලද මෘත දේහය පිළිබඳ ලේඛනය
(ආදාහනාගාරයේ භාරකරු විසින් පවත්වාගෙන යා යුතුය.)

අනු අංකය	මියගිය අයගේ නම	ජා.හැ.ප. අංකය	ස්ත්‍රී/පුරුෂ භාවය	මියගිය දිනය	මරණ සහතිකයේ ලියාපදිංචි කළ		ඉල්ලුම් කරුගේ		අඩංගුවන් අංක	ලදුපතේ		ආදාහනය කළ		භෂ්මාවශේෂ ගෙන ගිය දිනය
					අංකය	දිනය	නම	ජා.හැ.අංකය		අංකය	මුදල් රු. ශත	දිනය	වේලාව	
01.														
02.														

12-776

විවිධ දැන්වීම්

කුරුවිට ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

2023 දෙසැම්බර් මස 19 වැනි දින ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ අංක 20 දරන කමිටු නිර්දේශය හා 2023 දෙසැම්බර් මස 19 වැනි දින අංක 20 දරන ලේකම් තීරණය පරිදි අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ බලපත්‍ර ගාස්තුව 2024 මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එච්. ආර්. වීරක්කොඩි,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව, කුරුවිට.

2023 දෙසැම්බර් මස 20 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින්, 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ලැබීම්වලින් 1% ක බලපත්‍ර ගාස්තුවක් ලෙස 2024 වර්ෂය සඳහා නියම විය යුතු බව තීරණය කරමි.

උපලේඛනය

I වන තීරය *බලය දෙනු ලබන කාර්යය*		*II වන තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 ට ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
අප්‍රසන්න වෙළඳාම :				
1.	ග්‍රොසරි	500 0	750 0	1,000 0
2.	සත්ව ගොවිපළ	500 0	750 0	1,000 0
3.	කිතුල් ආශ්‍රිත නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
4.	රබර් ෂීට්/ඔට්ටපාලු ගබඩා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
5.	කරවල වර්ග අලෙවිය	500 0	750 0	1,000 0
6.	පළතුරු බිම අලෙවිය	500 0	750 0	1,000 0
අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :				
1.	වී මෝල	500 0	750 0	1,000 0
2.	ලියවන පට්ටලය	500 0	750 0	1,000 0
3.	මදුරු දූල් අලෙවිය	500 0	750 0	1,000 0
4.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය	500 0	750 0	1,000 0
5.	නූඩ්ල්ස් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
6.	අමානෝ ෂීට් හා වැහිපීලි අලෙවිය	500 0	750 0	1,000 0
7.	ලිහිසි තෙල් අලෙවිය	500 0	750 0	1,000 0
8.	තෑගි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	ග්‍රැනයිට් ආශ්‍රිත නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	සිලිකා ගල් සැකසීම	500 0	750 0	1,000 0
11.	ලී බඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12.	සෙවිලි තහඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0

කුරුවිට ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

2023 දෙසැම්බර් මස 19 වැනි දින ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ අංක 20 දරන කමිටු නිර්දේශය හා 2023 දෙසැම්බර් මස 19 වැනි දින අංක 20 දරන ලේකම් තීරණය පරිදි අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එච්. ආර්. වීරක්කොඩි,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව, කුරුවිට.

2023 දෙසැම්බර් මස 20 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂයට ගෙවිය යුතු බවත්, කරගෙන යනු ලබන පහත සඳහන් උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් එහි II වන තීරුවේ ඒ එක් එක් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපී තීරුවේ නිරූපිත ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02. රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03. රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04. රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	362 0
05. රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

ව්‍යාපාර බදු අදාළවන ව්‍යාපාර ලැයිස්තුව :

1. ඡායාරූප ශාලාව
2. මල් තවාන

සැලකිය යුතුයි : 2023.11.17 දින *ගැසට් පත්‍රයේ* ව්‍යාපාර බදු ලෙස පළ වූ අනු අංක 41 මුද්‍රණාල හා 44, රේස් ඔට්ටු අල්ලන බුකි 70, කරවල වර්ග අලෙවිය 75, පළතුරු බීම අලෙවිය ව්‍යාපාර බදුවලින් ඉවත්වන බව දන්වා සිටිමි.

දඹුල්ල ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කළ ප්‍රදේශය සම්බන්ධයෙන් වරිපනම් බදු නියම කිරීම

දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ දෙසැම්බර් මස 06 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු නිර්දේශය මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වන වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණ අංක (02) යටතේ පහත දැක්වෙන තීරණය අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ දෙසැම්බර් මස 08 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශ බවට ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල පිහිටා ඇති දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර නේවාසික කටයුතු සඳහා භාවිත කරන සියලුම, නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකමෙන් සියයට හයක ප්‍රතිශතයක (6%) වරිපනමක් ද වාණිජ කටයුතු සඳහා භාවිත කරන සියලුම ගොඩනැගිලිවල හා ඉඩම්වල වාර්ෂික වටිනාකමෙන් සියයට දහයක ප්‍රතිශතයක (10%) වරිපනම් බද්දක් 2024 වර්ෂය සඳහා නියම කිරීමටත්, සහ

එකී වරිපනම්, එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවන ලෙසට, එකී 134 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ විධානය කිරීමටත්,

ඉහත 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන වගන්තියෙන් හා 146 වන වගන්තියේ නියම කර ඇති ආකාරයට පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතු යැයි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වන වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණ අංක (02) යටතේ පහත දැක්වෙන තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

12-641/1

දඹුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ දෙසැම්බර් මස 06 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු නිර්දේශය මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වන වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණ අංක (02) යටතේ පහත දැක්වෙන තීරණය අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද වෙළඳ බලපත්‍ර ගාස්තු එකී වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව.

2023 වර්ෂයේ දෙසැම්බර් මස 08 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ වෙළෙඳ බලපත්‍රයක් ලබා ගතයුතු කිසියම් ව්‍යාපාරයක් දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම පහත උපලේඛනවලින් දක්වා ඇති පරිදි ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම්ව වූ වාර්ෂික වෙළෙඳ බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, වෙළෙඳ බලපත්‍රයක් ලබා ගතයුතු ව්‍යාපාරයක් කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුම එකී වෙළෙඳ බලපත්‍ර ගාස්තුව ගෙවා 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර වෙළෙඳ බලපත්‍රය ලබා ගතයුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වන වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය අනුව පැනවෙන බලපත්‍ර ගාස්තු

උපලේඛනය අංක 01 (i) -- පීඩාකාරී ව්‍යාපාර :

අංකය	*I තීරය* *බලපත්‍රයේ ස්වභාවය*	*II තීරය* *වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි* *රු. ශත*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
02.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03.	සම් විකිණීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
05.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	700 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම	500 0	700 0	1,000 0
08.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
09.	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම	500 0	750 0	1,000 0
15.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවත්වීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රස කැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම	500 0	700 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගඩබා කිරීම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0 500 0	750 0 750 0	1,000 0 1,000 0

අංකය	I තීරය බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි රු. ශත	II තීරය වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත
29.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0 500 0	750 0 750 0	1,000 0 1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
45. විදුලි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. බීම පැකට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. විදුලි නාම පුවරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. නූල් නිපදවීමේ හා වර්ණ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. ඉලාස්ටික් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. රේස් බයි රේස් ස්ථානයක් පවත්වාගෙන යාම
51. බෝල මේසයක් පවත්වාගෙන යාම
52. ඇස් කණ්නාඩි නිෂ්පාදනය හා වෙළඳාම කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. එසන්ස් වර්ග නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. කිරි හලක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
56. දන්ත සායනයක් පවත්වාගෙන යාම
57. සත්ව සායනයක් පවත්වාගෙන යාම
58. ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
59. බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
60. පොලිතීන් පටල නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම
63. බේකරියක් පවත්වාගෙන යාම
64. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම

65. ජලය පිරිසිදු කර බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. වාෂ්ප බලයෙන් ජල බලයෙන් ලී පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. මහා පරිමාණයේ වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
68. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන ලී මෝලක් පවත්වාගෙන යාම
69. බැනසෝ එකක් පවත්වාගෙන යාම(හැඩ කපන)
70. ගෘහ භාණ්ඩ පොලිෂ් කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම
71. රාමු කියත් (වෙහෙරාන්)
72. පැන්ට්‍රි කබඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. ඉරූ දැව සහිත ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම
74. දැව කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75. ශීතකරණ විකිණීම හෝ ආනයන කර ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. කමිස කරපටි හා කමිස අත් සකස් කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම
77. බටහිර ඖෂධ වර්ග වෙළඳාම් කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම
78. ධාන්‍ය වෙළඳාම් කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම
79. සපත්තු ලේස් කොට නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80. ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. ආහාර පිසීම සඳහා ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. වාහන ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
84. අපනයන හෝ ආනයන කිරීමේ වැඩ කටයුතු සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
85. දර මඩුවක් පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86. නූල් නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. යකඩ බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. තොග වශයෙන් සීනි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. පරණ ටයර්, ටියුබ් හා පුරවන ලද ටයර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. අකුරු කෙටීමේ ව්‍යාපාරයක් ස්ථානයක් පවත්වාගෙන යාම
91. බෙලෙක් වැඩ පළක් පවත්වාගෙන යාම
92. බුමුතුරුණු හා ෆෝමිකා ෂීට් විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. තොග වශයෙන් පිටි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. විෂබීජ නාශක ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
95. බේකරි වලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96. ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97. පිඟන් බඳු වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98. දැන්වීම් පුවරු සකස් කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම
99. උත්සව ශාලාවක් පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100. ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
101. ස්නැක් කඩදාසි හෝ පරණ කඩදාසි බෝතල්, ගෝනි, පරණ යකඩ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
102. ගොඩනැගිලි ද්‍රව්‍ය, නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
103. කඩදැසි බෑග් නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
104. කෞතුක භාණ්ඩ වෙළඳාම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
105. තොග වශයෙන් වෙළඳාම දියලුණු ගබඩා කිරීම හෝ ලුණු කුඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106. මල් ශාලාවක් පවත්වාගෙන යාම (ස්වභාවික)
107. අවමංගල්‍ය භාණ්ඩ වෙළඳාම හා කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. හඳුන්කුරු නිෂ්පාදනය හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. හිස් බැරල් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. බිත්තර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. පැණි ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112. බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
113. පළතුරු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. කඩල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115. එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
116. කම්හල් වැඩ පලක් පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම

117. හාල් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
119. කරවල වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
120. යතුරු පැදි හා ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
121. පරණ ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරන වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
122. රථ අංගන ස්ථානයක් පවත්වාගෙන යාම
123. යකඩ හා වානේ වැඩපලක් පවත්වාගෙන යාම
124. විදුලි බල මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
125. කැබ් සර්විස් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
126. රථ වාහන වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
127. තුනී ලෑලි (එම්. ඩී. එෆ්.) කර්මාන්තය, වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
128. ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම
129. පෙර පාසලක් පවත්වාගෙන යාම
130. ක්‍රීඩා පුහුණු ඒකකයක් පවත්වාගෙන යාම
131. අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් ක්‍රමයකින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
132. වතුර බවුසර් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
133. පෞද්ගලික උපකාරක පන්ති පවත්වාගෙන යාම
134. බලයලත් මත්පැන් විකිණීම හා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
135. බීර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
136. ලී ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
137. වඩු මඩුවක් පවත්වාගෙන යාම
138. මාළු හෝ මස් වෙළඳාම කරන ස්ථානයක් පවත්වාගෙන යාම

ඉහත ගාස්තුවලට අමතරව රජය විසින් පනවන ලද බදු අය කරනු ලැබේ.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරිය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම
2. මිනිරන් ගබඩා කර තැබීම
3. පොහොර නිෂ්පාදනය
4. පොහොර ගබඩා කර තැබීම
5. හම් ගබඩා කර තැබීම
6. උම්බලකඩ හොන්ඩර් පහකට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
7. කුකුළු වෙළඳ පොලක් පවත්වාගෙන යාම
8. කළුගල් කැඩීම හා කබොක් කැපීම
9. බොරලු හැරීම
10. අශ්වයින් හෝ ගවයින් සඳහා ඉස්තාලයක් , වෙළඳ පොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම
11. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම
12. රබර් සකස් කිරීම
13. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි ගබඩා කිරීම
14. පුවක් සකස් කිරීම
15. තලාතු මිනිරන් සකස් කිරීම
16. බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහාවූ මඩුවක් හෝ ගාලක් තබාගැනීම
17. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
18. හුනු ගබඩා කොට තැබීම
19. බොම්බයි ලූණු හොණ්ඩර 5කට වඩා ගබඩා කොට තැබීම
20. අර්තාපල් හොණ්ඩර 5කට වඩා ගබඩා කොට තැබීම
21. පොල්කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩාකර තැබීම
22. කුරුඳු කරදමුංගු හෝ කෙඳි ගෙන්දගම් දුම්ගස්සා සකස් කිරීම
23. පරණ ලෝහ ගබඩා කිරීම
24. සිමෙන්ති හොන්ඩර 25කට වඩා ගබඩා කොට තැබීම
25. කරවල හොන්ඩර 100 කට වඩා ගබඩා කර තැබීම
26. ලුනු දැමූ මාළු හොන්ඩර 100කට වඩා ගබඩා කොට තැබීම

27. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම
28. ට්‍රන්ක් පෙට්ටි නිෂ්පාදනය
29. මරා මස්කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම
30. ගම් වර්ග නිෂ්පාදනය
31. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
32. බැටරි පුරවනු ලබන්නා වූ බැටරි ගබඩා කොට තබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
33. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
34. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
35. හිස් බෝතල් 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර පවත්වාගෙන යාම
36. කුරුඳු පොතු හොන්ඩරයකට වඩා ගබඩා කර තැබීම
37. කොකෝවා හොන්ඩරයකට වඩා ගබඩා කර තැබීම
38. මිනි පෙට්ටි සෑදීම හෝ ගබඩා කර තැබීම
39. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කර තැබීම
40. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔප දැමීම
41. බලපත්‍රලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම
42. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම
43. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම
44. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
45. පිටි හෝ කුළුබඩු ඇඹරීම
46. පුන්නක්කු හැර සත්ව ආහාර හොන්ඩර 20කට වඩා ගබඩා කර තැබීම සත්ව ආහාර හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම, එහෙත් සමූපකාර සමිති විසින් ගබඩා කර තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නීතියට යටත් නොවේ.
47. රබර් භාණ්ඩ නිෂ්පාදනය
48. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම
49. යන්ත්‍රානුසාරයේ ඇටකටු ඇඹරීම
50. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
51. පොලිතින්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, නිපදවීම හා ගබඩා කර තැබීම
52. ඇසිඩ් ගැලුම් 05කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
53. කපුරු නිෂ්පාදනය
54. බූට් සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය
55. ඉට් පන්දම් නිෂ්පාදනය

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

1. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදා ගෙන දැව හෝ ලී ඉරීම
2. සිසිල් බීම නිෂ්පාදනය
3. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
4. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය
5. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය
6. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම
7. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කර තැබීම
8. ගිනි පෙට්ටි නිෂ්පාදනය
9. ඉඹුල් පුලුන් ගබඩා කර තැබීම
10. පොල්තෙල් ගැලුම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
11. මැනිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කර තැබීම
12. ඇසිටිලින් නිෂ්පාදනය
13. උළු 500 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
14. ගඩොල් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
15. කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
16. සිගරට් නිෂ්පාදනය
17. බීඩි නිෂ්පාදනය
18. තීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
19. ලී පෙට්ටි හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම

20. කොහු නිෂ්පාදනය
21. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණු ගෝනි හැර වෙනත් ගෝනි 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
22. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
23. රස කැවිලි නිෂ්පාදනය
24. පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
25. බෝට්ටු හෝ බත්තල් සෑදීම
26. ලී පෙට්ටි සෑදීම
27. ඔක්සිජන් සහ වෑල්ඩින් වැඩ කරනු ලබන්නා වූ මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූද ගරාජයක් නොවන්නා වූද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
28. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නාවූද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
29. මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම
30. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
31. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
32. අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
33. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම
34. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
35. ගෙන්දගම් සහ/හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
36. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය
37. 100 කට අධික ප්‍රමාණයක් පතරොම් ගබඩා කර තැබීම
38. කොහු හෝ කොට්ට කුෂන් නිෂ්පාදනය සහ හෝ ගබඩා කර තැබීම
39. අලුත් ටයර් හෝ ටියුබ් 150 කට අධික ප්‍රමාණයක් ගබඩා කර තැබීම
40. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250 කට අධික ප්‍රමාණයක් ගබඩා කර තැබීම
41. ස්ප්‍රේ පේන්ටින් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම
42. යාන්ත්‍රිකරණ ශීතකරණ සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
43. යාන්ත්‍රිකරණ බලය පාවිච්චි කරනු ලබන්නා වූ ඇඳුම් මැසීම කරනු ලබන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම
44. කමිස කොලර් සහ කමිස අත්රැළි දමන ආයතනයක් පවත්වාගෙනයාම

මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක කර්මාන්ත සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

1. ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම
2. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන්නා වූද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
3. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිංවැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
4. ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම
5. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය
6. අශුද්ධ ලෝහ උනු කිරීම
7. ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම
8. කිලෝග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරවන ද්‍රව්‍ය ගබඩා කිරීම
9. ගම, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම
10. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය
11. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
12. ශීතකරණ අලුත්වැඩියා කිරීම, රිකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
13. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
14. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙනයාම
15. පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් ව්‍යාපාරයක් සඳහාද ඒ ව්‍යාපාරය හැර වෙනත් කිසිම ව්‍යාපාරයක්, බලපත්‍රලත් ස්ථානයෙහි පවත්වාගෙන යාමට කිසිම බලපත්‍රලාභියෙකු විසින් ඉඩ නොදිය යුතුය.

ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්යය සඳහා, අප්‍රසන්න හා අන්තරාදයක වෙළෙඳාම් හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. රබර් නිවාරණය කිරීම
2. පොහොර, හුණු හෝ මිනිරන් බහා තැබූ ගෝනි මළු ගබඩා කිරීම, කුඩු පිස දැමීම, ශුද්ධ කිරීම හෝ අලුත්වැඩියා කිරීම
3. තලාතු මිනිරන් නිවාරණය කිරීම
4. හුණු ගබඩා කිරීම
5. කිලෝ ග්‍රෑම් 50ට වැඩියෙන් පොල්කටු අඟුරු ගබඩා කිරීම
6. ගෙන්දගම් දුම් භාවිතා කරමින් කුරුඳු, කරදමුංගු හෝ කෙඳි නිවාරණය කිරීම
7. ඔට්ටුපාලු ඇඹරීම හෝ වේලීම
8. බැටරි චාර්ජ් කරනු ලබන හෝ ගබඩා කරනු ලබන, යාන්ත්‍රික බලය භාවිතයට ගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
9. ටියුබ් හෝ ටයර් වොල්කනයිස් කරන, යාන්ත්‍රික බලය යොදා නොගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
10. කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් කුරුඳු ගබඩා කිරීම
11. කිලෝග්‍රෑම් 500 ට වැඩියෙන් කොකෝවා ගබඩා කිරීම
12. මිනී පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
13. දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
14. බලපත්‍රය ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කිරීම
15. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
16. යාන්ත්‍රික බලය භාවිතා කරන්නාවූ රෙදි වියන කම්හලක් පවත්වාගෙන යාම
17. පිටි හෝ තුනපහ වර්ග කෙටීම
18. රබර් බඩු, නිෂ්පාදනය කිරීම
19. දුම්, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම, කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
20. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
21. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය
22. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය
23. තෙල් සිදීම සඳහා සෙක්කුවක් හෝ අතින් ක්‍රියාකරවන මෝලක් පවත්වාගෙන යාම
24. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
25. ගිනි පෙට්ටි නිෂ්පාදනය
26. පුළුන් ගබඩා කිරීම
27. ලීටර් 227 1/2 ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම
28. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම
29. ඇසිටිලින් නිෂ්පාදන
30. සිගරට් නිෂ්පාදනය
31. බීඩි නිෂ්පාදනය
32. කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් තීන්ත හෝ වාර්නිස් ගබඩා කිරීම
33. කිලෝ ග්‍රෑම් 250ට වැඩියෙන් ලී පෙට්ටි ගබඩා කිරීම
34. කොහු නිෂ්පාදනය
35. රස කැවිලි නිෂ්පාදනය
36. පොහොර, හුනු හෝ මිනිරන් දමා තිබූ ගෝනි මළු හැර, කිලෝග්‍රෑම් 100ට වැඩියෙන් වෙනත් ගෝනි මලු ගබඩා කිරීම
37. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 ට වැඩියෙන් ගබඩා කිරීම
38. පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් ගබඩා කිරීම
39. ලී පෙට්ටි නිෂ්පාදනය
40. යාන්ත්‍රික බලය පාවිච්චි කරන ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
41. යාන්ත්‍රික බලය පාවිච්චි කරන යකඩ හෝ ලෝහ වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
42. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන අලුත්වැඩියා කරන හෝ සර්විස් කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
43. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන සර්විස් කරන හෝ අලුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
44. යාන්ත්‍රික බලය පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
45. අත් යන්ත්‍ර හෝ පාගන යන්ත්‍ර පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම

46. පරණ ඇඳුම් ගබඩා කිරීම
47. ලීටර් 54 ට වැඩියෙන් පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තල් ගබඩා කිරීම පිණිස අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
48. ඇඳුම් ඩ්‍රයික්ලීන් කරන ආයතනයක් පවත්වාගෙන යාම
49. යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන විද්‍යුත් ලෝහාලේපන කිරීම, ක්‍රෝමියම් ආලේපනය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය කිරීම
50. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලෝහාලේපනය කිරීම, ක්‍රෝමියම් ආලේපනය කිරීම
51. මෝටර් වාහන අලුත්වැඩියා කරන ගරාජයක් සහ ආර්ක් වෙල්ඩිං වැඩ කිරීම
52. කවර හෝ වර්ගයක උපකරණයක් ක්‍රියාකරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිතා කෙරෙන යම් ස්ථානයක් පවත්වාගෙන යාම
53. කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් ඕනෑම වර්ගයක ප්ලාස්ටික් බඩු තබා ගැනීම
54. සියලු වර්ගයේ ප්ලාස්ටින් බඩු නිෂ්පාදනය
55. කිලෝ ග්‍රෑම් 50ට වැඩියෙන් කවර හෝ වර්ගයක පොලිතින් බඩු තබා ගැනීම
56. සියලු වර්ගවල පොලිතීන් බඩු නිෂ්පාදනය කිරීම
57. කොහු නිෂ්පාදනය හා තබා ගැනීම
58. කිලෝ ග්‍රෑම් 1000 ට වැඩියෙන් තේ කොළ තබා ගැනීම
59. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් කඩදසි සහ/හෝ කවර වර්ගයක හෝ කඩදසි බඩු ගබඩා කිරීම
60. ඇඟලුම් නිෂ්පාදනය
61. බත්කඩ
62. රසායන ද්‍රව්‍ය
63. කිලෝග්‍රෑම් 50ට වැඩි සියලු වර්ගවල ගිණිකෙලි භාණ්ඩ තබා ගැනීම
64. කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් එල්. පී. ජී. (LPG) සිලින්ඩර් ගබඩා කිරීම
65. හිස් වැසුම් සහ තොප්පි නිෂ්පාදනය
66. කිලෝ ග්‍රෑම්100 ට වැඩියෙන් රබර් බඩු (සියලු වර්ගවල) ගබඩා කිරීම
67. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම
68. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම
69. ලීටර් 91 ට වැඩියෙන් ඇසිඩ් ගබඩා කිරීම
70. එකවරකට සේවා නියුක්තිකයින් 25ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
71. ද්‍රව ඛනිජ තෙල් ගෑස් ඇතුළුව ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම
72. පතරොම් සහ වෙඩි බෙහෙත්

12 -782/2

කළුතර මහා නගර සභාව

2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු අය කිරීම

කළුතර මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය හා කර්තව්‍ය ඉටු කරන කළුතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් එල්. පී. මනෝජා එස්. පතිරණ වන මම මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 247(ආ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත පරිදි කර්මාන්ත බදු නියම වියයුතු බවට 2023.12.28 දිනැතිව තීරණ අංක KMC/RPPDF/D/2023/14 යටතේ තීරණය කළ බවට මෙයින් නිවේදනය කරමි. එනම්,

මහා නගර සභා ආඥාපනතේ 247(ආ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන යම් කර්මාන්තයක් සඳහා 2024 වර්ෂයට කර්මාන්ත බදු නියම කිරීම පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර සඳහා එහි සඳහන් බදු අනුප්‍රමාණ යටතේ විය යුතු බවට එකී මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා බලතල,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

කර්මාන්ත විෂයෙහි බදු අය කිරීම - 247 (ආ) වගන්තිය

බදු ගාස්තු චක්‍රය

ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම	*අය කළ යුතු මුදල් බදු මුදල* *රු. ශත*
රු. 1,500 ට අඩු	2,000 0
රු. 1,500 - රු. 2,500	3,000 0
රු. 2,500 ට වැඩි	5,000 0

අනු. අංකය	*වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය*
01.	වාහන කුෂන් සීට් කවර නිෂ්පාදනය
02.	පස් සෝදු වැලි නිෂ්පාදනය
03.	ගමන් මලු පාසල් බෑග් නිෂ්පාදනය
04.	හතු නිෂ්පාදනය
05.	විදුලි බල්බ නිෂ්පාදනය
06.	සූර්යය පැනල් නිෂ්පාදනය
07.	මෝටර් කොයිල් එතීමේ නිෂ්පාදනය
08.	වෙස් මුහුණු නිෂ්පාදනය
09.	හඳුන්කුරු නිෂ්පාදනය
10.	කුළුබඩු පැකට් කිරීම
11.	පාපිසි/බුමුතුරුණු නිෂ්පාදනය
12.	නාමපුවරු සකස් කිරීම
13.	පින්තූර රාමු කිරීම
14.	බීරළු කැටයම් කැපීම
15.	සපත්තු ලේස් කොඩි නිෂ්පාදනය
16.	ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය
17.	ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා වෙළඳාම් කිරීම
18.	කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීම
19.	අත්යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20.	බලයලත් මත්පැන් විකිණීම, නිෂ්පාදනය කිරීම කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම
21.	බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීම
22.	බීඩින් හා මෝල්ඩින් නිෂ්පාදනය හා වෙළඳාම

තක්සේරු නොවූ දේපළ සඳහා මහා නගර සභාවේ ආදායම් පරීක්ෂකගේ තාවකාලික තක්සේරුව මත බලපත්‍ර ගාස්තු ගෙවිය යුතුය. කර්මාන්ත විෂයෙහි බදු ගෙවිය යුතුය.

ඉහත ව්‍යාපාර තුළට නොවැටෙන තක්සේරු දෙපාර්තමේන්තුව හෝ කළුතර මහා නගර සභාවේ තක්සේරු අංශය විසින් කර්මාන්ත ලෙස පිළිගනු ලබන වෙනත් ව්‍යාපාර.

12 -782/3

කළුතර මහා නගර සභාව

2024 වර්ෂයට ව්‍යාපාර බදු අය කිරීම

කළුතර මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය හා කර්තව්‍ය ඉටු කරන කළුතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් එල්. පී. මනෝජා එස්. පතිරණ වන මම මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 247(ඇ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත පරිදි ව්‍යාපාර බදු නියම විය යුතු බවට 2023.12.28 දිනැතිව තීරණ අංක KMC/RPPDF/D/2023/15 යටතේ තීරණය කළ බවට මෙයින් නිවේදනය කරමි. 2024 වර්ෂය සඳහා 2024 මාර්තු 31 වන දිනට පෙර ගෙවිය යුතු බව වැඩි දුරටත් දැනුම් දෙමි. එනම්,

මහා නගර සභා ආඥාපනතේ 247(ඇ) ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන බලපත්‍රයක් අවශ්‍ය නොවන යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* 247(ආ) වගන්තිය යටතේ කිසිම බද්දක් නොගෙවිය යුතු යම් වෙළඳ

ව්‍යාපාරයක් හෝ මහා නගර සභා පාලන සීමාව තුළ යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන අවස්ථාවකදී පහත උපලේඛනයේ සඳහන් බදු අනුප්‍රමාණ යටතේ විය යුතු බවට එකී මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා
බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් බද්ද - 247(ඇ) වගන්තිය
(අ) බදු චක්‍රය

මහා නගර සභා ආඥා ාපනත ප්‍රකාරව හෝ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 247 (ඇ) වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ සෑම යම් ව්‍යාපාරයක් සඳහා පෙර වර්ෂයේ ලැබීම් අනුව පහත සඳහන් පරිදි ව්‍යාපාරික බද්දක් ගෙවිය යුතු වේ.

බදු ගාස්තු චක්‍රය :

ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම	*අය කළ යුතු මුදල බදු මුදල රු. ශත*
රු. 75000 - 1,50,000	1,200 0
රු. 1,500 ට වැඩි	3,000 0

12 -782/4

කළුතර මහා නගර සභාව

2024 වර්ෂයට තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන සතුන් හා වාහන වෙනුවෙන් බදු පනවා අය කිරීම

කළුතර මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය හා කර්තව්‍ය ඉටු කරන කළුතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් එල්. පී. මනෝජා එස්. පතිරණ වන මම මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 245(අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය 2024 වර්ෂයට පහත පරිදි පාවිච්චි කරනු ලබන සතුන් හා වාහන වෙනුවෙන් ගාස්තු නියම විය යුතු බවට 2023.12.28 දිනැතිව තීරණ අංක KMC/RPPDF/D/2023/16 යටතේ තීරණය කළ බවට මෙයින් නිවේදනය කරමි.

මහා නගර සභා ආඥාපනතේ 245(අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයට තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන සතුන් හා වාහන වෙනුවෙන් එහි සඳහන් මහ නගර සභා ආඥාපනතේ උපලේඛනයේ සඳහන් බදු අනුප්‍රමාණ යටතේ විය යුතු බවට එකී මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා
බලතල කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා

සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකල් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා

(අ)	එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	-	10.00
(ආ)	එය වෙළෙඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම්	-	05.00
සෑම කරත්තයක් ම සඳහා		-	20.00
සෑම අත්කරත්තයක් ම සඳහා		-	10.00
සෑම රික්ෂෝවක්ම සඳහා		-	07.50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා		-	15.00
සෑම අලියකු ම සඳහා		-	50.00

රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, විල් බැරැක්ක, හුදෙක් පෞද්ගලික ස්ථානයක් තුළ පමණක් වෙළෙඳ කටයුතු සඳහා ගාමිත කැරෙන අත් කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිතා කෙරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛණයේ වෙළඳ කටයුතු යන යෙදුමට, යම් වෙළඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ ව විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයක් සඳහා වුවද යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ ගෙන යෑම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-782/5

කළුතර මහා නගර සභාව

2024 වර්ෂයට ඇතැම් ඉඩම් විකිණීම විෂයෙන් බදු නියම කර අය කිරීම

කළුතර මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය හා කර්තව්‍ය ඉටු කරන කළුතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් එල්. පී. මනෝජා එස් පතිරණ වන මම මහා නගර සභා ආඥාපනතේ 286 අ වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 247 (ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට පහත පරිදි ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම විය යුතු බවට 2023.12.28 දිනැති තීරණ අංක KMC/RPPDF/D/2023/17 යටතේ තීරණය කළ බවට මෙයින් නිවේදනය කරමි.

මහා නගර සභා ආඥාපනතේ 247 (ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු විසින් හෝ බ්‍රෝකර්වරයෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියට එකකට (1%) යටතේ බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර්වරයා හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් ඒ ඉඩම විකුණා ලත් මුදලින් ගෙවිය යුතු බව තීරණය කරමි.

එසේම මේ යටතේ ගෙවිය යුතු බද්ද ගෙවන ලෙස ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින දාහතරක් තුළදි ඒ බද්ද නොගෙවනු ලැබුවහොත්, ඒ පැහැර හැරීම ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතුය. අය විය යුතු මුදල් ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවා ගිය ද ඒ නොතකා අයවිය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අයකර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතුය.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා
බලතල කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

12 -782/6

කළුතර මහා නගර සභාව

දැන්වීම් ප්‍රචාරක ගාස්තු - 2024

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය 2015.12.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/4 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය තුළ එකී දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා අය කරනු ලබන ගාස්තුව 2024 වර්ෂයේ සිට නැවත සංශෝධන කරන තෙක් බල පැවැත්වෙන ගාස්තුවක් විය යුතු අතර එකී ගාස්තුව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ පහත උපලේඛන අනුව විය යුතු බවටද මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා බලතල කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*දැන්වීම් ප්‍රචරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදාකරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

කළුතර මහා නගර සභාව

ත්‍රිරෝද රථ නවතා තැබීම සම්බන්ධ ගාස්තු - 2024

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ විධිවිධාන අනුව කළුතර මහා නගර සභාව විසින් සාදන ලදුව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ කියවිය යුතු 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 154 වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් අනුමත කර 1511/20 හා 2007.08.24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඉහත කී 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 154 වගන්තිය වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2009 ජූලි මස 07 වැනි දින බස්නාහිර පළාත් සභාව අනුමත කර අංක 1652/50 හා 2010 මැයි මස 06 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති කළුතර මහා නගර සභා සීමාව තුළ ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 06.9 අනුව නැවත සංශෝධනය කරන තෙක් වාර්ෂික බලපත්‍රයක් සඳහා රු. 600ක බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සහ ඉන් ඉදිරියට ගාස්තු අයකළ යුතු බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා බලතල කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

12 -782/8

කළුතර මහා නගර සභාව

සේවා සඳහා ගාස්තු අය කිරීම - 2024

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් 22 වැනි දින බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කර අංක 1947 හා 2015.12.28 දිනැති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති 2016.12.16 දින අංක 1998 *ගැසට් පත්‍රයේ* පළකර කළුතර නගර සභාව විසින් වැළඳ ගන්නට යෙදුනු සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය ප්‍රකාරව 2022.10.18 වැනි දින පැවති මාසික සභාවේ තීරණ අංක 5:1:38 යටතේ අනුමත වූ සේවා ගාස්තු 2024.01.01 දින සිට කළුතර මහා නගර සභාව විසින් අය කිරීමටත්, මෙම ගාස්තු ඉදිරියේ දී කරනු ලබන සංශෝධනයන්ට යටත්ව අය කරනු ලබන බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා බලතල කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
01		
1.	ATD පෝරම නිකුත් කිරීම	200 0
2.	**ATD පෝරම ආපසු භාර ගැනීම**	
	නේවාසික	1,000 0
	නේවාසික නොවන	2,000 0
3.	**නොපවරා ගැනීමේ සහතිකය (එක් දේපලකට)**	
	නේවාසික	500 0
	නේවාසික නොවන	1,000 0
	පිටපත් කිරීමේ ගාස්තු	25 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
4.	**හිමිකම් සහතික (එක් දේපලකට)**	
	නේවාසික	1,000 0
	නේවාසික නොවන	2,000 0
	පිටපත් කිරීමේ ගාස්තු	25 0
5.	අතිරේක දැන්වීම් නිකුත් කිරීම (එක් වර්ෂයකට)	250 0
6.	**ඔප්පු උධෘත නිකුත් කිරීම (එක් දේපළකට)**	
	තැන්පත් :	
	නේවාසික	
	පළමු වර්ෂයට	1,000 0
	අතිරේක වර්ෂයට	500 0
	පිටපත් ගාස්තු	25 0
	නේවාසික නොවන :	
	පළමු වර්ෂයට	2,000 0
	අතිරේක වර්ෂයට	500 0
02		
7.	**ආදාහනාගාරය වෙන් කිරීම**	
	නගර සභා සීමාව තුළ	10,000 0
	නගර සභා සීමාවෙන් පිටත	25,000 0
8.	භූමදානය කිරීම	3,000 0
9.	දේහයක් තිබෙන තැන්පත් වලක තැන්පත් කිරීම	5,000 0
	තිබෙන තැන්පත් වලට අළු තැන්පත් කිරීම	5,000 0
10.	අළු කුටියක් ලබා ගැනීම සහා සීමාව තුළ	7,500 0
	අළු කුටියක් ලබා ගැනීම සහා සීමාවෙන් පිටත	15,000 0
11.	වාර්ෂික ත්‍රිවිල් බලපත්‍ර ගාස්තුව	600 0
12.	නගර ශාලා පරිශ්‍රය :	
	බස් රථ සඳහා මාසික කුලිය	2,000 0
	වෑන් රථ මාසික කුලිය	1,500 0
13.	**නගරයේ නවතා තබන ලද වාහන වලින් අය කරන ගාස්තුව**	
	පාපැදි	20 0
	කාර් රථ	30 0
	වෑන් රථ	60 0
	ලොරි/බස්	100 0
14.	**කළුතර දකුණ දුම්රියපල අසල ක්‍රීඩා පිටිය**	
	නගර සභා සීමාව තුළ පාසල් සඳහා	3,500 0
	නගර සභා සීමාවෙන් පිටත පාසල් සඳහා	5,000 0
	නගර සභා සීමාව තුල ක්‍රීඩා සමාජ	5,000 0
	නගර සභා සීමාවෙන් පිටත ක්‍රීඩා සමාජ	15,000 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	20,000 0
	සතියකට (එක් දිනකට) (දින 07 කට වඩා වැඩිනම්)	15,000 0
	මාසයකට (එක් දිනකට) (දින 30 කට වඩා වැඩිනම්)	10,000 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	15,000 0
	සතියකට (එක් දිනකට)	12,500 9
	මාසයකට (එක් දිනකට)	8,000 0
15.	**පකිස්ථාන් ක්‍රීඩා පිටිය**	
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	15,000 0
	වැඩිවන සෑම දිනකටම	10,000 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	10,000 0
	වැඩිවන සෑම දිනකටම	8,000 0
16.	**සමනල ක්‍රීඩා පිටිය**	
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	15,000 0
	සතියකට (එක් දිනකට)	10,000 0
	සතියකට වැඩි නම් දිනකට	7,500 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	10,000 0
	සතියකට (එක් දිනකට)	7,500 0
	සතියකට වැඩි නම් දිනකට	6,000 0
17.	**රේන්ජරස් ක්‍රීඩා පිටිය**	
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	25,000 0
	සතියකට (එක් දිනකට)	15,000 0
	සතියකට වැඩි නම් දිනකට	7,500 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	10,000 0
	සතියකට (එක් දිනකට)	7,500 0
	සතියකට වැඩි නම් දිනකට	6,000 0
18.	**කළුතර දකුණ නගර සභා නිවාස අසල ක්‍රීඩා පිටිය**	
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	25,000 0
	සතියකට (එක් දිනකට)	10,000 0
	සතියකට වැඩි නම් දිනකට	7,500 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	10,000 0
	සතියකට (එක් දිනකට)	7,500 0
	සතියකට වැඩි නම් දිනකට	6,000 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
19.	**කළුතර උතුර දුම්රියපළ අසල ක්‍රීඩා පිටිය**	
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	15,000 0
	සතියකට (එක් දිනකට)	10,000 0
	සතියකට වැඩි නම් දිනකට	7,500 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	10,000 0
	සතියකට (එක් දිනකට)	7,500 0
	සතියකට වැඩි නම් දිනකට	6,000 0
20.	**ජුබිලි ක්‍රීඩා පිටිය**	
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	25,000 0
	සතියකට (එක් දිනකට)	10,000 0
	සතියකට වැඩි නම් දිනකට	7,500 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	10,000 0
	සතියකට (එක් දිනකට)	7,500 0
	සතියකට වැඩි නම් දිනකට	6,000 0
21.	**කළුගංවිල ක්‍රීඩා පිටිය**	
	වාණිජ කාර්යයන් සඳහා :	
	එක් දිනකට	15,000 0
	සතියකට (එක් දිනකට)	10,000 0
	සතියකට වැඩි නම් දිනකට	7,500 0
	වාණිජ නොවන කාර්යයන් සඳහා :	
	එක් දිනකට	10,000 0
	සතියකට (එක් දිනකට)	7,500 0
	සතියකට වැඩි නම් දිනකට	6,000 0
22.	**සැහැල්ලු පන්දු හා පාපන්දු සඳහා කළුතර දකුණ මහජන ක්‍රීඩා පිටිය**	5,000 0
	දිනකට අය කරන ගාස්තුව :	
23.	පකිස්ථානු ක්‍රීඩා පිටිය සහ අනෙකුත් ක්‍රීඩා පිටිය සැහැල්ලු පන්දු ක්‍රීඩා තරග හා පාපන්දු සඳහා වෙන් කිරීමට දිනකට ගාස්තුව	2,000 0
	තැන්පතු :	
24.	**කළුතර දකුණ දුම්රියපල අසල ක්‍රීඩා පිටිය**	
	සංගීත ප්‍රසංග සඳහා දිනකට තැන්පතු ගාස්තුව	100,000 0
	සැණකෙලි සඳහා දිනකට තැන්පතු ගාස්තුව	50,000 0
	සැණකෙලි සඳහා දිනකට වැඩි නම් තැන්පත් ගාස්තුව	20,000 0
25.	**කළුතර දකුණ මහජන ක්‍රීඩා පිටිය හැර අනෙකුත් ක්‍රීඩා පිටි**	
	සැණකෙලි සඳහා දිනකට තැන්පතු ගාස්තුව	100,000 0
	සැණකෙලි සඳහා දිනකට වැඩිනම් තැන්පත් ගාස්තුව	50,000 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
26.	**කළුතර දකුණ මහජන ක්‍රීඩාපිටිය හැර අනෙකුත් ක්‍රීඩා පිටි**	
	වාණිජ කටයුතු සඳහා :	
	දිනකට තැන්පතු	50,000 0
	දිනකට වැඩි නම් වැඩිවන දින සඳහා තැන්පතු	50,000 0
	වාණිජ නොවන කටයුතු :	
	දිනකට තැන්පතු	20,000 0
	දිනකට වැඩිනම් වැඩිවන දින සඳහා තැන්පතු	15,000 0
27.	**නගර ශාලාව**	
	1. වේදිකා නාට්‍ය	20,000 0
	2. මංගල උත්සව	20,000 0
	3. සම්මන්ත්‍රණ	10,000 0
	4. රජයේ පාසල් උත්සව	10,000 0
	5. පෙර පාසල් උත්සව	10,000 0
	6. ආගමික කටයුතු	10,000 0
	7. රාජ්‍ය ආයතන උත්සව	15,000 0
	8. සංගීත වැඩසටහන්	20,000 0
	9. දේශපාලන කටයුතු/පුද	10,000 0
	10. ලාභ ඉපයීමේ වැඩසටහන්	20,000 0
	11. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්/කලා උත්සව	15,000 0
	12. ජාත්‍යන්තර පාසැල්	15,000 0
	13. ගෘහස්ථ ක්‍රීඩා තරග	10,000 0
	14. සංගීත සංදර්ශන වැනි වෙනත් ප්‍රසංග	25,000 0
	අංක 3, 4, 5, 6, 9, 13 වැඩසටහන් සඳහා පැය 04 ක කාලයක් සඳහා අදාළ ගාස්තුවෙන් 50% ක් මුදලක් අය කරනු ලැබේ.	
28.	සෞඛ්‍යාතක බලපත්‍රය ලබා දීමේ දී අයකළ යුතු ගාස්තු	2,000 0
29.	හජ්ජි උත්සවය වෙනුවෙන් එක් ගවයෙකු ඝාතනය කිරීම සඳහා අය කරන ගාස්තුව	500 0
30.	නගරයේ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා දිනකට ගාස්තුව සභාවට අයත් පරිශ්‍රය තුළ ඊට අමතරව නගරයේ වෙනත් ස්ථානවල	4,000 0
31.	පාපැදි සඳහා ලයිසන් බලපත්‍රයට වාර්ෂික ගාස්තුව	100 0
32.	නගරයේ පදික වේදිකාවෙන් දිනකට අය කරන ගාස්තුව (අවුරුදු සමයේ පමණක්)	500 0
33.	නගරයේ දමනු ලබන කොඩි කණු 1 ක් සඳහා දිනකට	250 0
03		
34.	**ගොඩනැගිලි අයඳුම්පත්**	
	නේවාසික	1,000 0
	වාණිජ	5,000 0
35.	බිම් සැලසුම් අයඳුම්පත්	5,000 0
36.	වීථිරේඛා සහතික	500 0
37.	අනතුරුදායක ගස් අයඳුම්පත්	1,000 0
38.	ගොනැගිලි අයඳුම්පත් සහතික පිටපත්	500 0
04.		
39.	නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම (ට්‍රැක්ටර් 1 ක් සඳහා)	4,000 0
40.	ගෘහස්ථ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම (ට්‍රැක්ටර් 1 ක් සඳහා)	5,000 0
41.	කර්මාන්ත හා මිශ්‍ර කසළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම (ට්‍රැක්ටර් 1ක් සඳහා)	6,000 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
05.		
42.	**ප්‍රමාද දඩ අය කිරීම (එක් පොතකට)**	
	දින 30 ක් දක්වා	30 0
	දින 31 සිට 90 දක්වා	40 0
	දින 91 සිට 180 දක්වා	80 0
	දින 180 ට වැඩි	100 0
43.	**සාමාජික අයදුම්පත් ගාස්තුව**	5 0
44.	**සාමාජිකයන් බඳවා ගැනීම (අවුරුදු 02කට)**	
	නගර සීමාව තුළ පදිංචිකරුවන්	200 0
	නගර සීමාවෙන් පිටත	400 0
	නගර සීමාව තුළ පදිංචි පාසල් සිසුන්	100 0
45.	**සාමාජිකත්වය අලුත් කිරීම (අවුරුදු 02 කට)**	
	නගර සීමාව තුළ පදිංචිකරුවන්	100 0
	නගර සීමාවෙන් පිටත	200 0
	නගර සීමාව තුළ පදිංචි පාසල් සිසුන්	50 0
46.	සාමාජිකයන් විසින් නැති කරන ලද පොත්වලට අය කිරීම	පොතේ මිල මෙන් දෙගුණයක් දෙපා. ගාස්තු 25% බැදුම් ගාස්තු 57.00
06.		
47.	කළුතර නගර සභා සීමාවෙන් පිටත එක් ගිනි ඇමතුමක් සඳහා (පෞද්ගලික නිවාස, රජයේ දේපළ හා සමාජ ආයතන හැර)	
	(i) වෙළඳ/සාමාන්‍ය (කඩ හෝටල් සහ කුඩා සාප්පු) පැමිණීම සඳහා	15,000 0
	(ii) වෙළඳ විශේෂ සහ කර්මාන්ත (විශාල ප්‍රමාණයේ කර්මාන්ත, සුපිරි වෙළඳසැල් හෝටල්) පැමිණීම සඳහා	25,000 0
48.	එම ගිනි නිවීම් සේවා කටයුතු සඳහා දෙවන පැයට හෝ ඉන් කොටසකට අය කරන මුදල	3,000 0
49.	එම ගිනි නිවීම් සේවා කටයුතු සඳහා තෙවන පැයට හෝ ඉන් කොටසකට අය කරන මුදල	2,000 0
50.	එම ගිනි නිවීම් සේවා කටයුතු සඳහා ජල බවුසරයට අය කරන මුදල	5,000 0
51.	එම ගිනි නිවීම් සේවා කටයුතු සඳහා අමතර පොම්පයක් භාවිතා කිරීමේ දී අය කරන මුදල	5,000 0
52.	එම ගිනි නිවීම් සේවා කටයුතු සඳහා වෙනත් ඕනෑම වාහනයක් යැවීමට අය කරන මුදල	8,000 0
	සංශෝධිත ගාස්තු මුදලින් 90% ක මුදලක් මෙම සභාවට ද පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත් ව ඉතිරි 10% ක මුදල නිලධාරීන් සඳහා දිරි දීමනාවක් ලෙස ද ලබා දීම	
53.	එම ගිනි නිවීම් සේවා කටයුත සඳහා භාවිතා කරනු ලබන, පෙන ද්‍රාවක ලීටරයක් සඳහා CO2 1KG සඳහා රසායනික කුඩු සඳහා කෘතිම ශ්වසන උපකරණයක් සඳහා (පැය තුනක් සඳහා)	වෙළඳපොළ මිල අනුව යාවත්කාලීන කළ යුතු වේ.
54.	එම ගිනි නිවීම් සේවා කටයුතු සඳහා සහභාගි වන කාර්යය මණ්ඩලයට ඉහත සටහනේ දැක්වෙන මුදලට අමතරව පළමු පැයෙන් පසු පැයක් සඳහා	
	ගිනි හටයෙකු සඳහා	500 0
	යාන්ත්‍රික ගිනිහට	600 0
	මූලික ගිනිහට	700 0
	අංශ භාර නිලධාරි	800 0
	ස්ථානභාර නිලධාරි (බිල්පතෙහි ඇතුළත් කිරීමට යටත්ව)	1,000 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
55.	අවට ප්‍රාදේශීය සභා සමඟ වාර්ෂික ගිනි ආවරණ ලබා දීමේ ගිවිසුමකට එළඹීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම	50,000 0
56.	විශාල කර්මාන්ත ශාලා සහ සංචාරක හෝටල් සඳහා වසරක ගිනි ආවරණ ලබා දීමේ ගිවිසුමකට එලඹීම සඳහා	
	වර්ග අඩි 10000 කට අඩු	50,000 0
	වර්ග අඩි 10000 කට වැඩි	100,000 0
57.	හදිසි අනතුරු සඳහා හැර අනෙකුත් ගිලන් රථ ඇමතුම් සඳහා කිලෝමීටර එකකට	150 0
58.	ජල ටැංකි වලින් ජලය ඉවතට පොම්ප කිරීම, ඒවාට ජලය පිරවීම, ළිං සහ පොළොවෙන් යට තට්ටුවල ජලය හිස් කිරීම හා ඉණිමක් භාවිතා කිරීම වැනි සුළු පරිමාණයේ බේරා ගැනීමේ වැඩ	
	අ) නගරය තුළ පළමු පැය තුනට	10,000 0
	වැඩිවන සෑම පැය තුනකට හෝ ඉන් කොටසක	ඉහත ගාස්තුවෙන් 50%(5,000.00)
	(ආ) නගරයෙන් පිටත පැමිණීම වර්ග කිලෝමීටර 25ක අර්ධ විෂ්කම්භයක් තුළ පැය තුනට	15,000 0
	වැඩි වන සෑම පැය තුනකට හෝ ඉන් කොටසකට	ඉහත ගාස්තුවෙන් 50% බැගින් (7,500.00)
	වැඩිවන සෑම කිලෝ මීටරයකටම	150 0
59.	සිනමාහල් වල, කානිවල් වල, සර්කස් වල, හෝ එවැනි ස්වභාවයේ වෙනත් ව්‍යවසායක ගිනි ආරක්ෂක සේවාවන් හෝ පොරොත්තු රාජකාරී සඳහා	
	(අ) පැය 8 කට නොවැඩි කාලයක් සඳහා එක් එක් ගිනි භටයෙකු සඳහා (අංක 08 අදාළ කරගත හැක.)	4,000 0
	(ආ) වැඩිවන සෑම පැය 8කට හෝ ඉන් කොටසකට	ඉහත ගාස්තුවෙන් 50% බැගින් (2,000.00)
60.	ගිනි සහ හදිසි ඇමතීම්වලට හැර වෙනත් කාර්යය සඳහා ස්නෝකල් ගිනි නිවීමේ උපකරණ භාවිතා කිරීම	
	(අ) නගරය ඇතුළත කාර්යය මණ්ඩලය සමග පැමිණීම සඳහා පළමු පැය තුනට	15,000 0
	වැඩිවන සෑම පැය 3කටම හෝ ඉන් කොටසකට	මුල් ගාස්තුවෙන් 50% (7,500.00)
	(ආ) නගරයෙන් පිටත පැමිණීම	25,000 0
	කිලෝමීටර 25 කින් යුත් අර්ධ විෂ්කම්භයක් තුළ පැය තුනකට	මුල් ගාස්තුවෙන් 50% (12,500.00)
	වැඩිවන සෑම කිලෝ මීටරයක් සඳහා	150 0
61.	ගිනි නිවන හෝස් පයිප්පය සහ ජලය ඇඳගන්නා පයිප්ප පරීක්ෂා කර බැලීම සඳහා	2,000 0
62.	(අ) ගිනි නිවීමේ කාර්යයන්හි අවම 25 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකින් සමන්විත කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම සඳහා (පන්ති කාමරය තුළ ප්‍රථමාධාර ගිනි නිවීම් සම්බන්ධ න්‍යායාත්මක කරුණු හා ප්‍රායෝගික පුහුණුව දින 01, පැය 05)	25,000 0
	(ආ) දින දෙකක ගිනි නිවීම් මූලධර්ම සහිතව ප්‍රායෝගික පුහුණුව	30,000 0
	(ඇ) දින 03 ක ගිනි නිවීම් මූලධර්ම සහිතව ප්‍රායෝගික පුහුණුව (මුදා ගැනීම්, හදිසි පිටවීම්, ක්‍රමවේදය)	35,000 0
	(ඈ) දින 04 ක ගිනි නිවීම් මූලධර්ම සහිතව ප්‍රායෝගික පුහුණුව (මුදා ගැනීම්, හදිසි පිටවීම්, ගිනි සරඹ)	40,000 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
	(ඉ) දින 05ක ගිනි නිවීම් මූලධර්ම සහිතව ප්‍රායෝගික පුහුණුව (මුදා ගැනීම්, ගිනි නිවීමේ උපකරණ හැසිරවීම ගිනි සරඹ, කෘතිම ශ්වසන උපකරණ, කඹ ආධාරක මුදා ගැනීම්)	50,000 0
	(ඊ) ගොඩනැගිලි හැරයාමේ හදිසි පිටවීමේ පෙරහුරු සරඹයන් සහ අදාළ මූලධර්ම ප්‍රමිතීන්ට අනුව පුහුණුව සඳහා (Evacuation Grill)	25.000 0
63.	යම් ආයතනයක් විසින් උපදේශන සේවාවක් ඉල්ලූ විට පැය 1 ක් සඳහා සභාවට ගෙවිය යුතු මුදල නිලධාරීන් සඳහා	5,000 0
64.	පරීක්ෂණ ගාස්තු	1,000 0
65.	ගොඩනැගිලි ඉදිකිරීම/ගොඩනැගිල්ලට අළුතින් කොටසක් එකතු කිරීම (Building Plan Requirements) (සංශෝධිත ගාස්තු මුදලින් 80% ක මුදලක් මෙම සභාවට ද, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව ඉතිරි 20%ක මුදල නිලධාරීන් සඳහා දිරි දීමනාවක් ලෙසද ලබා දීම.	
	01 - 300	10,000
	301 - 500	20,000
	501 - 700	30,000
	701 - 900	40,000
	901 - 1100	50,000
	1100 ඉක්මවීමෙන් පසු $1m^2$ සඳහා	50
66.	වෙළඳ බලපත්‍ර සඳහා ගිනි ආවරණ සහතික නිකුත් කිරීම Fire Clearance Certificate) (සංශෝධිත ගාස්තු මුදලින් 80% ක මුදලක් මෙම සභාවටද, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව ඉතිරි 20% ක මුදල නිලධාරීන් සඳහා දිරි දීමනාවක් ලෙස ද ලබා දීම.	
	$1 – 500\ m^2$	2,500 0
	$501 - 1000\ m^2$	3,500 0
	$1001 - 1500\ m^2$	4,500 0
	$1,501 - 2,000\ m^2$	6,000 0
	$2000\ m^2$ වැඩි	2000 ට වැඩිවන සෑම 1 m2 ක් සඳහා රු. 2ක් අය කළ යුතුය.
67.	ගිනි සටහන් නිරීක්ෂණ වාර්තා (Fire report) පැමිණීම 25km අර්ධ විෂ්කම්භයක් තුළ හා වැඩිවන සෑම 1km සඳහාම රු. 100 බැගින් අය කිරීමට යෝජනා කරමි. (සංශෝධිත ගාස්තු මුදලින් 80% ක මුදලක් මෙම සභාවට ද, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව ඉතිරි 20%ක මුදල නිලධාරීන් සඳහා දිරි දීමනාවක් ලෙස ද ලබා දීම	
	නගරය තුළ	3,000 0
	නගරයෙන් පිටත	6,000 0

	සේවාව	*අය කරනු ලබන මුදල රු.*
68.	වාණිජ ආයතනවලින් කසළ ඉවත් කිරීම වෙනුවෙන් ට්‍රැක්ටර් ලෝඩ් එකක් ප්‍රමාණය (50kg - පොලිසැක් මළු 20)	4,000 0
	රජයේ වාහනවල කසළ ඉවත් කිරීම ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා	3,000 0
	ට්‍රැක්ටර් ලෝඩ් 1/2 ක් සඳහා (50 kg පොලිසැක් මළු 10)	2,000 0
	ට්‍රැක්ටර් ලෝඩ් 1/4 ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් සඳහා	1,000 0
	සැලුන් වලින් වාර්ෂිකව කසළ බැහැර කිරීමේ ගාස්තුව	2,000 0
	සියලුම ආයතන මගින් කසළ ලබාදීමේ දී දිරන හා නොදිරන කසළ ලෙස වෙන්කර ලබා දිය යුතු අතර, සායනික අපද්‍රව්‍ය කිසිසේත් ලබා නොදිය යුතුය.	

12-782/9

කළුතර මහා නගර සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීම

කළුතර මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය හා කර්තව්‍ය ඉටු කරන කළුතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් එල්. පී. මනෝජා එස් පතිරණ වන මම, 252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 247 (ඈ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කළුතර මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්

මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 247 ඈ වගන්තියේ විධිවිධාන යටතේ, කළුතර මහා නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා සුදුසු වන විටක හෝ සභාවේ මතය අනුව, යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක,

(අ) ඒ ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය යෝජනා සම්මුතියක් මගින් සභාව විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා අඩු නම්; හෝ

(ඇ) *ස්ථාවර නැනහොන්* නිතිපතා කෙරෙන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම් සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත ඒ ඉඩමේ භූමියෙන් (0.25%) වාර්ෂික බද්දක් 2024 වර්ෂය සඳහා නියම කිරීමට 2023 දෙසැම්බර් මස 28 දිනැති තීරණ අංක KMC/RPPDF/D/2023/18 යටතේ තීරණය කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

එසේම මෙම බද්ද ප්‍රථම වරට ක්‍රියාත්මක කරන බැවින් හා සියලු හිස් ඉඩම් සඳහා ප්‍රාග්ධන අගය තක්සේරු කරවා ගැනීම ප්‍රායෝගිකව අපහසු බැවින් ද, මෙම බද්ද දේපළ අයිතිය හුවමාරු වීමේ දී, හිස් ඉඩම් සඳහා වරිපනම අංක ලබා ගැනීමේ දී, ඉඩම් අනුබෙදුම් කිරීම සඳහා අනුමත කරවා ගැනීමේ දී, නව වරිපනම් අංක ලබා දීමේ දී හා සංවර්ධන කාර්යයන් කිරීමට අවසර ඉල්ලා සිටීමේ දී යන අවස්ථාවලදී එක් වරක් පමණක් අය කිරීමට ද වැඩි දුරටත් තීරණය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස් හා කළුතර මහා නගර සභාවේ
බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර මහා නගර සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින,
කළුතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

12-782/10

වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව

සත්ව වද හිංසා ආඥාපනත (පරිච්ඡේදය 272)

7 (2) වැනි කොටස යටතේ දැන්වීම් - 2024

තීරණ අංක - 02/2023.12.08

වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රාදේශීය සභාවෙන් මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර දුන් බදුකරුවන් කොන්ත්‍රාත්කරුවන් සත්ව වද හිංසා පනතේ (පරිච්ඡේදය 272) 17 (1) කොටස යටතේ මා හට දී ඇති බලතල අනුව පහත සඳහන්ව ඇති උපලේඛන අනුව දක්වා ඇති දිනවල රජයේ සම්මත වූ දිනවලත් මා විසින් වරින්වර දැනුවත් කරනු ලබන දිනවලත් සතුන් විකිණීම ද, විකුණනු පිණිස එල්ලීම ද මස් කඩවල් විවෘත කර තබා ගැනීම මුලින්ම වැලැක්විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

තේර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

උපලේඛනය

1. ශ්‍රී ලංකා නිදහස් දිනය
2. මහා සිව රාත්‍රිය
3. වෙසක් පුර පසළොස්වක දිනය (රජයේ සම්මත වූ දිනවල්)
4. ලෝක සත්ව දිනය
5. මාසේ පුර පසළොස්වක දිනයන්

12 - 706/1

වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් ගාස්තු - 2024

තීරණ අංක - 02/2023.12.08

1987 වර්ෂයේ ප්‍රාදේශීය සභා පනත 126-7 ඌ කොටස යටතේ භාර කළ උපමා අනුව 2016.02.02 වැනි දින 1952/16 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා විනය, ඉඩම්, සමාජසේවා හා පුනරුත්ථාපන, කාන්තා කටයුතු, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන, සංචාරක, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර ඇමතිතුමා විසින් ප්‍රසිද්ධ කළ (91A - 101A) පිටුවල 2017.08.04 වැනි දින අංක 2031 *ගැසට් පත්‍රයේ* මා විසින් පිළිගත් ප්‍රචාරක දැන්වීම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සැලැස්ම අනුව වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ කවුරුන් හෝ වේවා යම්කිසි පාරක් හෝ පාරට දිග් ගැසුනු ප්‍රචාරක පුවරු නැතහොත් තාවකාලික සංවිධානාත්මක නැතහොත් විවිධ අලංකාරවල් ස්ථාපිත හෝ ස්ථාපිත කිරීමට සැලසුම් කිරීමට වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා මෙවැනි ස්ථිර ස්ථාපිත ප්‍රචාරවලට අවුරුදු පතා නියමිත ගාස්තු ගෙවා අලුත් කිරීම කරන ලෙස දැනුවත් කරමි.

		රු. ශත
01.	බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනයට තබන ස්ථිර ප්‍රචාරක දැන්වීම්වලට සෑම වර්ග අඩියකට එක් වර්ෂයකට හෝ එක් කොටසකට (නාම පුවරුවේ දෙපස දැන්වීම් ප්‍රදර්ශනයට තබා ඇත්නම් දෙපසට ගාස්තු අය කළ යුතු ය.)	200 0

		රු. ශත
02.	"බැනරයක්" ප්‍රදර්ශනයට තබාගන්නා තාවකාලික දැන්වීම් සෑම වර්ග අඩියකට හෝ එයින් කොටසකට	250 0
03.	ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් සෑම වර්ග අඩියකටම අවුරුද්දකටම (දැන්වීම් පුවරුවේ දෙපසම ප්‍රදර්ශනය කරන්නේ නම්)	200 0
04.	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආලෝක කරන ලද දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් සෑම වර්ග අඩියකටම අවුරුද්දකට (දැන්වීම් පුවරුවේ දෙපසම ප්‍රදර්ශනය කරන්නේ නම්)	300 0
05.	එක් ලෑල්ලක හෝ එක් උපකාරයක් සමග ප්‍රදර්ශනයට තබන විදුලි බුබුළු එලියක් සමග ඇති දැන්වීම්වලට සෑම වර්ග අඩියකට ම එක් වර්ෂයකට හෝ එයින් කොටසකට	100 0
06.	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම දිනකට	500 0
07.	වාහනයක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා දිනකට	500 0

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ දී ය.

12 - 706/2

වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි අනුමැතිය - 2024

තීරණ අංක - ජේ.02/2023.12.08

ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව තුළ 1987 වර්ෂයේ අංක 15 පරිපාලන සභා පනතේ කොටස් 47 සිට 59 දක්වා එක්ව නිවාස සංවර්ධන ආඥාපනත (පරිච්ඡේදය 600) පැවතුම් 1998.01.01 දින සිට 1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ සභාවේ බල ප්‍රදේශය තුළ ගෙවල් සෑදීම හෝ වෙනත් ආයතන ඉදිකිරීමට ගොඩනැගිලි ඉදි කිරීම ඉල්ලුම්පත් ඉදිරිපත් කරන විට එම පරීක්ෂණ වෙනුවෙන් අනෙකුත් දේවල් සම්බන්ධවත් පහත දක්වා ඇති උපලේඛන අනුව 2024.01.01 සිට ගාස්තු අය කිරීම මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

උපලේඛනය

අංකය	*විස්තර*	*2024 වර්ෂය සඳහා අයකිරීම් රු. ශත*
01.	පදිංචි ස්ථානයට තාප්පයක් බැඳීමට (දිග් අඩි 0 සිට අඩි 100 කට අඩු)	1,500 0
02.	පදිංචි ස්ථානයට තාප්පයක් බැඳීමට (දිග් අඩි 101 සිට අඩි 200-0 කට අඩු)	2,250 0
03.	පදිංචි ස්ථානයට තාප්පයක් බැඳීමට (දිග් අඩි 201 හා ඊට වැඩි)	3,000 0
04.	වාණිජමය ගොඩනැගිල්ලට තාප්පය බැඳීමට (දිග් අඩි 0 සිට අඩි 100 කට අඩු)	3,000 0
05.	වාණිජමය ගොඩනැගිල්ලට තාප්පය බැඳීමට (දිග් අඩි 101 සිට අඩි 200 කට අඩු)	3,750 0
06.	වාණිජමය ගොඩනැගිල්ලට තාප්පය බැඳීමට (දිග් අඩි 201 හා ඊට වැඩි)	4,500 0
07.	වර්ග අඩි 500 ට වැඩි නොවන බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට	500 0
08.	වර්ග උසින් අඩි 500 ට නොවැඩි බිම් ප්‍රමාණයක ව්‍යාපාරික ගොඩනැගිලි	700 0
09.	වර්ග අඩි 500 ට වැඩි වර්ග අඩි 1,500 ට අඩු බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට	700 0
10.	වර්ග අඩි 500 ට වැඩි හා වර්ග අඩි 1500 ඇතුලත	1,000 0
11.	වර්ග අඩි 1,500 ට වැඩි වර්ග අඩි 2,500 ඇතුලත් බිම් ප්‍රමාණයේ ගොඩනැගිලිවලට	1,000 0
12.	වර්ග අඩි 1,500 ට වැඩි හා වර්ග අඩි 2,500 ක බිම් ප්‍රමාණයක් අඩංගු ව්‍යාපාරික ගොඩනැගිලි වලට	2,000 0
13.	වර්ග අඩි 2,500 ට වැඩි බිම් ප්‍රමාණයේ ගොඩනැගිලිවලට හැම වර්ග අඩි 1000 අනික් කොටස්වලට	500 0
14.	වර්ග අඩි 2,500 ට වැඩි බිම් ප්‍රමාණයේ ගොඩනැගිලි වලට හැම වර්ග අඩි 1000 ට වැඩි එහි එක් එක් වර්ග අඩි 1000 ටම කෙටස්වලට	750 0
15.	ගොඩනැගිල්ලේ වෙනසක් කරන්න තියෙන නමුත් බිම් ප්‍රමාණයේ වැඩි නොවන ගොඩනැගිලි වලට	300 0
16.	ගොඩනැගිලි ඉල්ලීම් අනුමත කර නමුත් නිසි කාලසීමාවේ අවසන් නොකර නැවත අළුත්වැඩියා ගාස්තු	500 0
17.	ගොඩනැගිල්ලේ වෙනසක් සිදු කිරීමට ඇති නමුත් බිම් ප්‍රදේශයේ වැඩි වීමක් නොවන ව්‍යාපාරික ගොඩනැගිලිවලට	200 0
18.	ගොඩනැගිල්ල අවසන් වූ පසු පදිංචි සහතිකයක් සඳහා ඉල්ලුම් ගාස්තු	500 0
19.	ව්‍යාපාරික ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රය අනුමත කොට නියමිත කාල වකවානුව තුළ සම්පූර්ණ නොකිරීමෙන් යළි අලුත් කිරීමේ ගාස්තුව වර්ෂයකට	500 0

12-706/3

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

බල්ලන් ලියාපදිංචි කිරීමේ පනත (පරිච්ඡේදයේ 477) - 2024

තීරණ අංක - ජේ 02/2023.12.08

වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ පාලන ප්‍රදේශයේ ඇති කරනු ලබන බල්ලන්ට, බල්ලන් ලියාපදිංචි පනතේ (පරිච්ඡේදයේ 477) 4 වැනි කොටස් අනුව 2024 වර්ෂයට ලියාපදිංචි ගාස්තු එක් සතෙකුට රු. 50 බැගින් ගාස්තු අයකර ගත යුතු බව මෙයින් දන්වා සිටිමි.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

12 - 706/4

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

ජාතික පරිසර පනත යටතේ දැන්වීම් -2024

තීරණ අංක - ජේ 02/2023.12.08

1980 වර්ෂයේ 47 වැනි අංක දරන ජාතික පරිසර පනත 1988 වර්ෂයේ අංක 56 සංශෝධන පනත සැලැස්ම අනුව මධ්‍යම පරිසර අධිකාරි පනතේ 26 වැනි කොටසට අයත් 2001 වර්ෂයේ සැප්තැම්බර් මස 01 වැනි දින පටන් පහත දැක්වෙන උපලේඛනය පරිදි පෙන්වා සිටින කර්මාන්තය වෙත මධ්‍යම පරිසර අධිකාරිය මගින් දක්වා ඇති අන්දමට ලැයිස්තු ද, ගාස්තු ද, පරීක්ෂා ගාස්තු බලපත්‍ර ගාස්තු ද ආදිය අනුමත කරනු ලබන බව මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි. මෙම ප්‍රකාශ මගින් අයකරන ලද ගාස්තු 1987 වර්ෂයේ 15 වැනි අංක ප්‍රාදේශීය සභා පනත යටතේ අනුමත කර අය කරන බලපත්‍ර ගාස්තුවට වඩා ඉහළිනුත් ඒවා කොයි ආකාරයෙනුත් බදු නොවන ආකාරය ද වේ.

උපලේඛනය

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වානිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර/මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එබ්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තලේ නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලී සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයක් කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සිහින කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුනු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්"
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
    * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්

25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීමේ කටයුතු
30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදමු කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත

පරිසර අනුමැති බලපත්‍ර ලබා ගැනීමේ දී ගෙවිය යුතු ගාස්තු විස්තර - 2024

	ආයෝජනය කරන මුදල	*2024 වර්ෂය සඳහා බදු මුදල* *රු. ශත*
1.	රුපියල් 250,000.0 ට අඩු	3,000 0
2.	රුපියල් 250,000.0 - 500,000	3,750 0
3.	රුපියල් 500,000.0 - 1,000,000	5,000 0
4.	රුපියල් 1,000,000.0 ට වැඩි	10,000 0
5.	රුපියල් මිලියන 20 ට වැඩි	15,000 0

මීට අමතරව බලපත්‍ර ගාස්තුව රුපියල් 4,500.0 ක් ගෙවිය යුතුය.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

12 - 706/5

වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

ගාස්තු අය කිරීම - 2024

ජේ තීරණ අංක - ජේ 02/2023.12.08

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147, 148, 149, 150 (1), (2), 151, 152 (1), (2), 153 (1), 154 (2) වැනි කොටස්වලට ඇතුළත් 2024 වර්ෂයේ ජනවාරි මාසයේ 01 වැනි දින සිට 2024 දෙසැම්බර් මස 31 වැනි දින පහත දක්වා ඇති උපලේඛන අනුව ව්‍යාපාර වෙනුවෙන් ව්‍යාපාර බදු ගාස්තු අය කිරීම අංක 2 වූ 203.12.08 දිනයේ තීරණයක් සම්මත වී ඇත. වෙළඳ බලපත්‍ර ගාස්තු උපලේඛනය අනුව 2024.03.31 වැනි දිනට කලින් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

උපලේඛනය

අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*2024 වර්ෂය සඳහා ආයකිරීම් රු. ශත*
01.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	1,000 0
02.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	1,000 0
03.	තේ කඩයක් පවත්වාගෙන යාම	1,000 0
04.	කොණ්ඩා සැකසීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
05.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	1,000 0
06.	රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
07.	හෝටලයක් සඳහා	1,000 0
08.	අවන්හලක් සඳහා	1,000 0
09.	බේකරියක් පවත්වාගෙන යාම	1,000 0
10.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	1,000 0
11.	පිහිනුම් තටාකයක් සඳහා	1,000 0
12.	අයිස් කැට වෙළෙඳසැලක් සඳහා	1,000 0
13.	සිසිල් බීම වර්ග අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
14.	හරක් මස් කඩයක් පවත්වාගෙන යාම	1,000 0
15.	මාළු කඩයක් පවත්වාගෙන යාම	1,000 0
16.	කුකුල් මස් කඩයකට	1,000 0
17.	අයිස්ක්‍රීම් කඩයක් පවත්වාගෙන යාම	1,000 0
18.	වෑල්ඩින් වැඩපලපක් පවත්වාගෙන යාම	1,000 0
19.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	1,000 0
20.	වී මෝල්ක් පවත්වාගෙන යාම	1,000 0
21.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
22.	ලී මඩුවක් පවත්වාගෙන යාම	1,000 0
23.	කළුගල් වැඩපලක් පවත්වාගෙන යාම	1,000 0
24.	ලේත් වැඩ සඳහා	1,000 0
25.	කළුගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	1,000 0
26.	කළුගලින් නිපදවන භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම	1,000 0
27.	ගඩොල් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
28.	වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
29.	රා තැබෑරුම් සඳහා	1,000 0
30.	හරක් ගොවිපලක් සඳහා	1,000 0
31.	සුරතල් සතුන් අලෙවිකරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
32.	පොල් ගස් ආශ්‍රිත නිෂ්පාදන	1,000 0
33.	මධ්‍යසාර අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
34.	හුනු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
35.	ආහාර ඇසුරුම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
36.	වෙනත්	1,000 0

වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

කසළ ඉවත් කිරීමේ නීති (126 වැනි වගන්තිය) යටතේ දැනුම් දීමයි - 2024

තීරණ අංක - ජේ 02/2023.12.08

1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා නීති 126 වැනි කොටස යටතේ ඉදිරිපත් කළ අංක 1024, 1988.04.17 වැනි දින පිළිගත් අංක 520/7 වැනි අංක 1988.08.23 වැනි දින 9 වන කොටස කසළ ඉවත් කිරීම් සේවාව ප්‍රාදේශීය සභාව මාර්ගයෙන් කිරීමට අදහස් කර ඇත. එබැවින් ඉඩම් හිමියා විසින් රුපියල් 100.00 මුදලක් සෑම මසකම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වේ.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

12 - 706/7

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනත යටතේ වාහන සඳහා බදු අය කිරීම - 2024

තීරණ අංක - ජේ 02/2023.12.08

1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ 148(4) වැනි වගන්තියට අනුව වාහන සඳහා බදු 2024.01.01 සිට 2024.12.31 වැනි දින දක්වා වාහන නැවතුම්පළ ගාස්තුව පහත සඳහන් පරිදි අය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

වර්ගය	*2024 වර්ෂයට අය කිරීම* *රු. ශත*
01. පා පැදි	100 0

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

12 - 706/8

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ නිශ්චල දේපළ සඳහා වන ගාස්තු - 2024

තීරණ අංක - ජේ 02/2023.12.08

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 18(ඇ) 11 වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතලවලට අනුව වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ ඇති චංචල නිශ්චල දේපල හා ඒවායේ වගකීම් පැවරුම සම්බන්ධයෙන් අප සභාවට හිමි මූලද්‍රව්‍ය හාරා රැගෙන යන අයගෙන් විශේෂ සංවර්ධන ගාස්තුවක් පහත සඳහන් පරිදි අයකිරීමට 2023.12.08 වැනි දිනැති අංක 02 දරන තීරණය මගින් සම්මත කොට ක්‍රියාත්මක කරන බව මෙයින් ප්‍රසිද්ධ කර දන්වා සිටිනු ලැබේ.

අංකය	ස්වභාවය	අය කිරීම් රු. ශත
01.	ගල් කියුබ් එකක් පටවාගෙන යාමට	200 0
02.	ග්‍රැවල් පස් කියුබ් එකක් පටවාගෙන යාමට	150 0

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

12 - 706/09

වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා දේපළ බදු අය කිරීම

තීරණ අංක - ජේ 02/2023.12.08

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) දරන වගන්තිය යටතේ සංවර්ධනය වූ ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කර ඇති වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි නෙළුකුලම්, කුමාන්කුලම්, සමයපුරම්, ගනේෂපුරම්, උක්කුලාන්කුලම්, තෝනිකල් යනාදී ගම් ප්‍රදේශ සියල්ලකම පිහිටා ඇති ඉඩම්වල හා ගොඩනැගිලිවල වාර්ෂික ඇස්තමේන්තුවෙන් 12% ක් දේපළ බදු ලෙස 2024.01.01 වැනි දින සිට මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යනාදී දිනවලින් අවසන් වන කාර්තු 04 දී ගෙවීම් කළ හැකි පරිදි 2024 වර්ෂය සඳහා දේපළ බදු නියම කර අය කරනු ලබන බව 2023.12.08 දින පැවති සභා රැස්වීමේ දී තීරණ අංක 02 මගින් යෝජනාකර සම්මත කිරීමෙන් පහත පරිදි අයකිරීම් සිදු කරන බව මෙයින් දන්වා සිටිමි.

තවද,

(අ) 1987 වර්ෂයේ අංක 15 දරන ඉහත සඳහන් පනතේ 161 වැනි පරිච්ඡේදය අනුව පහත සඳහන් පරිදි යම්කිසි ලිඛිත අණ කිරීමක් ලබා දීමේ වියදම වශයෙන් මුදලක් අය කරනු ලැබේ :-

(i) පදිංචිව සිටින ගෙවත්තටත් හිස් ඉඩම් වෙනුවෙන් පවතින හිඟ මුදල් සඳහා සියයට පහළවක් (15%),

(ii) පදිංචි ගෙවත්තේ හිස් ඉඩම් හැර වෙනත් දේපළවල නාමයෙන් ඇති හිඟ මුදල් සම්බන්ධයෙන් සියයට විස්සක් (20%) ද වේ.

(ආ) 2024 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර 2024 වර්ෂය සඳහා කාර්තු 04 සඳහා දේපළ බද්ද ගෙවන්නන් වෙනුවෙන් 10% ක වට්ටමක් දෙනු ලැබේ.

(ඇ) 2024 යම්කිසි කාර්තුවක නියමිත දේපළ බද්ද අදාළ කාර්තුවේ පළමු මාසයේ දී ගෙවන්නන් හට ඒ වෙනුවෙන් සියයට පහක (05%) වට්ටමක් දෙනු ලැබේ.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

12 - 706/10

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

විනෝද බදු දැන්වීම - 2024 වර්ෂය

තීරණ අංක - ජේ 02/2023.12.08

1946 වර්ෂයේ අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ විධිවිධාන අනුව අදාළ බදු පැනවීමේ බලය පළාත් පාලන ආයතනවලට ලබා දී ඇති බැවින් සෑම පළාත් පාලන ආයතනයක්ම සභාවේ තීරණය පරිදි තම බල ප්‍රදේශයේ පවත්වනු ලබන විනෝද වැඩ සටහන් සඳහා නැටුම්, ක්‍රීඩා ප්‍රදර්ශන, සංගීත සංදර්ශන (ආගමික, අධ්‍යාපන හැර) යනාදිය වෙනුවෙන් විකුණන ටිකට් පත්‍ර වල ආදායමෙන් 5%ක් ගාස්තුවක් අය කිරීමටත්, එම මුදල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි ද වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව තීරණය කර ඇත.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

12 - 706/11

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

වෙනත් අයකිරීම් ගාස්තු - 2024 වර්ෂය

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ 2023.12.08 වැනි දින තීරණ අංක 02 හි පරිදි පහත දැක්වෙන සියලුම ගාස්තු අනුමත වී ඇති බව මහජනතාවට මෙම නිවේදනය මගින් දැනුම් දෙමි.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

		රු. ශත
01.	දේපළ බදු නම වෙනස් කිරීම් අයදුම්පත්‍ර ගාස්තුව	500 0
02.	වරිපනම් නම වෙනස් කිරීම් සහ පරීක්ෂා කිරීම් ගාස්තුව	500 0
03.	දේපළ හිමි නොවන සහ වීදි රේඛා සහතිකය සඳහා පරීක්ෂණ ගාස්තු	500 0
04.	වීථිරේඛා සහ නොපරවා ගැනීමේ සහතිකය	500 0
05.	ගව ඝාතකාගාර අයදුම්පත් ගාස්තුව	200 0
06.	ගව ඝාතන ගාස්තු	1,000 0
07.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	500 0
08.	පරිසර බලපත්‍ර සඳහා අයදුම්පත්‍ර ගාස්තුව	500 0
09.	පරිසර බලපත්‍රය අලුත් කිරීමේ ගාස්තුව	500 0
10.	ජල සම්පාදනය සඳහා ප්‍රාදේශීය සභාවට අයත් පාරවල්වල කැණීම් කරන්නේ නම් එය පිළිසකර කර ගැනීමේ ගාස්තු (මීටරයකට)	
	I. කොන්ක්‍රීට් පාරට වර්ග මීටරයකට	4,150 0
	II. තාර පාරට	3,920 0
	III. පස් පාරට	1,920 0
	IV. කාපට් පාරට	4,060 0
11.	විදුලි සංදේශන කුළුණු ස්ථාපිත කිරීම	100,000 0
12.	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දර කියුබ් 01ක් ප්‍රවාහනය කිරීම සඳහා ගාස්තු	500 0
13.	වෙළඳපලෙහි දිනකට කඩ කුලිය	100 0
14.	ගවයින් ඇල්ලීම සඳහා :	
	I. ගවයා ඇල්ලීමට	750 0
	II. පැටවා ඇල්ලීමට	375 0
	III. ගවයා නඩත්තු ගාස්තු	300 0
	IV. පැටවා නඩත්තු ගාස්තු	150 0
	V. දඬුවම් ගාස්තු - ගවයා	1,000 0
	VI. දඬුවම් ගාස්තු - පැටවා	500 0
	VII. එළදෙනක් සඳහා රඳවා තබා ගැනීමේ ගාස්තුව	200 0
	VIII. එළදෙනෙක් සඳහා රඳවා තබා ගැනීමේ ගාස්තුව -පැටවා	100 0
15.	ඡායාපිටපත් සඳහා A4	30 0
16.	ඡායාපිටපත් සඳහා A3	50 0
17.	ගොඩනැගිලි අනුමැතියේ ඡායාපිටපත් සඳහා	100 0
18.	සහතික කිරීම් ගාස්තුව	200 0
19.	පදික වෙළෙඳාම :	
	ආහාර නොවන (දිනයක් සඳහා)	250 0
	ආහාර නොවන (දින 3ක් සඳහා)	500 0
	ආහාර සඳහා (දිනයක් සඳහා)	100 0
	ආහාර සඳහා (සතියක් සඳහා)	500 0
20.	සැලසුම් ශිල්පීන් අලුත් කිරීමේ ගාස්තුව	1,000 0
21.	උද්‍යාන ඇතුළත වීඩියෝ දර්ශන ලබා ගැනීම සඳහා	2,000 0
22.	උද්‍යාන ඇතුළත ඡායාරූප ලබා ගැනීම සඳහා	2,000 0
23.	පුස්තකාල පොත් භාර දීමේ දී ඇතිවන ප්‍රමාද ගාස්තු දිනකට	10 0
24.	මෘත දේහයක් සුසාන භූමියේ භූමිදානය කිරීමේ ගාස්තුව	500 0
25.	පී-4 සම්ප්‍රේෂණාගාර කුළුන ඉදිකිරීම සංවර්ධන ගාස්තුව	5,000 0

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

තීරණ අංක - ජේ 02/2023.12.08

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(අ) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව වවුනියාව දකුණු දෙමළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පිවිසෙන වාහනවලින් නවතා තැබීමේ බදු වශයෙන් පහත මිළ ගණන් අය කිරීමටත් එම බදු මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව වවුනියාව දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව තීරණය කර ඇත.

		රු. ශත
01	බස් රථයකට	100 0
02	ලොරියකට	50 0
03	වෑන් රථයකට	50 0
04	අත් ට්‍රැක්ටරයකට	25 0
05	ත්‍රීරෝද රථයකට	25 0
06	පාපැදියකට	10 0
07	වෙළඳ රථයකට	50 0

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙලුක්කුලම,
වවුනියාව.

12 - 706/13

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බලපත්‍ර ගාස්තු

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (2), 151, 152 (1) (2), 153 (1), 154 (1) වැනි කොටස්වලට ඇතුළත් පරිදි 2024 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට 2024 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ වර්ෂය සඳහා පහත දක්වා ඇති පරිදි ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීම 2023.12.08 වැනි දිනයේ තීරණ අංක 02 න් සම්මත වී ඇත. ව්‍යාපාර බලපත්‍ර ගාස්තු 2024.03.31 වැනි දිනයට කලින් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දී ඇත.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියාව දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

ව්‍යාපාර වෘත්තීන් සම්බන්ධ බදු මුදල් - 2024

I වන තීරුව	*II වන තීරුව*
	රු. ශත
රු. 6,000 නොඉක්මවන විට	අය කිරීමක් නැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

ව්‍යාපාර බදු දැන්වීම් උපලේඛනය - 2024

01. තැරැව්කරුවන් සඳහා
02. වෙන්දේසි විකුණුම්කරුවන් සඳහා
03. මුදල් පොළියට දීමේ ව්‍යාපාර සඳහා
04. උකස් භාණ්ඩ ව්‍යාපාර සඳහා
05. සේවා සපයන්නන් සඳහා
06. ප්‍රවාහන සේවා සපයන්නන් සඳහා
07. රියැදුරු පුහුණු කරන ස්ථාන සඳහා
08. මුදල් ආයෝජන තැන්පත් ස්ථාන සඳහා
09. අධ්‍යාපන ආයතන සඳහා
10. ආනයන අපනයන වෙළඳාම සඳහා
11. වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා
12. සැත්කම් වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා
13. ඖෂධසැල්
14. විශේෂ උත්සව අවස්ථාවලදී භාවිතා කරන කඩ සඳහා
15. උත්සව ශාලා සඳහා
16. සැලසුම් ශිල්පීන් සඳහා
17. ලොතරැයි ටිකට් පත් විකුණන ස්ථාන සඳහා
18. ඉන්ධන පිරවුම්හලක් සඳහා
19. පානීය ජලය විකුණන ස්ථාන සඳහා
20. සාප්පු සංකීර්ණ ස්ථානයක් සඳහා
21. රෙදිපිළි නිෂ්පාදන ශාලාවක් සඳහා
22. ඒජන්සි තැපැල් ස්ථානයක් සඳහා
23. ප්‍රදර්ශනාගාරයක් සඳහා
24. තනි පුද්ගලයෙකු විසින් නිපදවන අත්කම්
25. තනි පුද්ගලයෙකු විසින් නිපදවන අත්කම් විකිණීම
26. ගෑස් විකුණුම් ස්ථාන සඳහා
27. ගණකාධිකාරී ස්ථානයක් පවත්වාගෙන යාම
28. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් සඳහා
29. සමුපකාර වෙළෙඳසල් පවත්වාගෙන යාම
30. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම - A ශ්‍රේණියේ
31. සිල්ලර කඩයත් පවත්වාගෙන යාම - B ශ්‍රේණියේ
32. සිසිල් බීම වර්ග අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
33. ලෝහ භාණ්ඩ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
34. ගොඩනැගිලි භාණ්ඩ වෙළඳසැලක් පවත්වාගෙන යාම
35. සිමෙන්ති පැකට් 20ට වැඩි ප්‍රමාණයක අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
36. ලෑලි විකුණන කඩයක් පවත්වාගෙන යාම
37. දර මඩුවක් පවත්වාගෙන යාම
38. එළවළු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39. පොල් 1000කට වඩා වැඩියෙන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
40. ස්වර්ණාභරණ නිෂ්පාදන සහ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා
41. කඩල විකුණන ස්ථානයක් සඳහා
42. යතුරු පැදි, පා පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. යතුරු පැදි, පා පැදි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම
44. රූපවාහිනී යන්ත්‍ර, පරිගණක හා විදුලි භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. කම්මලක් පවත්වාගෙන යාම
46. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
47. කොහු ලණු හෝ කොහු යොදා සිදු කරනු ලබන නිෂ්පාදන
48. රා එකතු කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. ලේත් වැඩපලක් සඳහා
50. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

51. කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. රූපවාහිණී යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
53. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. පාපැදි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
55. රෙදිපිළි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
56. කෘත්‍රිම පොහොර තබා ගැනීම
57. කෘෂි රසායනික බෙහෙත් අලෙවි කිරීම
58. පාවහන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
59. තීන්ත, වාර්නිෂ්, ඩිස්ටෙම්පර් අලෙවි කිරීම
60. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
61. ගීත කැසට්පටි ස්ථානයක් පවත්වාගෙන යාම
62. පුවත්, ලිපිද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
63. ඔරලෝසු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
64. කුකුළු කෑම අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
65. ධාන්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
66. සිමෙන්ති මල්ගල් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
67. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
68. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. ටයර්, ටියුබ් වොල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
69. මෝටර්රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. හුණු පැකට් කිරීම සහ අලෙවි කිරීමේ කම්හලක් පවත්වාගෙන යාම
71. ශබ්ද විකාශන කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
72. දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
73. අයිස්ක්‍රීම් අලෙවි කිරීම
74. කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75. අවමංගල භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවි කිරීම
76. ඇඳුම් බතික් කිරීම
77. දුම්කොළ නිෂ්පාදන
78. මංගල තැරව්කාර කඩයක් පවත්වාගෙන යාම
79. ගොඩනැගිලි වයරින් කර්මාන්තය
80. ඉලෙක්ට්‍රොනික් මෝටර් කොයිල් එතීම
81. නෙට් කැෆේ, අන්තර්ජාල, පරිගණක පංති පවත්වාගෙන යාම
82. සංයුක්ත තැටි අලෙවි කිරීමේ ස්ථානයක්
83. බුලත් කඩයක් පවත්වාගෙන යාම
84. කාය වර්ධන පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
85. විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86. දැන්වීම් පුවරු සකස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
87. ළිං, නල ළිං හැරීම සිදු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
88. බර මැනීමේ කඩයක් පවත්වාගෙන යාම
89. කේබල් ටීවී සේවා සිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
90. මල් ශාලාවක් සඳහා
91. ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් සඳහා
92. ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් සඳහා
93. උසස් රැකියා
94. සන්නිවේදන කුළුණු
95. ශබ්දාගාරයක් සඳහා
96. මික්ස්චර් ව්‍යාපාරයක් සඳහා
97. වෙනත්

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (4) වගන්තිය අනුව වාහන හා සම්බන්ධ කුළී බදු පිළිබඳ දැන්වීම - 2024

තීරණ අංක - ජේ 02/2023.12.08

වර්ෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (1) (2) (3) (4) (5) (6) (7) යන වගන්ති අනුව 2024.01.01 දින සිට 2024.12.31 දින තෙක් පහත සඳහන් පරිදි ගාස්තු අයකරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තෙර්ජනා සුගුමාර්,
ලේකම්,
වවුනියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් වීදිය,
නෙළුකුලම්,
වවුනියාව.

අනු. අංකය	*වාහන වර්ගය*	*විස්තර*	*මුදල රු. ශත*
01	මෝටර් ග්‍රේඩර්	පැය 1 ක් සඳහා (ඉහළ සහ පහළ ප්‍රවාහනය)	5,000.00
02	මාර්ග රෝලර්	පැය 1 ක් සඳහා (ඉහළ සහ පහළ ප්‍රවාහනය)	3,500.00
03	JCB	පැය 1 ක් සඳහා (ඉහළ සහ පහළ ප්‍රවාහනය)	4,000.00
04	ගලි බවුසරය	එක් බරක් සඳහා (01 සිට 10 km දක්වා)	5,000.00
06	ගලි බවුසරය	එක් වාරයක් සඳහා (කිලෝමීටර 10ට වැඩි)	5,000.00
		අමතර 01 km ප්‍රවාහනය සඳහා	100.00
07	ටිපර්	කි. මී. 01 ක් සඳහා	330.00
08	චතුර බවුසර් (ලොරිය)	එක් වාරයක් සඳහා (01 සිට 05 km දක්වා)	2,500.00
09	චතුර බවුසර් (ලොරිය)	එක් වාරයක් සඳහා (05 සිට 10 km දක්වා)	3,500.00
		(කිලෝමීටර් 10ට වැඩි)	3,500.00
		අමතර 01 km ප්‍රවාහනය සඳහා	100.00
10	ජල බවුසර් ට්‍රේලරය	ට්‍රැක්ටරය සමග එක් වරකට	2,000.00
11	ජල බවුසර් ට්‍රේලරය	එක දවසකට (ට්‍රැක්ටරය සමග)	6,500.00
12	ජල බවුසර් ට්‍රේලරය	එක දවසකට (ට්‍රැක්ටර සහ ජලය නොමැතිව)	2,000.00
13	අත් රෝලර්	එක දවසකට (ඉන්ධන නොමැතිව)	4,000.00
14	ඝන අපද්‍රව්‍ය සේවාව	ට්‍රැක්ටරයක් සඳහා (සාමාන්‍ය ට්‍රේලරය) (01 සිට 10 km දක්වා)	2,500.00
	ඝන අපද්‍රව්‍ය සේවාව	ට්‍රැක්ටරයක් සඳහා (සාමාන්‍ය ට්‍රේලරය) (කිලෝමීටර 10ට වැඩි)	2,500.00
		අමතර 01km ප්‍රවාහනය සඳහා	100.00
	ඝන අපද්‍රව්‍ය සේවාව	ට්‍රැක්ටරයක් සඳහා (විශාල ට්‍රේලරය) (01 සිට 10km දක්වා)	3,500.00
	ඝන අපද්‍රව්‍ය සේවාව	ට්‍රැක්ටරයක් සඳහා (විශාල ට්‍රේලරය) (කිලෝමීටර් 10ට වැඩි)	3,500.00
		අමතර 01km ප්‍රවාහනය සඳහා	100.00
15	Bobcat (කුඩා JCB)	පැය 1 ක් සඳහා (ඉන්ධන නොමැතිව)	3,000.00
16	තණකොළ කපනය	එක දවසකට (ඉන්ධන නොමැතිව)	3,000.00

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති හා එකී පනතේ 09 වන වගන්තියේ (03) උපවගන්තිය ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මම 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 දරන පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල හා ගෙපත්වල 2023 වර්ෂයට පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ 2008 වර්ෂයේ දී කරනු ලැබූ තක්සේරුවද 2024 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට ද,

(ආ) එකී තක්සේරුව මත 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් පහත පළමුවන හා දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකාරයට 6% සහ 12% වරිපනම් බද්දක් පනවා අය කිරීමට ද,

(ඇ) 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අනුව යථෝක්ත වරිපනම් බද්ද 2024 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන්වන පරිදි කාර්තු හතර තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස, බද්දට යටත්වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට ද

තීරණ සම්මත වූ බව නිවේදනය කරමි.

පළමුවන උපලේඛනය

බලප්‍රදේශය	*ප්‍රතිශතය*
නගර සභා මාවත - වම (9 - 85)	12%
නගර සභා මාවත - දකුණ (12 - 94)	12%
අබ්දුල් මජීඩ් මාවත - වම (විශේෂ) (9 - 59/2)	12%
අබ්දුල් මජීඩ් මාවත - දකුණ (280/4 - 470)	12%
රජඇළ පාර - වම (19 - 57)	12%
රජඇළ පාර - දකුණ (8 - 70)	12%
සිවන් කෝවිල් පාර - දකුණ (04 - 50)	12%
ජනතා මාවත - වම (05 - 77)	12%
ජනතා මාවත - දකුණ (04 - 78)	12%
ගැමුණු මාවත - වම (03 - 61)	12%
ගැමුණු මාවත - දකුණ (04 - 76)	12%
අග්‍රබෝධි මාවත - වම (311 - 615/1)	12%
වැව පාර - දකුණ (08 - 12)	12%
ත්‍රිකුණාමල පාර - වම	12%
ත්‍රිකුණාමල පාර දෙවන පටුමග - දකුණ	12%
ත්‍රිකුණාමල පාර - දකුණ	12%
පරාක්‍රම මාවත - වම	12%

දෙවන උපලේඛනය

බලප්‍රදේශය	*ප්‍රතිශතය*
නුවර පාර - වම	6%
නුවර පාර - දකුණ	6%
අබ්දුප් මජීඩ් මාවත - වම	6%
සේරුවිල පාර - වම	6%
සමගි මාවත - දකුණ	6%
සමගි මාවත - වම	6%
පේරාරු හරස් පාර - දකුණ	6%
ත්‍රිකුණාමල පාර - වම	6%
ත්‍රිකුණාමල පාර 2 වන පටුමග - වම	6%
ආරියවංශ මාවත - වම (විශේෂ)	6%
ආරියවංශ මාවත - දකුණ (විශේෂ)	6%
ආරියවංශ මාවත - වම	6%
ආරියවංශ මාවත - දකුණ	6%
ධීවරගම පාර - වම	6%
ධීවරගම පාර - දකුණ	6%
ජනතා මාවත - වම	6%
ජනතා මාවත - දකුණ	6%
සේනානායක මාවත - වම	6%
සේනානායක මාවත - දකුණ	6%
භාතියගම පාර - වම	6%
භාතියගම පාර - දකුණ	6%
දුම්රිය ස්ථානය පාර - වම	6%
අළුත් පාර - වම	6%
අළුත් පාර - දකුණ	6%
ත්‍රිකුණාමල පාර - දකුණ	6%

12 -773/1

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ පහත සඳහන් තීරණය සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 උපවගන්තියේ (1) වන වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කිරීම,

(අ) (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2024.04.30 වැනි දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද,

තීරණය සම්මත වූ බව නිවේදනය කරමි.

ඉහත කී උපලේඛනය

I වැනි තීරුව *2023 වර්ෂයේ දී ආදයම*	*II වැනි තීරුව* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

01.	පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
02.	ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
03.	ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
04.	දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
05.	ඉඩම් වෙන්දේසි කිරීමේ බලපත්‍රයක් ලබා ගැනීම
06.	ගඩොල් වෙන්දේසි කිරීමේ බලපත්‍රයක් ලබා ගැනීම
07.	ගඩොල් හෝ උළු ගබඩා කර තබාගැනීම හා විකිණීම
08.	දැව ගබඩාවක් පවත්වාගෙන යාම හෝ විකිණීම
09.	දර ගබඩාවක් පවත්වාගෙන යාම
10.	තොග වෙළෙඳාම (ස්ථානීය නියෝජිතයෙකු ලෙස වශයෙන්)
11.	අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් විකිණීම
12.	මෝටර් වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13.	වීදුරු තහඩු ගබඩා කිරීම හෝ විකිණීම
14.	වීදුරු උපකරණ හා ඉලෙක්ට්‍රොනික් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15.	පාවහන් හා බෑග් වර්ග වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
16.	මහන මැෂින් ගබඩා කිරීම හෝ විකිණීම
17.	පරිගණක යන්ත්‍රය හා ඒ ආශ්‍රිත උපකරණ විකිණීම
18.	ඇස් කණ්ණාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19.	ශබ්ද විකාශන යන්ත්‍ර විකිණීම හා කුලියට දීම
20.	විසිතුරු බඩු හා සාප්පු බඩු විකිණීමේ වෙළෙඳාම
21.	ලී බඩු වෙළෙඳාම
22.	රෙදි පිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24.	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
25.	ලියාපදිංචි කළ පෞද්ගලික තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
26.	ලිපිද්‍රව්‍ය පාසල් උපකරණ පුවත්පතක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27.	පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
28.	කොම්පියුටර් ප්‍රින්ටින්, ස්කැනින් ප්‍රින්ටින් සිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
29.	පෞද්ගලික උපකාරක පන්තියක් පවත්වාගෙන යාම

30.	එළවළු බීජ වර්ග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
31.	වර්ණ ඡායාරූප ගන්නා රසායනාගාරයක් පවත්වාගෙන යාම
32.	ඡායාරූප ගන්නා රසායනාගාරයක් පවත්වාගෙන යාම
33.	මැටි භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
34.	උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35.	බුලත්, පුවක්, දුම්කොළ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
36.	තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37.	තුරඟ තරග ඔට්ටු භාර ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38.	ජ්‍යෝතිෂ්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම
39.	රියැදුරන් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40.	සුරතල් මසුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41.	විකිණීම සඳහා මල් හෝ පැළ තවානක් පවත්වාගෙන යාම
42.	ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ ගබඩා කිරීම හෝ විකිණීම
43.	දුරකථන සේවා ෆැක්ස් සේවා, අන්තර්ජාල පහසුකම් හා ඡායා පිටපත් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44.	ආයුර්වේද දේශීය ඖෂධ නිෂ්පාදනය හෝ සංයෝජනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45.	කුමන හෝ වර්ගයක අලුත් වාහන විකිණීම
46.	කුමන හෝ වර්ගයක අලුත්වැඩියා කරන ලද පරණ වාහන විකිණීම
47.	කායවර්ධන පුහුණු පාඨමාලා ස්ථානයක් පැවැත්වීම
48.	රාජ්‍ය පිළිගත් ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
50.	පා පැදි අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
51.	ජංගම වෙළෙඳාම
52.	ඉදිකිරීම් කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
53.	උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
54.	ටයර් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
55.	වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සඳහා (ජංගම ප්‍රචාරක රථ මගින්)
56.	තීන්ත අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
57.	ජංගම දුරකථන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
58.	සංගීත භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59.	කොමිස් ඒජන්තවරුන්
60.	බ්‍රෝකර්වරුන්
61.	මුදල් ආයෝජකයන් හා මුදල් ණයට දෙන්නන්
62.	කොන්ත්‍රාත්කරුවන්
63.	උකස් බඩු ගන්නවුන්
64.	සැපයුම්කරුවන්
65.	රක්ෂණ නියෝජිතයන්
66.	ප්‍රවාහන නියෝජිතයන්
67.	කුලී රථ අයිතිකරුවන්
68.	මෝටර් රථ වාහන වෙළෙඳාම් කරන්නවුන්
69.	බැංකු රක්ෂණ සමාගම්

70.	සිල්ලර සහ තොග වෙළෙඳසැළක් පවත්වාගෙන යාම
71.	රජයේ අවසරලත් රටබීමහලක් පවත්වාගෙන යාම
72.	විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
73.	සුපිරි වෙළෙඳසලක් පවත්වාගෙන යාම
74.	වී මිලදී ගැනීම

12 -773/2

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ පහත සඳහන් තීරණය සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට,

තීරණය සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

අනු. අංකය	*වෙළඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට සිට රු. 1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* *රු. ශත*
අන්තරායදායක ව්‍යාපාර				
1.	කළුගල් තැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
2.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
5.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
6.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*වෙළඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට සිට රු. 1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* *රු. ශත*
7.	මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
8.	තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
12.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
15.	කිරිගල් හෝ හුණු ගල් කැණීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
19.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
20.	විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
21.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
22.	ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
23.	වැල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	බැටරි පිරවීම, නිපදවීම, අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
25.	පුපුරන ද්‍රව්‍ය, පුපුරන බෙහෙත් ගඩබා කිරීම	500 0	750 0	1,000 0
26.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම	500 0	750 0	1,000 0
පීඩාකාරී වෙළඳාම				
1.	මිනිරන් ශුද්ධ කිරීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
3.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	සම විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
5.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිතතර සඳහා) සතුන් ඇති කරන සථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝ 50ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
7.	රබර් නිෂ්පාදනය කිරීම හා රබර් රොටී (Sheet) නිෂ්පාදනය	500 0	750 0	1,000 0
8.	පහමු වෛද්‍ය ගිලන් හළක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*වෙළඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට සිට රු. 1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* *රු. ශත*
9.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, මාළු හෝ ජාඩි කිලෝ 100 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දුව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම් කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි නිපදවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32.	දුව ඉරීම	500 0	750 0	1,000 0
33.	පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
35.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*වෙළඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට සිට රු. 1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* *රු. ශත*
41	ලී භාණ්ඩ සඳහා පොටි නිපදවීම	500 0	750 0	1,000 0
42.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
43.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	සුවඳවිලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
48.	පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51.	ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටර් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58.	අම්ල නිෂ්පාදනය හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
59.	උළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
60.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
62.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
63.	කුකුළු වෙළඳසැළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
65.	ටයර්/ටයුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
66.	සපත්තු, බෑග්, සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
67.	සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0
පීඩාකාරී හා අන්තරාදයක වෙළඳාම				
1.	ලොකු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
2.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
3.	ඩ්‍රයික්ලීන් කිරීම	500 0	750 0	1,000 0
4.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*වෙළඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත*
5.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
6.	තෙල් හෝ සත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
7.	හුණුගල් හෝ හිරිගල් නිපදවීම	500 0	750 0	1,000 0
8.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම	500 0	750 0	1,000 0
9.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19.	කෘමිනාශක, දිලීර නාශක, පැළෑටි හෝ පළිබෝධ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0
22.	දැව ආරක්ෂණ තෙල් නිපදවීම	500 0	750 0	1,000 0
23.	ගල් තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
24.	වීදුරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
25.	කැඩපත් වීදුරු නිපදවීම	500 0	750 0	1,000 0
26.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0
27.	පාස්සන ඊයම් නිපදවීම	500 0	750 0	1,000 0
28.	ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
29.	කටු කම්බි නිපදවීම	500 0	750 0	1,000 0
30.	කම්බි ඇණ නිපදවීම	500 0	750 0	1,000 0
31.	කාබන් කඩදාසි හෝ යතුරුලියන පටි (රිබන්) නිපදවීම	500 0	750 0	1,000 0
32.	බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම	500 0	750 0	1,000 0
33.	ජී. අයි. බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
34.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම	500 0	750 0	1,000 0
35.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
36.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම	500 0	750 0	1,000 0
37.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*වෙළඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට සිට රු. 1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි* *රු. ශත*
38.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39.	රබර් මිශ්‍රිත කෙදි නිපදවීම	500 0	750 0	1,000 0
40.	සංචායන බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
41	ට්‍රැක්ටර් රථ එකලස් කිරීම	500 0	750 0	1,000 0
42.	රේඩියේටර් නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
44.	වියළි කෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
45.	වී මෝල්	500 0	750 0	1,000 0
46.	මිනී පෙට්ටි තැනීම	500 0	750 0	1,000 0
47.	දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
48.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියා හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
49.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
50.	අවමංගල්‍ය සේවා මධ්‍යස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අප්‍රසන්න වෙළඳාම				
1.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	i කුකුළු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	ii ඌරු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	iii ගව මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	කුකුළන් 100 කට වැඩි ගණනක් සඳහා, කුකුළු කොටුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ශීත කළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම හෝ එම භාණ්ඩ පමණක් විකිණීමට තබා ඇති ස්ථාන	500 0	750 0	1,000 0
වෙනත්				
1.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	*වෙළඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත*
8.	කිරි එකතු කිරීමේ හෝ අලෙවි කිරීමේ හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	කුළු බඩු පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
10.	සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම හෝ විකිණීම	500 0	750 0	1,000 0
11.	කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 -773/3

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ පහත සඳහන් තීරණය සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2024.04.30 වැනි දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද,

තීරණය සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *2023 වර්ෂයේ දී වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *රු. ශත.*
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 00
රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750 00
රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000 00

01. මැටි ආශ්‍රිත නිෂ්පාදන (ගඩොල් උළු හා මැටි භාණ්ඩ)
02. වාහන පින්තාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම (ස්ප්‍රේ පේන්ටින්)
03. මත්ස්‍යන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ඉස්සන්, විසිතුරු මසුන්)
04. වැලි ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
05. බොරළු පස් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
06. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
07. හුණුගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම හෝ විකිණීම
08. කම්මලක් පවත්වාගෙන යාම
09. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
10. කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

12 -773/4

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 සහ 148 වැනි වගන්ති ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ පහත සඳහන් තීරණය සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 සහ 148 වන වගන්ති ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යථොක්ත බද්ද 2024.04.30 වැනි දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ,

තීරණය සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත.
01.	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා-	
		(අ) වෙළෙඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0
	(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
	(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
	(v)	සෑම රික්ෂෝවක් සඳහා	07 0
	(vi)	සෑම අශ්වයෙකු , පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	(viii)	සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයෙහි වෙළෙඳ කාර්යයන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 -773/5

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

තීරණය

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සියලුම විනෝදාස්වාද ක්‍රියාකාරකම් මගින් ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අයකළ යුතු බවට වූ යෝජනාව කන්තලේ ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ තීරණය සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

12-773/6

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අතුරු ව්‍යවස්ථා බලාත්මක කිරීම

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියේ බලතල ප්‍රකරව සකස් කර, 123 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ආණ්ඩුකාරතුමියගේ අවසරය යටතේ 2020/03/12 දිනැති අංක 2166/19 දරන ගැසට් පත්‍රයේ පළ කළ 2023 වර්ෂයට බලාත්මක කළ පහත සඳහන් අතුරු ව්‍යවස්ථාවන් 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ තීරණය කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

I. ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ VII වන උපවගන්තියේ (ඊ) අනු වගන්තිය ප්‍රකාරව,

- ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

II. ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ IX වන උපවගන්තියේ (උ) අනු වගන්තිය ප්‍රකාරව,

- හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
- බේකරි පවත්වාගෙන යාම විධිමත්, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

III. ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ IX වන උපවගන්තියේ (ඔ) අනු වගන්තිය ප්‍රකාරව,

- පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාද ායක ව්‍යාපාර විධිමත් කිරීම නියාමනය කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

IV. ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ XXIV වන උපවගන්තියේ ප්‍රකාරව,

- කොණ්ඩා සකසන ස්ථාන බාබර් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

12-773/7

කන්තලේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ පහත සඳහන් තීරණය යෝජනා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බලය ලබා දෙමින් එම උපලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අය කළ යුතු යැයි,

තීරණය සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *බලය දෙනු ලබන කාර්යය*		*II වැනි තීරුව* *ගාස්තුව* *රු. ශත*
01.	පෝරම ගාස්තු හා පරිපාලන ගාස්තු :	
I.	වීථිරේඛා සහතික නිකුත් කිරීමේ ගාස්තු (126-2023.12.01 කමිටු තීරණය)	1,500 0
II.	නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු (126-2023.12.01 කමිටු තීරණය)	1,500 0
III.	සේවා ගාස්තු (ලේඛන සෙවීම/ඡායා පිටපත්)	500 0
IV.	ත්‍රිරෝද රථ ගාල් කිරීම වෙනුවෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු	1,500 0
V.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු (126-2023.12.01 කමිටු තීරණය)	1,000 0
VI.	ඉඩම් අනුබෙදුම්/මිනින්දෝරු සැලසුම අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු (126-2023.12.01 කමිටු තීරණය)	1,000 0
VII.	ළිං/වැසිකිලි වල කැපීම සඳහා ගාස්තු	1,000 0
VIII.	දුරකතන කුළුණු සඳහා සේවා ගාස්තු	40,000 0
IX.	පා පැදි බලපත්‍ර හා පරිපාලන සේවා ගාස්තු	50 0
X.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු (126-2023.12.01 කමිටු තීරණය)	500 0
XI.	පුස්තකාලය සම්බන්ධ ගාස්තු	
*	සාමාජික ගාස්තු	250 0
*	පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු (එක් ග්‍රන්ථයකට එක් දිනකට) (126-2023.12.01 කමිටු තීරණය)	5 0
*	ග්‍රන්ථයක් අස්ථාන ගත වීමේ දී එම ග්‍රන්ථයේ වටිනාකම මෙන් දෙගුණය සහ තැපැල් ගාස්තු සඳහා රු. 75.00 ක් හෝ එම ග්‍රන්ථයම නැවත ලබා ගැනීම	
XII.	ටෙන්ඩර් පෝරම ගාස්තු	1,000 0
XIII.	අලෙවි ප්‍රවර්ධන ගාස්තු (දිනකට)	5,000 0
XIV.	ආදාහනාගාර ගාස්තු	
*	එක් ආදාහනයක් සඳහා (603-2023.03.08 සහා තීරණය)	22,500 0
*	ආදාහනාගාර අයදුම්පත්‍ර ගාස්තු	50 0
XV.	ක්‍රීඩාංගණ සඳහා ගාස්තු	
*	ලීලාරත්න ක්‍රීඩාංගණය දිනකට	5,000 0
*	අනෙකුත් ක්‍රීඩාංගණය දිනකට	2,000 0
*	සංදර්ශන හා සැණකෙළි සඳහා තැන්පතු මුදල (126-2023-12-01 කමිටු තීරණය)	25,000 0

02. සභාව සතු වාහන කුළියට ලබා දීම :

	වාහනය	*විස්තරය*	*ගාස්තුව රු. ශත*
I.	ට්‍රැක්ටර් බවුසරය	දිනකට (126-2023.12.01 කමිටු තීරණය)	2,000 0
II.	ට්‍රැක්ටරය	දිනකට (126-2023.12.01 කමිටු තීරණය)	7,000 0
III.	ලොකු ගල් රෝල	දිනකට (ඉන්ධන රහිතව)	12,000 0
IV.	මෝටර් ග්‍රේඩරය	පැය 01 (126-2023.12.01 කමිටු තීරණය)	9,000 0
V.	ගලි බවුසරය	වාර 01	9,000 0
		(වැඩි වන කි. මී. 1 සඳහා)	200 0
VI.	ටිපර් රථය	දිනකට (ඉන්ධන රහිතව) (126-2023.12.01 කමිටු තීරණය)	10,000 0
VII.	පස් තලන යන්ත්‍රය	දිනකට (ඉන්ධන රහිතව) (126-2023.12.01 කමිටු තීරණය)	5,000 0
		වැඩිවන කි. මී. 1 ක් සඳහා)	50 0
VIII.	JCB යන්ත්‍රය	පැය 01 (ඉන්ධන රහිතව) (126-2023.12.01 කමිටු තීරණය)	6,500 0
IX.	කෲ කැබ්රථය	දිනකට (ඉන්ධන රහිතව) (126-2023.12.01 කමිටු තීරණය)	10,000 0
X.	ජල බවුසරය	ලීටර් 1 (126-2023.12.01 කමිටු තීරණය)	03 0
		කි. මී. 1 (නගර සීමාවේ පිටතට)	200 0

03. පොදු වෙළෙඳපොළ රථ ගාල් ගාස්තු :

		රු. ශත
I.	පා පැදි	10 0
II.	යතුරු පැදි	20 0
III.	ත්‍රී රෝද රථ	50 0
IV.	ලොරි රථ, බස් රථ, වෑන් රථ, වෙනත් බර වාහන	100 0

04. ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු අයකිරීම :

කාලය	*ස්වභාවය*		
	ලී තහඩු ප්ලාස්ටික් ෆයිබර් වර්ග අඩියකට රු. ශත	*රෙදි, ඩිජිටල්, ඉටිරෙදි බෝඩ් හෝ වෙනත් වර්ග අඩියකට රු. ශත*	*තැන්පතු මුදල (එක් පුවරුවක් සඳහා) වර්ග අඩියකට රු. ශත*
සති 2 හෝ ඊට අඩු	75.00	45.00	75.00
මාස 1 - 6	112.50	75.00	150.00
මාස 6 - අවුරුදු - 1	150.00	112.50	225.00
අවුරුදු 1 - අවුරුදු 2	225.00	150.00	375.00

05. ප්‍රාදේශීය සභා මාර්ග හරහා ජල සැපයුම ලබා ගැනීමේ ගාස්තු අය කිරීම:

Pradeshiya Sabha Kanthale

Road Damage Rate 2022

LNo.	Description of Work	Times					
1	Earth Road						
	Excavation	1	7.50	0.60	0.75	3.38	
	Sand Filling		M^3	0.85	8,182.00	6,954.70	
	Gravel Filling		M^3	1.00	2,939.00	2,939.00	
	Tamp		M^3	3.40	100.00	340.00	
	Rate per 4.5 M^2					10,233.70	
	Rate per M^2					2,274.16	2,270.00
2	Concrete & Block Paving Road						
		1	3.55	0.60	0.15	0.33	
		2	0.60	0.15	0.30	0.05	0.38
	Sand Filling		M^3	0.85	8,182.00	6,954.70	
	Gravel Filling		M^3	1.00	2,939.00	2,939.00	
	Tamp		M^3	3.40	100.00	340.00	
	1:2:4(12) Concrete		M^3	0.40	40,410.00	16,164.00	
	Rate per 4.5 M^2					26,397.70	
	Rate per M^2					5,866.16	5,850.00
3	Metaling & Taring						
	Sand filling		M^3	0.85	8,182.00	6,954.70	
	Gravel Filling		M^3	1.00	2,939.00	2,939.00	
	Tamp		M^3	3.40	100.00	340.00	
	Rippling the existing damage metaling & taring Road		M^3	2.20			
	Supplying Dense Graded aggeregate base (ABC)		M^3	0.32	5,840.00	1,868.80	
	Prime coat with emulsion(CSS-1) 1Lit/m^2		M^3	2.20	340.00	748.00	
	Supplying & pilling 37.5 mm metal		M^3	0.11	4,855.00	534.05	
	Supplying & pilling 20 mm metal		M^3	0.07	5,215.00	365.05	
	Supplying & pilling 12mm metal at size		M^3	0.04	5,215.00	208.60	
	First coat bitumens surface using 2 Lit/m^2		M^3	2.20	605.52	1,332.14	
	First coat bitumens surface using 1 Lit/m^2		M^3	2.20	299.00	657.80	
	Rate per 4.5^2					15,948.14	
	Rate per M^2					3,544.03	3,500.00

06. නගර ශාලාව වෙන් කිරීම සම්බන්ධ ගාස්තු අය කිරීම :

නගර ශාලා කොටස	*විස්තරය*	*අය කරන මුදල රු.*
ඉහල මහළ ප්‍රේක්ෂකාගාරය	පෙර පාසල්, රාජ්‍ය ආයතන නොවන කටයුතු සඳහා දිනකට	37,500 0
	පෙර පුහුණුවීම් කටයුතු - උපරිම පැය 4කට යටත්ව	5,000 0
ඉහළ මහළ ප්‍රේක්ෂකාගාරය	රාජ්‍ය ආයතන පොදු කටයුතු සඳහා දිනකට	25,000 0
	රජයේ ලියාපදිංචි පෙර පාසල් උත්සව සඳහා දිනකට	10,000 0

07. අයාලේ ගැවසෙන සතුන් තහනම් කිරීම :

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66(1), (2), (3), (4) අංක දරන වගන්තියේ පෙන්වා ඇති රීති අනුව කන්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මහා මාර්ග වල අතුරු මාර්ග වල හා පොදු ස්ථාන වල අයාලේ ගැවසෙන එළුවන්, ගවයින්, ප්‍රාදේශීය සභාව විසින් අත්පත් කර ඒ සඳහා සකස් කර ඇති පොදු ස්ථානයක ආරක්ෂා කර පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි 2024.01.01 වන දින සිට ගාස්තු අයකරනු ලබන බව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි, කන්තලේ ප්‍රදේශීය සභාවේ 2023 වර්ෂයෙහි දෙසැම්බර් මස 01 දින අංක 127 යටතේ පහත සඳහන් තීරණය යෝජනා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. ආර්. ජයවික්‍රම,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය, කන්තලේ.

	රු. ශත
(1) සතෙකු ඇල්ලීම සඳහා වූ ගාස්තු	1.500 0
(2) සතා නඩත්තු කිරීමේ ගාස්තු	500 0
(3) පැය 24 ක් තුළදී නැවත අයාලේ ගිය සතාව නිදහස් නොකරන අවස්ථාවේ දී (අතිරේක සෑම දිනයක් සඳහාම)	500 0

එසේ අල්ලා ගන්නා ලද සතුන් සඳහා ඉහත කී ගාස්තු ගෙවා නිදහස් කිරීමට අපොහොසත් වන සතුන් දින 10 කින් පසුව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එමගින් ලැබෙන මුදල් ප්‍රාදේශීය සභා අරමුදලට බැර කරනු ලැබේ.

08. නියමිත ස්ථානයක් නොමැතිව ජංගම වෙළඳාමේ නිරතවන ව්‍යාපාරිකයින් සඳහා වූ ගාස්තු :

එකී උපලේඛනයේ සඳහන් ස්ථාන හෝ පරිශ්‍රයන් අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන්පොළෙන් පසුගිය වර්ෂයේලත් ලැබීම්වලින් සියයට එකකට (1%) සමාන ප්‍රමාණයක මුදලක් බලපත්‍ර ගාස්තු වශයෙන් අය කිරීමටත් 2023 ඔක්තෝබර් මස 25 දින දිඹුලාගල ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු තීරණ අංක DIM/2023/10/25/471 මගින් තීරණය කරයි."

උපලේඛනය

I වන තීරුව		*II වන තීරුව*		
අනු අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		750 නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*750ට වැඩි එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*1,500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
01	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
02	හෝටලයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
03	බත් කඩයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
04	ආපනශාලාවක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
05	තේ කඩයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
06	කෝපි කඩයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
07	බේකරියක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
08	කිරි පට්ටියක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
09	කිරි විකිණීම.	500 00	750 00	1,000 00

I වන තීරුව		*II වන තීරුව*		
අනු අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		750 නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*750ට වැඩි එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*1,500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
10	මාළු විකිණීම.	500 00	750 00	1,000 00
11	මස් විකිණීම.	500 00	750 00	1,000 00
12	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
13	ලොන්ඩරියක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
14	ගවගාලක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
15	පොද්ගලික වෙළඳසලක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
16	කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
17	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
18	ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
19	සංචාරක වෙළඳාම සඳහා	500 00	750 00	1,000 00

12-709/1

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට කර්මාන්ත බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තිය හා 150(1) වගන්තියෙ හි විධිවිධාන ප්‍රකාරව දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින.
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ පහත උපලේඛනයේ I වන තීරයේ සඳහන් කර්මාන්තයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක්

එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම, එකී උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියම කර අය කර ගත යුතු බව සහ ඒ කර්මාන්ත බද්ද එකී වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බවත් 2023 ඔක්තෝබර් මස 25 දින දිඹුලාගල ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු තීරණ අංක DIM/2023/10/25/471 මගින් තීරණය කරයි."

උපලේඛනය

I වන තීරුව		*II වන තීරුව*		
අනු අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		750 නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*750ට වැඩි එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*1,500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
01	වඩුමඩු කර්මාන්තයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
02	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
03	කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
04	ලී ඉරුම්පලක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
05	යකඩ කම්හලක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
06	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
07	ගඩොල්, උළු හා මැටි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
08	හස්ත කර්මාන්තයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
09	බ්ලෝක් ගල් නිෂ්පාදනය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
10	පොල් තෙල් සිඳීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
11	ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
12	කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්තයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
13	සබන් නිෂ්පාදනය	500 00	750 00	1,000 00
14	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
15	වී මෝල් කර්මාන්තයක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
16	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම.	500 00	750 00	1,000 00
17	පෑස්සුම් වැඩපලක් පවත්වාගෙන යාම.(වෙල්ඩින් වැඩපලක්)	500 00	750 00	1,000 00

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ව්‍යාපාර බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) වන උපවගන්තියෙ හි විධිවිධාන ප්‍රකාරව දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට නිවේදනය කරමි.

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට, යම් කර්මාන්තයක් නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබූ ආදායම පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, එකී උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම කර අය කර ගත යුතු බව සහ එකී ව්‍යාපාර බද්ද එකී වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බවත් 2023 ඔක්තෝබර් මස 25 දින දිඹුලාගල ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු තීරණ අංක DIM/2023/10/25/471 මගින් තීරණය කරයි."

උපලේඛනය

I වන තීරුව *2023 වසරේ වාර්ෂික ආදායම*	*II වන තීරුව* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	රු. 90 00
රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	රු. 180 00
රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	රු. 360 00
රු. 75,000 ඉක්මවන එහෙත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	රු. 1,200 00
රු. 150,000 ඉක්මවන අවස්ථාවක	රු. 3,000 00

12-709/3

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට වාහන හා සත්ත්ව බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙ හි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙ හි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව නියමකර අය කිරීමට නිවේදනය කරමි.

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 147 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ඇති හෝ පාවිච්චි කරන්නා වූ සෑම වාහනයක් සහ සතෙක්ම වෙනුවෙන්ම මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2024 වර්ෂයේ දී පනවා අයකළ යුතු යැයි 2023 ඔක්තෝබර් මස 25 දින දිඹුලාගල ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු තීරණ අංක DIM/2023/10/25/471 මගින් තීරණය කරයි."

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 00
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් කරත්තයක් සඳහාම	
වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 00
වෙළඳ කාර්යය සඳහා නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4 00
සෑම කරත්තයක් සඳහාම	20 00
සෑම අත් කරත්තයක් සඳහාම	10 00
සෑම රික්ෂෝවක් සඳහාම	7 00
සෑම අශ්වයෙක්, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහාම	15 00
සෑම ඇතෙකු සඳහාම	50 00

12-709/4

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසර සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 (අ)122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988-08-23 වැනි දින අංක 520/70 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV (අ) කොටසේ විධාන ප්‍රකාරව පහත උපලේඛනයෙ හි දැක්වෙන ආකාරයට ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසර සඳහා බද්දක් දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව නියමකර අය කිරීමට නිවේදනය කරමි.

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 (අ)122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988-08-23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/ දෘශ්‍ය පරිසරය පිළිබඳ විධිවිධාන ප්‍රකාර දිඹුලාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම සඳහා පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් නැවත සංශෝධනය කරන තුරු 2024 වර්ෂයේ දී පනවා අය කළ යුතු යැයි 2023 ඔක්තෝබර් මස 25 දින දිඹුලාගල ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු තීරණ අංක DIM/2023/10/25/471 මගින් තීරණය කරයි."

උපලේඛනය

දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීම

ප්‍රදර්ශනය කරන කාල සීමාව	*අය කරන ගාස්තුව*
01. සති දෙකකට අඩු වර්ග අඩියක් සඳහා	රු. 30 00
02. සති දෙකක සිට මාස 06 දක්වා වර්ග අඩියක් සඳහා	රු. 40 00
03. මාස 06 සිට වසරක් දක්වා වර්ග අඩියක් සඳහා	රු. 50 00
04. වෙළඳසැල ඉදිරිපිට ඇති දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට	රු. 60 00
05. බිත්ති පින්තාරු කර ප්‍රචාරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් වර්ග අඩියකට	රු. 70 00
06. ආලෝක දැන්වීම් පුවරු (Light Board) සඳහා වර්ග අඩියකට	රු. 80 00

12-709/5

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට විනෝද බද්දක් පැනවීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයට අදාළ විනෝද බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින.
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

යෝජනාව

"2024 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ සෑම මුදල් අයකර පෙන්වන චිත්‍රපට දර්ශනයක්, ආධාර චිත්‍රපට දර්ශනයක්, සර්කස් සංදර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් ගෙවිය යුතු වන්නේ යැයි දිඹුලාගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

12-709/6

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට සේවා සහ පෝරම ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී අති බලතල ප්‍රකාරව 2024 වර්ෂයට අදාළව සේවා සැපයීමේ දී සේවා හා පෝරම ගාස්තු පහත සඳහන් ආකාරයට අය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සිදුකරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා , සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී, අවශ්‍ය කරන සේවා සැපයීමේ දී 2024 වර්ෂය ඇතුළත ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතුයැයි 2023 ඔක්තෝබර් මස 25 දින දිඹුලාගල ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු තීරණ අංක DIM/2023/10/25/471 මගින් තීරණය කරයි."

උපලේඛනය

01. වාහන යන්ත්‍ර සූත්‍ර ලබා දීමේ සේවා ගාස්තු

01. ට්‍රැක්ටර් බවුසරයෙන් (ලීටර් 3,000) ජලය සැපයීම.

පානීය ජලය (බල ප්‍රදේශය තුළ)	රු.1,500 00
පානීය නොවන ජලය	රු.1,000 00
ප්‍රවාහනය 1Kmක් සඳහා	රු. 100 00
බවුසරය නවතා තැබීමේ ගාස්තු	රු. 1,000 00

ව්‍යාපෘති සඳහා ජල බවුසරය ලබාදීම (එක් දිනක් සඳහා)

බල ප්‍රදේශය තුළ	රු.10,000 00
බල ප්‍රදේශයෙන් පිටත	රු.12,000 00

(ඉන්ධන රහිතව ජල බවුසරය සහ ට්‍රැක්ටර් රථය පමණක්)

02. ගලි බවුසරය ලබාදීම.

ගලි බවුසරය එක් වරක් සඳහා බල ප්‍රදේශය තුළ	රු.10,000 00
ගලි බවුසරය එක් වරක් සඳහා බල ප්‍රදේශයෙන් පිටත	රු.12,000 00
ප්‍රවාහනය 1Kmක් සඳහා	රු.100 00

ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් එක් වරක් බැහැර කිරීම සඳහා අය කරන ගාස්තුව

ට්‍රැක්ටර් ගලි බවුසරයක් සඳහා (ධාරිතාවය ලීටර් 2,000 ට අඩු) - රු 3,000 00

ට්‍රැක්ටර් ගලි බවුසරයක් සඳහා (ධාරිතාවය ලීටර් 2,000 ට වැඩි) - රු 3,500 00

03. බැකෝලෝඩර් යන්ත්‍රය ලබාදීම.

මීටර පැය 01ක් සඳහා	රු.6,500 00
ගමන් කරන සෑම 1Kmක් සඳහා ප්‍රවාහන ගාස්තු	රු.200 00

04. මොටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබාදීම.

මීටර පැය 01ක් සඳහා (බල ප්‍රදේශය තුළ)	රු.7,500 00
මීටර පැය 01ක් සඳහා (බල ප්‍රදේශයෙන් පිටත)	රු.8,000 00
ගමන් කරන සෑම 1Kmක් සඳහා ප්‍රවාහන ගාස්තු	රු.250 00

(අවම පැය 03 ට යටත්ව මුදල් අය කිරීමෙන් පසුව සේවා සපයනු ලැබේ.)

05. මාර්ග තලන යන්ත්‍රය ලබාදීම.

මීටර් පැය 01ක් සඳහා බල ප්‍රදේශය තුළ	රු.5,500 00
මීටර් පැය 01ක් සඳහා බල ප්‍රදේශයෙන් පිටත	රු.6,000 00
වැඩ නොමැතිව නවතා තබන දිනක් සඳහා	රු.2,500 00

(අවම පැය 03 ට යටත්ව මුදල් අය කිරීමෙන් පසුව සේවා සපයනු ලැබේ.)

06. මාර්ග තලන යන්ත්‍රය ප්‍රවාහනය සඳහා

01) බල ප්‍රදේශය තුළ මාර්ග තලන යන්ත්‍රය ප්‍රවාහනය සඳහා වන මිල ගණන්
1Km සිට 10Km දක්වා රුපියල් 3,000.00 වන අතර, වැඩිවන
සෑම කිලෝමීටරයක් සඳහාම රු.250.00 බැගින් අයකරනු ලැබේ.

02) **බල ප්‍රදේශයෙන් පිටත ප්‍රවාහනය සඳහා**
1Km සිට 10Km දක්වා රුපියල් 5,000.00 වන අතර, වැඩිවන
සෑම කිලෝමීටරයක් සඳහාම රු.250.00 බැගින් අයකරනු ලැබේ.
(අවම පැය 03 ට යටත්ව මුදල් අය කිරීමෙන් පසුව සේවා සපයනු ලැබේ.)

07. ටිපර් රථය ලබාදීම

ඉන්ධන නොමැතිව දිනකට (උපරිම දුර 150 Km)	
බල ප්‍රදේශය තුළ	රු.15,000 00
බල ප්‍රදේශයෙන් පිටත	රු. 18,000 00

08. තණකොළ කපන යන්ත්‍රය ලබාදීම

ට්‍රැක්ටරය සමග ක්‍රීඩා පිටියක් සඳහා	රු.6,500 00
ප්‍රවාහනය කරන සෑම මීටර පැය 01 ක් සඳහා	රු.100 00
පුද්ගලික ඉඩමක තණකොළ කැපීම සඳහා මී.පැ. 1ක් සඳහා	රු.2,200 00

09. ක්‍රොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය ලබාදීම

ඉන්ධන හා යන්ත්‍ර ක්‍රියාකරු නොමැතිව දිනකට	රු. 2,500 00
ඉන්ධන හා යන්ත්‍ර ක්‍රියාකරු නොමැතිව දින 15ට	රු. 15,200 00
ඉන්ධන හා යන්ත්‍ර ක්‍රියාකරු නොමැතිව දින 20ට	රු. 30,000 00

02. මිනින්දෝරු සැලසුම් අනුමත කිරීම සඳහා ගාස්තු

* මිනින්දෝරු සැලසුම් අයදුම්පත්‍ර ගාස්තු	රු.500 00

ගෘහස්ථ මිනින්දෝරු සැලසුම් අනුමත කිරීමේ ගාස්තු

පර්චස් 20 ට අඩු	රු. 750 00
පර්චස් 21 සිට 40 දක්වා	රු. 1,000 00
පර්චස් 41 සිට 60 දක්වා	රු. 1,500 00
පර්චස් 61 සිට 80 දක්වා	රු. 2,500 00
පර්චස් 80ට වැඩි	රු. 3,000 00

වාණිජ මිනින්දෝරු සැලසුම් අනුමත කිරීමේ ගාස්තු

පර්චස් 01 සිට 05 දක්වා	රු. 1,000 00
වැඩිවන සෑම පර්චස් 01ක් සඳහාම	රු. 100 00

03. ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ සේවා

ගොඩනැගිලි සැලසුම් ඉල්ලුම්පත්‍ර ගාස්තු	*500 00*
ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ පරීක්ෂණ ගාස්තු ගෘහ කාර්යය සඳහා වාණිජ කාර්යය සඳහා	 1,000 00 1,500 00
පෙරසැරි ගාස්තු වර්. අඩි 1,000 අඩු (වර්. අඩියකට) ගෘහ කාර්යය සඳහා වාණිජ කාර්යය සඳහා	 02 00 05 00
වර්. අඩි 1,000- 2,000 අතර (වර්. අඩියකට) ගෘහ කාර්යය සඳහා වානිජ කාර්යය සඳහා	 02.50 05.50
වර්ග අඩි 2,000 ට වැඩි (වර්. අඩියකට) ගෘහ කාර්යය සඳහා වානිජ කාර්යය සඳහා	 03 00 06 00

04. සුසාන භූමි හා ආදාහනාගාරය භාවිතා කිරීමේ දී අය කරනු ලබන ගාස්තු

	රු. ශත
සුසාන භූමි - මෘතදේහ තැන්පත් කිරීම වෙනුවෙන් (වර්ග අඩි 01ක් සඳහා)	50 00
සුසාන භූමි තුළ ස්මාරක ඉදිකිරීම වෙනුවෙන් (වර්ග අඩි 01ක් සඳහා)	200 00

ආදාහනාගාරය භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම

බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහය ආදාහනය කිරීමට	15,000 00
බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහය ආදාහනය කිරීමට	18,000 00
බල ප්‍රදේශය තුළ පදිංචි වයස අවුරුදු 12ට අඩු දරුවෙකුගේ මෘත දේහය ආදාහනය කිරීමට	6,750 00
බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වයස අවුරුදු 12ට අඩු දරුවෙකුගේ මෘත දේහය ආදාහනය කිරීමට	8,100 00

05. මාර්ගය පළුදු කිරීම වෙනුවෙන්

අනිවාර්යය ගාස්තු රු.1,500+ (අදාළ කාර්යය සඳහා ඇස්තමේන්තු ගත මුදල)

06. ජල ගාස්තු අය කිරීම

ගෘහස්ථ පරිභෝජන එක් ඒකකයක් සඳහා

ඒකක ගණන	*ඒකකයක මිල* *රු. ශත*	*සේවා ගාස්තුව* *රු. ශත*
1 සිට 10 දක්වා	40 000	150 00
11 සිට 20 දක්වා	60 00	150 00
21 සිට 30 දක්වා	75 00	200 00
31 සිට 40 දක්වා	110 00	350 00
41 සිට 50 දක්වා	200 00	600 00
51 සිට ඉහළට	200 00	1,000 00

වාණිජ පරිභෝජනය

ඒකක ගණන	*ඒකකයක මිල*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
1 සිට 25 දක්වා	80 00	250 00
26 සිට 50 දක්වා	80 00	400 00
51 සිට 75 දක්වා	80 00	900 00

පොදු ස්ථාන සඳහා

01. ආගමික ස්ථාන

ඒකක ගණන	*ඒකකයක මිල*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
1 සිට 10 දක්වා	නොමිලේ	100 00
11 සිට 100 දක්වා	30 00	100 00
101 සිට ඉහළට	100 00	100 00

02. පිරිවෙන් සඳහා

ඒකක ගණන	*ඒකකයක මිල*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
1 සිට 15 දක්වා	නොමිලේ	100 00
16 සිට 100 දක්වා	30 00	100 00
101 සිට ඉහළට	100 00	100 00

03. ප්‍රාථමික පාසල් සඳහා

ඒකක ගණන	*ඒකකයක මිල*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
1 සිට 10 දක්වා	නොමිලේ	100 00
11 සිට 100 දක්වා	30 0	100 00
101 සිට ඉහළට	100 00	100 00

04. මහ විද්‍යාල සඳහා

ඒකක ගණන	*ඒකකයක මිල*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
1 සිට 25 දක්වා	නොමිලේ	100 00
26 සිට 100 දක්වා	30 00	100 00
101 සිට ඉහළට	100 00	100 00

05. පෙර පාසල සඳහා

ඒකක ගණන	*ඒකකයක මිල*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
1 සිට 5 දක්වා	නොමිලේ	100 00
6 සිට 100 දක්වා	30 00	100 00
101 සිට ඉහළට	100 00	100 00

06. නව සම්බන්ධතා ගාස්තු

- ගෘහස්ථ පරිභෝජන නව ජල සම්බන්ධතා ගාස්තු - රු.20,347 00
  (ඉහත මිල අයත් වනුයේ ප්‍රධාන ජල නලයේ සිට මීටර් 10ක් දුර ප්‍රමාණයක් සඳහා පමණක්වන අතර, වැඩිවන සෑම මීටර් 1ක් සඳහා රු.300 00 වැඩිවීමක් සිදුවේ.)
- පොදු ස්ථාන සඳහාවන නව ජල සම්බන්ධතා ගාස්තු - රු.18,347 00
  (ඉහත මිල අයත් වනුයේ ප්‍රධාන ජල නලයේ සිට මීටර් 10ක් දුර ප්‍රමාණයක් සඳහා පමණක්වන අතර, වැඩිවන සෑම මීටර් 1ක් සඳහා රු.300 00 වැඩිවීමක් සිදුවේ. කැණීස් සිදුකර දිය යුතු වේ.)

- ඉදිකිරීම් සඳහාවන නව ජල සම්බන්ධතා ගාස්තු - රු.30,347 00
  (ඉහත මිල අයත් වනුයේ ප්‍රධාන ජල නලයේ සිට මීටර් 10ක් දුර ප්‍රමාණයක් සඳහා පමණක්වන අතර, වැඩිවන සෑම මීටර් 1ක් සඳහා රු.500 00 වැඩිවීමක් සිදුවේ.)
- වාණිජ නව ජල සම්බන්ධතා ගාස්තු - රු.25,347 00
  (ඉහත මිල අයත් වනුයේ ප්‍රධාන ජල නලයේ සිට මීටර් 10ක් දුර ප්‍රමාණයක් සඳහා පමණක් වන අතර, වැඩිවන සෑම මීටර් 1ක් සඳහා රු.400 00 වැඩිවීමක් සිදුවේ.)

විසන්ධි කර නැවත සම්බන්ධතා ලබා දීමේ ගාස්තුව - 2,000 00

ඉඩමක් විකිණීමෙන් අනතුරුව ජල පාරිභෝගිකත්වය වෙනස් කිරීමේ ගාස්තුව ලෙසින් රු. 5,000 00

07. ක්‍රීඩාභූමි වෙන් කිරීම සඳහා ගාස්තු

	රු. ශත
සංගීත සංදර්ශන සඳහා (එක් දිනකට) තැන්පත් මුදල්	
මෛත්‍රී ක්‍රීඩාංගනය සඳහා (බල ප්‍රදේශයේ අයෙක් නම්)	50,000 00
මෛත්‍රී ක්‍රීඩාංගනය සඳහා (බල ප්‍රදේශයෙන් පිට අයෙක් නම්)	60,000 00
වැඩිවන සෑම දිනයක් සඳහාම	10,000 00
අනෙකුත් ක්‍රීඩාංගන සඳහා තැන්පත් මුදල	15,000 00

ක්‍රීඩා භූමි වෙන් කිරීමේ ගාස්තු

මෛත්‍රී ක්‍රීඩාංගනය සඳහා (බල ප්‍රදේශයේ අයෙක් නම්)	30,000 00
මෛත්‍රී ක්‍රීඩාංගනය සඳහා (බල ප්‍රදේශයෙන් පිට අයෙක් නම්)	35,000 00
අනෙකුත් ක්‍රීඩා පිටි සංගීත සංදර්ශන සඳහා (එක් දිනකට)	15,000 00
වෙළඳ සංදර්ශන සහ සැණකෙලි සඳහා (එක් දිනකට)	15,000 00
උත්සව සහ රැස්වීම් සඳහා (එක් දිනකට)	3,500 00
ක්‍රීඩා තරග සඳහා එක් දිනකට (සුභ සාධන කටයුතු සඳහා)	1,000 00
වාණිජ පරමාර්ථයෙන් සිදු කරන ක්‍රීඩා තරග එක් දිනකට(මෛත්‍රී ක්‍රීඩාංගනය)	5,000 00
වාණිජ පරමාර්ථයෙන් සිදු කරන ක්‍රීඩා තරග එක් දිනකට (වෙනත් ක්‍රීඩාංගන)	3,000 00
නොමිලේ පැවැත්වෙන වෙනත් කටයුතු සඳහා	1,000 00
ක්‍රීඩා පිටි තුළ බොරළු සහ ABC ගබඩා කිරීම සඳහා (කියුබ් 01ට)	300 00
ක්‍රීඩා පිටි තුළ බොරළු සහ ABC ගබඩා කිරීම සඳහා තැන්පත් මුදල්	100,000 00

08. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු

පරීක්ෂා කිරීමේ ගාස්තු :

	රු. ශත
■ 250,000 00 හෝ ඊට අඩු	3,000 00
■ 250,001 00 - 50,000 00	3,750 00
■ 500,001 00 - 1,000,000 00	5,000 00
■ 1,000,000 00 වැඩි	10,000 00

පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු 4,500 00

09. පුස්තකාල හා පෙර පාසල් ගාස්තු

පුස්තකාල ගාස්තු :

	රු. ශත
■ ළමා සමාජික ගාස්තු	60 00
■ වැඩිහිටි සමාජික ගාස්තු	100 00
■ පුස්තකාල දඩ (ප්‍රමාදවන දිනකට)	10 00

පෙර පාසල් ගාස්තු : මනම්පිටිය සහ දිඹුලාගල)

■ අයදුම්පත් ගාස්තු	200 00
■ ඇතුළත්වීමේ ගාස්තු	2,000 00

මනම්පිටිය නව පෙර පාසල් ගාස්තු :	රු. ශත
ඇතුළත් වීමේ ගාස්තු (එක් සිසුවෙක් සඳහා)	5,000 00
මාසික පෙර පාසල් ගාස්තු (එක් සිසුවෙක් සඳහා)	3,000 00
අයදුම්පත් ගාස්තු	200 00

දිවා සුරැකුම් මධ්‍යස්ථානය ගාස්තු :

ඇතුළත් වීමේ ගාස්තු (එක් සිසුවෙක් සඳහා)	5,000 00
මාසික ගාස්තු (එක් සිසුවෙක් සඳහා)	10,000 00
අයදුම්පත් ගාස්තු	200 00

සති අන්ත පාඨමාලා ගාස්තු

මාසික ගාස්තු (එක් සිසුවෙක් සඳහා)	1,000 00

විද්‍යුත් පුස්තකාල සේවා ගාස්තු

අන්තර්ජාල පහසුකම් (පැය 1ක් සඳහා) රු.50 00

ඡායා පිටපත් ලබා ගැනීම :

A4 ප්‍රමාණය	15 00
A5 ප්‍රමාණය	10 00
Legal ප්‍රමාණය	20 00
B4 ප්‍රමාණය	20 00
A3 ප්‍රමාණය	20 00
Email	30 00
Print Out	15 00

10. වෙනත් ගාස්තු

		රු. ශත
1.	වීථිරේඛා අයදුම්පත්‍ර ගාස්තු	500 00
2.	වීථිරේඛා සහතිකයක් නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු (නේවාසික)	1,500 00
3.	වීථිරේඛා සහතිකයක් නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු (වාණිජ)	2,000 00
4.	කොන්ත්‍රාත් ගිවිසුම්පත් සඳහා	1,000 00
5.	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා (එක් දිනක් සඳහා)	2,500 00
6.	ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු (එක් ත්‍රිරෝද රථයක් සඳහා)	750 00
7.	දුරකතන සන්නිවේදන කුළුණු සඳහා (එක් කුළුණක් සඳහා)	3,000 00
8.	වැලි ගබඩා කිරීම සඳහා (කියුබ් 1ක් සඳහා)	300 00
9.	විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටනා කුළුණු ඉදිකිරීම	
	* බිම් පාදම ඉදිකිරීම	75,000 00
	* වහළ මුදුන ඉදිකිරීම	50,000 00

10. මිරිදිය ධීවර සමිති මත්ස්‍ය අලෙවිය වෙනුවෙන් 1KG සඳහා රු.5 00
11. අනවසර ඉදිකිරීම් සඳහා දඩ මුදල්
    - අවශ්‍ය අනුමැතිය ලබානොගෙන සිදුකරන ලද ඉඩම් බෙදීමක් සඳහා - ඉඩම් කැබලි එකක් සඳහා රු.3,000 00 බැගින්
    - අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම / එකතු කිරීම

ඉදිකිරීමේ / එකතු කිරීමේ ස්වභාවය	*නේවාසික (ව.මී. 1කට) රු.*	*වාණිජ (ව.මී. 1කට) රු.*
අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා)	100 00	250 00
වහල මට්ටම දක්වා ඉදිකිරීම් (ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇතිවිට, වහළය හැර)	150 00	500 00
වහළය සහිත බිත්ති ඉදිකිරීම්	200 00	750 00
පදිංචි වීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම සම්පූර්ණ කිරීම	250 00	1,000 00
මායිම් තාප්ප/ රැදවුම් බිත්ති ඉදිකිරීම	100 00 (දික් මීටරයක් සඳහා)	250 00 (දික් මීටරයක් සඳහා)

12-709/7

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග භාවිතය වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී අති බලතල ප්‍රකාරව 2024 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු පහත සඳහන් ආකාරයට අයවිය යුතු බව මෙයින් නිවේදනය කරමි.

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 60 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත, දිඹුලාගල ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග නිසි බලධරයෙකුගේ අවසරයක් නොමැතිව යම් මං මාවතකින් ගල්, බොරළු වැලි , මඩ හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ රැගෙන යාම වෙනුවෙන් 2024 වර්ෂය සඳහා පහත ගාස්තු පනවා අයකළ යුතු යැයි 2023 ඔක්තෝබර් මස 25 දින දිඹුලාගල ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු තීරණ අංක DIM/2023/10/25/471 මගින් තීරණය කරයි."

	රු. ශත
වැලි කියුබ් 01ක් ප්‍රවාහනය සඳහා ගාස්තුව	300 00
බොරළු කියුබ් 01ක් ප්‍රවාහනය සඳහා ගාස්තුව	150 00

12-709/8

දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට සංවර්ධනය නොකළ ඉඩම් වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සංවර්ධනය නොකල ඉඩම් වෙනුවෙන් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට නිවේදනය කරමි.

එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2%ක් නොඉක්මවන අගයක්

බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව,
මනම්පිටිය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින.
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

12-709/9

අතුරලිය ප්‍රාදේශීය සභාව

වරිපනම් බද්ද - 2024 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 134 වන වගන්තියේ (01) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර, අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළකට ම 2023 වර්ෂයේ දී බල පැවැත් වූ වාර්ෂික වටිනාකම 2024 වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

(ආ) 134 වන වගන්තියේ (01) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර, අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් 8% ක වරිපනම් බද්දක් 2024 වර්ෂයට පනවා අය කිරීමට සහ,

(ඇ) 134 වන වගන්තියේ (06) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව යටෝක්ත වාර්ෂික වරිපනම් බද්ද 2024 මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 දිනයන්වලින් අවසන්වන කාර්තු 04 තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් තීරණ අංක 2023/11/07/826 යටතේ 2023.11.07 දින තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 708/1

අතුරලිය ප්‍රාදේශීය සභාව

අක්කර බද්ද - 2024 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි වගා කළ ඉඩම්වලින් හෙක්ටයාර් 1ට නොඅඩු එහෙත් හෙක්ටයාර් 5ට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (රු. 50.00) අනු ප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ ඊට වැඩිවන සෑම හෙක්ටයාරයක් මතම රුපියල් දහයක් (10.00) බැගින් වූ අක්කර බද්දක් 2024 වර්ෂයට පනවා අය කිරීමට සහ,

(ආ) 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, යටෝක්ත බද්ද 2024 මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු 04 තුළ දී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 708/2

අතුරලිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට බලපත්‍ර ලබාදීමේ දී ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 වැනි දින 520/7 සහා විශේෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථා 2006.10.05 වැනි දින සභාව විසින් පිළිගෙන ඇති අතර, ඒ අනුව බලපත්‍රයක් ලබා ගත යුතු පහත 1 තීරුවේ පළවන පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II වන තීරුවේ සඳහන් අනු ප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂයට පනවා අයකිරීමටත්, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක් සඳහා බලපත්‍ර ලබාදීමේ දී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂයට පනවා අයකිරීමටත්, පහත සඳහන් උපලේඛනයේ සියලුම බලපත්‍ර 2024.03.31 දිනට පෙර අදාළ පුද්ගලයන් විසින් ලබා ගත යුතු බවත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2024.11.07 දින තීරණ අංක 2024/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛන අංක 01

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර ගාස්තු

	වෙළඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බේකරියක් පැවැත්වීම	500 0	700 0	1,000 0
02.	බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
03.	තේ, කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
04.	ලැඟුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05.	බාබර් සාප්පුවක් පැවැත්වීම	400 0	750 0	1,000 0
06.	මස් වෙළඳ සැල්	500 0	750 0	1,000 0
07.	මාළු වෙළෙඳ සැල්	500 0	750 0	1,000 0
08.	ලොන්ඩරි	350 0	750 0	1,000 0
09.	සිසිල් බීම කර්මාන්ත ශාලා	400 0	750 0	1,000 0
10.	කිරි වෙළඳාම	300 0	750 0	1,000 0
11.	ගව ගාල	400 0	750 0	1,000 0
12.	හෝටල්	500 0	750 0	1,000 0
13.	ඝාතක මඩු	500 0	750 0	1,000 0

අතුරලිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛන I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු

I වැනි තීරුව		*II වැනි තීරුව*		
	වෙළඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්ම වන විට*	*වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501 වැඩිවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඇඳුම් මැසීම	300 0	750 0	1,000 0
02.	තේ කුඩු, කුළු බඩු පැකට් කර විකිණීම	400 0	750 0	1,000 0
03.	පා පැදි අලුත්වැඩියා කිරීම	350 0	750 0	1,000 0
04.	වී මෝල්	500 0	750 0	1,000 0
05.	යතුරු පැදි ත්‍රීවිල් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
06.	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	ටයර්, ටියුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
08.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
09.	පොල්තෙල් මෝලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
10.	ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
11.	ලියවන පට්ටලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
13.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කුෂන් වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	බීරළු, ලී කැටයම් වැඩ පළවල්	500 0	750 0	1,000 0
17.	ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
18.	යෝගට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19.	කුකුළු ගොවිපල	400 0	750 0	1,000 0
20.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	400 0	750 0	1,000 0
21.	රස කැවිලි නිෂ්පාදන	400 0	750 0	1,000 0
22.	හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම	400 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
	වෙළඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්ම වන විට*	*වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,5001 වැඩිවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
23.	කොප්පරා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
24.	රබර් කර්මාන්ත ශාලා	400 0	750 0	1,000 0
25.	ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	වෑල්ඩින් වැඩපලක්	500 0	750 0	1,000 0
28.	ඇසිඩ් වර්ග නිපදවීම විකිණීම	500 0	750 0	1,000 0
29.	ගිණිකෙළි භාණ්ඩ නිපදවීම, විකිණීම	500 0	750 0	1,000 0
30.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
31.	වායු සම්කරණ, ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
32.	මැණික් කැපීම හා ඔප දැමීම	500 0	750 0	1,000 0
33.	ප්ලාස්ටික් ෆයිබර් ග්ලාස් නිපදවන කර්මාන්ත	500 0	750 0	1,000 0
34.	මෝටර් රථ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
35.	ලී මෝල්	500 0	750 0	1,000 0
36.	ගල් මෝල්	500 0	750 0	1,000 0
37.	රන් රිදී ලෝහ ආලේප කිරීම	500 0	750 0	1,000 0
38.	බිම්මල් වගාව	500 0	750 0	1,000 0

12 - 708/4

අතුරලිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ 01 වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා කිසියම් ව්‍යාපාරයක් අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කර ගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛන I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

	I වැනි තීරය *2023 වසරේ ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරය* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1.	රු. 6,001 - රු. 12,000	90 0
2.	රු. 12,001 - රු. 18,750	180 0
3.	රු. 18,751 - රු. 75,000	360 0
4.	රු. 75,001 - රු. 90,000	500 0
5.	රු. 90,001 - රු. 1,10,000	750 0
6.	රු. 1,10,001 - රු. 1,25,000	1,200 0
7.	රු. 1,25,001 - රු. 1,50,000	2,000 0
8.	රු. 1,50,000 ට වැඩි	3,000 0

උපලේඛනය

1. සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යාම
2. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
3. ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
4. අමුද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන පවත්වාගෙන යාම
5. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
6. ඉංග්‍රීසි බෙහෙත් අලෙවි මධ්‍යස්ථානයක් (ෆාමසි) පවත්වාගෙන යාම
7. ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8. උත්සව භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
9. උත්සව සඳහා පෝරු, සෙට් බැක් බදු දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. එළවළු / පළතුරු විකිණීම
11. කන්ටේනර් ප්‍රවාහනය කිරීම
12. කරවල විකිණීම
13. කරවල උම්බලකඩ අපනයනය කිරීම
14. කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම
15. කුරුඳු දර මිටි බැඳ විකිණීම
16. කුලී රථ සේවා ආයතනයක් පවත්වාගෙන යාම
17. කෘෂි උපකරණ විකිණීම
18. කෘෂි රසායනික ද්‍රව්‍ය විකිණීම
19. කිරි ආශ්‍රිත නිෂ්පාදන
20. ගල් වළක් පවත්වාගෙන යාම
21. ගෑස් විකිණීම
22. ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියාව
23. ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කර විකිණීම
24. ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය
25. ජංගම දුරකථන අලුත්වැඩියාව හා විකිණීම
26. ටයර් ටියුබ් විකිණීම
27. ට්‍රැක්ටර් අලුත්වැඩියාව
28. තනි මැෂිමෙන් ඇඳුම් මැසීම
29. දැන්වීම් පුවරු නිෂ්පාදන ආයතන
30. දැව ගබඩා කර විකිණීම
31. දැවමය ගෘහ භාණ්ඩ ගබඩා කර විකිණීම
32. ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම
33. නිමි ඇඳුම් කර්මාන්තය
34. නිවාස සැලසුම් ආයතන
35. පා පැදි විකිණීම
36. පා පැදි අලුත්වැඩියා
37. පාවහන් නිපදවා විකිණීම

38. පාසල් උපකරණ විකිණීම
39. පින්තූර රාමු කිරීම
40. පොල්තෙල් මෝල්
41. පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම
42. පොලිතීන් බෑග් නිෂ්පාදනය කර විකිණීම
43. බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන
44. බතික් ව්‍යාපාර
45. බයිට් වර්ග නිෂ්පාදනය
46. බහාලුම් ප්‍රවාහනය
47. බැංකු ආයතන
48. තැඹිලි හා තේ නිෂ්පාදනය
49. බිම්මල් නිෂ්පාදනය කර විකිණීම
50. බීම පැකට්, යෝගට්, ජෙලි, වටලප්පම් නිෂ්පාදනය හා අලෙවිය
51. බුලත්විට හා ටොෆි වර්ග විකිණීම
52. බේකරි ආශ්‍රිත කෑම අලෙවිය
53. මෙට්ට කවර, කොට්ට උර මසා විකිණීම
54. මෝටර් රථ හා ත්‍රී රෝද රථ අලුත්වැඩියාව
55. මෝටර් රථ හා ත්‍රී රෝද රථ සේවා ස්ථාන
56. යතුරු පැදි අළුත්වැඩියාව
57. යතුරු පැදි විකිණීම
58. යතුරු පැදි සේවා ස්ථාන
59. යතුරු පැදි හා ත්‍රී රෝද රථ සේවා ස්ථාන
60. රක්ෂණ ආයතන
61. රථ වාහන අමතර කොටස් අලෙවිය රථ වාහන විකිණීම
62. රස කැවිලි අලෙවි කිරීම
63. රසායනාගාර
64. රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
65. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
66. රෙදිපිළි වෙළඳාම
67. රේස් ඔට්ටුපොලවල් පවත්වාගෙන යාම
68. ලී කැටයම්
69. ලොතරැයි අලෙවි කිරීම
70. ලොරි බොඩි නිෂ්පාදනය
71. වාහන පින්තාරු කිරීම
72. වැල්ඩින් වැඩපලක්
73. විදුලි උපකරණ අළුත්වැඩියාව
74. විදුලි කාර්මික වැඩපලක්
75. විදුලි උපකරණ විකිණීම
76. විසිතුරු මසුන් අලෙවිය
77. සංගීත භාණ්ඩ නිෂ්පාදනයට සම් සැපයීම
78. සංගීත භාණ්ඩ බදු දීම
79. සංචාරක තේ කුඩු, කුළු බඩු අලෙවිය
80. සත්ත්ව ආහාර විකිණීම
81. සම්ප්‍රේෂණ කුළුණු
82. ස්වර්ණාභරණ නිෂ්පාදනය හා විකිණීමේ ස්ථාන
83. සාප්පු බඩු අලෙවි සැළක් පවත්වාගෙන යාම
84. සුපිරි වෙළඳසැළක් පවත්වාගෙන යාම
85. සුළු බෝග අපනයනය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
86. සුවඳ විලවුන් විකිණීම
87. හඳුන්කුරු පස් පංගුව විකිණීම
88. වටලප්පන් නිෂ්පාදනය හා විකිණීම
89. ෆයිබර් ග්ලාස් අලුත්වැඩියාව
90. කුලී රථ සේවා

91. පොප්කෝන් විකිණීම
92. ඇලුමිනියම් නිෂ්පාදන
93. පොලිතීන් බෑග් නිෂ්පාදනය හා අලෙවිය
94. තැඹිලි විකිණීම
95. වාහන පින්තාරු කිරීම
96. වානේ ගෘහ භාණ්ඩ අලෙවිය
97. සාරි විකිණීම
98. විසිතුරු මල් වගාව හා අලෙවිය
99. මල් පැල තවාන්
100. ප්ලාස්ටර්ඔෆ්පැරිස් බුදු පිළිම නිෂ්පාදනය හා අලෙවිය
101. බැංකු ඒ.ටී.එම්. යන්ත්‍ර සඳහා
102. බැංකු උකස් අංශය සඳහා

12 - 708/5

අතුරලිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

ප්‍රචාරක දැන්වීම් - දෘශ්‍ය පරිසරය - 2024

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (ආ) හා 122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV (අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 2006.10.05 වැනි දින අංක 1466 *ගැසට්* පත්‍රයේ නිවේදනයක් මගින් අතුරලිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර, අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ අතුරලිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුලුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2024.01.01 වැනි දින සිට පනවා අය කරනු ලබන බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් විස්තරය

01. පෞද්ගලික පරිශ්‍රයේ ඉදිකරනු ලබන හෝ මහා මාර්ගයට පෙනෙන පරිදි අවකාශීය ඉඩකඩ භාවිතා කරමින් මහා මාර්ගයට යාබද ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන,

		රු. ශත
(i)	පුවරු සඳහා වර්ෂයකට වර්ග අඩි එකක මිල	60 0
(ii)	බැනර්/කටවුට් සඳහා වර්ෂයකට වර්ග අඩි එකක මිල	25 0

02. පළාත් පාලන ආයතන පරිශ්‍රයන් ප්‍රයෝජනයට ගනිමින් ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන පුවරු සඳහා

(i)	පුවරු සඳහා වර්ෂයකට වර්ග අඩි එකක මිල	100 0
(ii)	බැනර්/කටවුට් සඳහා වර්ෂයකට වර්ග අඩි එකක මිල	40 0

12 - 708/6

අතුරලිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට කසල ශෝධන ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සහ 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 දින 520/7 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාව 2016.10.05 වැනි දින අතුරලිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර ඒ අනුව කසල ශෝධන අතුරු ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

		රු. ශත
01.	ගෘහස්ථ ස්ථානයක් සඳහා මාසික ගාස්තුව	100 0
02.	ව්‍යාපාරික ස්ථානයක් සඳහා මාසික ගාස්තුව	500 0

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 708/7

අතුරලිය ප්‍රාදේශීය සභාව

වෙනත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් අතුරලිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2024 ජනවාරි 01 වැනි දින සිට අයකිරීම සුදුසු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		රු. ශත
01.	ඔප්පු සාරාංශ අයදුම් පත්‍ර ගාස්තු	250 0
02.	ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තු	500 0
03.	ඉඩම් අනුබෙදුම් අයදුම් පත්‍රයක් සඳහා ගාස්තු	300 0
04.	අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු	500 0
05.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	250 0
06.	අනුකූලතා සහතික අයදුම් පත්‍ර ගාස්තු	250 0
07.	වරිපනම් සහතික නිකුත් කිරීමේ ගාස්තු	100 0
08.	වරිපනම් ලේඛනයේ උධෘත පිටපතක් නිකුත් කිරීමේ ගාස්තු (එක් වර්ෂයක ලේඛන වෙනුවෙන්)	100 0

		රු. ශත
09.	පරිසර බලපත්‍ර අලුතින් අයදුම් කිරීමේ පෝරම ගාස්තු	200 0
10.	පරිසර බලපත්‍ර අළුත් කිරීමේ පෝරම ගාස්තු	100 0
11.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු	25 0
12.	පුස්තකාල සාමාජික ඇප තැන්පත්	100 0
13.	තාවකාලික ගව ඝාතක අවසරපත්‍ර ගාස්තු (එක් ගවයෙකු සඳහා)	500 0
14.	ට්‍රැක්ටර් ජල බවුසරය සඳහා	1,500 0
15.	ජලය සමඟ ට්‍රැක්ටර් ජල බවුසරය සඳහා	1,800 0
16.	ට්‍රැක්ටර් ජල බවුසරය සඳහා ප.ව. 7.00 සිට පෙ.ව. 6.00 දක්වා අදාළ ස්ථානයේ නවතා තබා ගැනීමට අදාළ වන ගාස්තු	500 0
17.	ට්‍රක් ජල බවුසරය සඳහා	3,000 0
18.	ජලය සමඟ ට්‍රක් ජල බවුසරය සඳහා	3,600 0
19.	ට්‍රැක්ටර් ජල බවුසරය/ට්‍රක් ජල බවුසරය ප්‍රවාහනයේ දී මුල් 1km සඳහා මුදල	300 0
20.	දෙවන කිලෝමීටරයේ සිට වැඩිවන සෑම කිලෝ මීටර් එකකටම	100 0
21.	ජල ටැංකි බදු දීම ලීටර 1000 දිනක් සඳහා	300 0
22.	ජල ටැංකි බදු දීම ලීටර 2000 දිනක් සඳහා	500 0
23.	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සඳහා පැයකට බල ප්‍රදේශය තුළ අය කරනු ලබන ගාස්තුව	7,000 0
24.	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සඳහා පැයකට බල ප්‍රදේශය පිටත අය කරනු ලබන ගාස්තුව	8,000 0
25.	බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා පැයකට බල ප්‍රදේශය තුළ අය කරනු ලබන ගාස්තුව	5,500 0
26.	බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා පැයකට බල ප්‍රදේශය පිටත අය කරනු ලබන ගාස්තුව	6,500 0
27.	තිබ්බොටුවාව පොදු වෙළෙඳ සංකීර්ණයේ ඉහළ මහලය බදු දීම රාජ්‍ය නොවන ආයතන සඳහා දිනකට අදාළ ගාස්තුව	3,000 0
28.	තිබ්බොටුවාව පොදු වෙළෙඳ සංකීර්ණයේ ඉහල මහලය බදු දීම රාජ්‍ය ආයතන සඳහා දිනකට අදාළ ගාස්තුව	
29.	තිබ්බොටුවාව පොදු වෙළෙඳ සංකීර්ණයේ පොළ භූමිය බදු දීමට අදාළ ගාස්තුව	1,500 0
	වර්ග අඩියට	20 0
30.	වර්ෂ 03ක් සඳහා බලපත්‍ර ගාස්තු දූනට පරිසර අනුමැතිය ලබාගත් කර්මාන්ත සඳහා (10% ක මුද්දර ගාස්තු අය විය යුතුය)	4,500 0

පරිසර බලපත්‍ර සම්බන්ධ පරීක්ෂණ ගාස්තු

මූලික මුළු ආයෝජනය (රුපියල්)	*ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු (පවතින වටිනාකම)*
250,000 ට අඩු	රු. 3,000 + රජයේ අනුමත බදු
250,001 සිට 500,000 දක්වා	රු. 3,750 + රජයේ අනුමත බදු
500,001 සිට 1,000,000 දක්වා	රු. 5,000 + රජයේ අනුමත බදු
1,000,001 ට වැඩි	රු. 10,000 + රජයේ අනුමත බදු

නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය තුළ අය කළ යුතු පෙරසැරි ගාස්තු (එක් බිම් කට්ටියක් සඳහා)

බිම් කට්ටියක ප්‍රමාණය (පර්චස් වලින්)	*කැබලි 1 සඳහා ගාස්තුව (රු)*
6 - 12	1,000 0
13 - 24	800 0
25 - 36	600 0
36 ට වැඩි 500	500 0

මායිම් තාප්ප/රැඳවුම් වැටි ඉදිකිරීම - දික් මීටර් 01 ක් සඳහා රු. 100.00
සන්නිවේදන කුළුණු සඳහා රු. 40,000.00

නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය තුළ අය කළ යුතු පෙරසැරි ගාස්තු (ගොඩනැගිලි අනුමත කිරීම සඳහා)

ගෙබිම් ප්‍රමාණය	නේවාසික (ව.මීටර් 1 කට) රු.	නේවාසික නොවන (ව.මීටර් 1 කට) රු.
ව.මී. 400 දක්වා	20 0	25 0
ව.මී. 400-1000 දක්වා	22 0	27 0
ව.මී. 1001-1500 දක්වා	25 0	30 0
ව.මී. 1501-2000 දක්වා	25 0	32 0
ව.මී. 2000 වැඩි	වැඩිවෙන සෑම ව.මී. 90 සඳහාම රු. 2,000.00 බැගින්	වැඩිවෙන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 2,000.00 බැගින්

නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයෙන් පිටත අයකළ යුතු පෙරසැරි ගාස්තු

නාගරික සංවර්ධන බල ප්‍රදේශයෙන් පිටත අනුකූලතා සහතික නිකුත් කිරීම :

ගොඩනැගිලි සඳහා	රු. 1,000 0
ඉඩම් කැබැල්ලක් සඳහා	රු. 500 0

නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයෙන් පිටත අයකළ යුතු පෙරසැරි ගාස්තු (ගොඩනැගිලි අනුමත කිරීම සඳහා)

ගෙබිමේ විශාලත්වය (වර්ග මීටර්)	ගොඩනැගිලි ඉදිකිරීම / කොටසක් එකතු කිරීම / නැවත ඉදිකිරීම සඳහා	
	පදිංචිය සඳහා (රු,)	වාණිජ හෝ වෙනත් (රු)
45 ට අඩු	500 0	1,000 0
46 - 90	1,500 0	2,000 0
91 - 180	2,500 0	3,000 0
181 - 270	3,500 0	4,000 0
271 - 450	4,500 0	6,000 0
451 - 675	5,500 0	8,000 0
676 - 900	6,500 0	10,000 0
901 - 1225	7,500 0	12,000 0

නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයෙන් පිටත අයකළ යුතු පෙරසැරි ගාස්තු (එක් බිම් කට්ටියක් සඳහා)

බිම් කට්ටියක ප්‍රමාණය (පර්චස් වලින්)	කැබලි 1 සඳහා ගාස්තුව (රු.)
6 - 12	500 0
13 - 24	400 0
25 - 36	500 0
37 සිට රූඩ් 02 දක්වා	600 0
රූඩ් 03 සිට අක්කර 01 දක්වා	1,000 0
අක්කර 01 සිට අක්කර 05 දක්වා	1,500 0
අක්කර 06 සිට අක්කර 10 දක්වා	2,000 0

නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයෙන් පිටත දූනට අවසර පත්‍රයක් ලබා නොගෙන කරඇති ඉදිකිරීම් සඳහා මුදල් අය කිරීම

ගෙබිමේ විශාලත්වය ව.මී.	*දූනට අවසර පත්‍රයක් ලබා නොගෙන කර ඇති ඉදි කිරීම් සඳහා*	
	නේවාසික රු. ශත.	*වානිජ හෝ වෙනත් ශාරීරික රු. ශත.*
45 ට අඩු	1,000	2.000
46 - 90	3,000	4,000
91 - 180	5,000	6,000
181 - 270	7,000	8,000
271 - 450	9,000	12,000
451 - 675	11,000	16,000
676 - 900	13,000	20,000
900 - 1225	15,000	24,000
1225 ට වැඩි	15,000	24,000

12 - 708/8

අතුරලිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වැනි වගන්තිය ප්‍රකාර පරිදි අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් අතුරලිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-708/9

අතුරලිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට විනෝද බදු අය කිරීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ අංක 2 (1) වැනි වගන්තිය ප්‍රකාරව, අතුරලිය ප්‍රාදේශීය සභා පරිපාලන බල ප්‍රදේශය තුළ විනෝද බදු පනවා 2024.01.01 සිට අය කිරීමට සුදුසු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

සංගීත සංදර්ශන සඳහා අය කළ යුතු බදු මුදල් ප්‍රතිශතය	10%

12 - 708/10

අතුරලිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා වන ගාස්තු

අතුරලිය ප්‍රාදේශීය සභාවේ නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ ඉඩම් හා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා අය කරනු ලබන ගාස්තු පහත උපලේඛනයේ පරිදි 2024 ජනවාරි 01 වැනි දින සිට අය කිරීම සුදුසු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා වන මා විසින් 2023.11.07 දින තීරණ අංක 2023/11/07/826 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජේ. පී. වී. එම්. ජී. ජී. ද අල්මේදා,
ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2023 නොවැම්බර් මස 07 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා වන ගාස්තු
(රෙගුලාසි 1, 3, 5, 28, 30, 44, 73, 82, 83, 85, 91, 96, 105)

මූලික සැලසුම් නිරාකරණය, නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහාවන ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*පෙරසැරි ගාස්තු (බදු රහිත)*	
1. ඉඩම් අනුබෙදුම් කිරීම	ඉඩමේ ප්‍රමාණය (ව. මී)	ගාස්තුව (රුපියල්)
	i. ව. මී. 150 - ව. මී 500	රු. 2,000
	ii. ව. මී. 501 - ව. මී 1000	රු. 3,000
	iii. ව. මී. 1001 - ව. මී 5000	රු. 7,500
	iv. ව. මී. 5001 - ව. මී 10000	රු. 10,000
	v. ව. මී. 10001 ට වැඩි	රු. 10,000 + ව.මී. 10,000 ට වැඩි සෑම ව.මී. 1,000 කට හෝ ඉන් කොටසකට රු. 1,000 බැගින්
2. කුඹුරු ඉඩම් සහ පහත් බිම් ගොඩකිරීම.	i. ව. මී. 250 දක්වා	රු. 2,500
	ii. ව. මී. 250 ට වැඩි	රු. 2,500 + ව. මී. 250 ට වැඩි සෑම ව.මී. 100 කටම හෝ ඉන් කොටසකටම රු. 2.500/- බැගින්
3.1 මායිම් තාප්ප/ රැඳවුම් බැම් ඉදිකිරීම	දික් මීටර් 1 කට	රු. 100/-
3.2 අත්තිවාරමක් සහිත මායිම් වෙන්කිරීම	දික් මීටර් 1 කට	රු. 50/-
4. සංනිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදිරිකිරීම	රු. 30,000/-	

මූලික සැලසුම් නිරාකරණය, නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහාවන ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*පෙරසැරි ගාස්තු (බදු රහිත)*	
5. ඉන්ධන පිරවුම්හල්/සේවා ස්ථාන	i. දුම් පරීක්ෂා කරන ස්ථාන	රු. 25,000/-
	ii. ඉන්ධන පිරවුම්හල්	රු. 75,000/-
	iii. වාහන සේවා ස්ථාන	රු. 50,000/-
	iv. වාහන සේවා ස්ථාන හා දුම් පරීක්ෂාව	රු. 75,000/-
	v. ඉන්ධන පිරවුම්හල් හා ඒ සම්බන්ධ වෙනත් භාවිතයන්	රු. 150,000/-
6. දැන්වීම් පුවරු	i. ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී. 1කට)	රු. 5,000/-
	ii. ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (ව.මී 1 කට)	රු. 3,000/-
	iii. නාම පුවරු (ව.මී 1 කට)	රු. 1,000/-
	iv. මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (Gentries) (ව.මී 1 කට)	රු. 6,000/-
7. කසල රැස් කිරීමේ අංගන / බැහැර කරන ස්ථාන/ කොම්පෝස්ට් අංගන / සෞඛ්‍ය ආරක්ෂිතව කසළ යොදා ඉඩම් ගොඩකිරීම හා අදාළ වෙනත් සංවර්ධන කටයුතු.	i. භූමි ප්‍රමාණය වර්ග මීටර 4000 දක්වා	රු. 50,000/-
	ii. භූමි ප්‍රමාණය වර්ග මීටර 4000 ට වඩා වැඩි	රු. 50,000/- + වැඩිවන සෑම වර්ග මී. 4000 ට ම හෝ ඉන් කොටසකට ම රු. 10,000/- බැගින්
8. ජලය ආශ්‍රිත ගොඩනැගිලි සහ ජලය ආශ්‍රිත සංවර්ධනයන්		රු. 50,000/-
9. වාණිජ පරමාර්ථයෙන් කරනු ලබන කළුගල් කැඩීම, ගල් කුඩු කිරීමේ අංගන, පස් කැපීම, පස් සෝදු වැලි ගැනීම, ගොඩ වැලි කැනීම, මැටි හා බොරළු කැණීම		රු. 10,000/-
10. i. බණිජ සම්පත් කැණීම සඳහා කරනු ලබන පරීක්ෂණ	i. වර්ග කිලෝමීටර් 1 ක් දක්වා	රු. 100,000/-
	ii. වර්ග කිලෝමීටර් 01 ට වැඩි	රු. 100,000/- + වර්ග කිලෝමීටර 1 ට වැඩි වන සෑම වර්ග කිලෝමීටර් 1 ට හෝ ඉන් කොටසකටම රු. 10,000/- බැගින්
	i. වර්ග කිලෝමීටර් 1 ක් දක්වා	රු. 100,000/-
ii. ඉහත අංක 10(i) ට අමතරව සිදුකරන වෙනත් ඛනිජ සම්පත් කැණීම්	ii. වර්ග කිලෝමීටර් 01 ට වඩා වැඩි	රු. 100,000/- + වර්ග කිලෝමීටර් 1 වැඩිවන සෑම වර්ග කිලෝමීටර් 01 ට හෝ ඉන් කොටසකටම රු. 10,000/- බැගින්

මූලික සැලසුම් නිරාකරණය, නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහාවන ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*පෙරසැරි ගාස්තු (බදු රහිත)*	
11. ළමා නිවාස/ වැඩිහිටි නිවාස/ පුනරුත්ථාපන මධ්‍යස්ථාන	ඉඩමේ ප්‍රමාණය	ගාස්තුව
	i. ච.මී. 400 දක්වා	රු. 2,500/-
	ii. ච.මී. 401 - ච.මී. 500	රු. 5,000/-
	iii. ච.මී. 501 - ච.මී. 750	රු. 10,000/-
	iv. ච.මී. 751 - ච.මී. 1000	රු. 20,000/-
	v. ච.මී. 1000 ට වැඩි	රු. 20,000/- + ච.මී. 1000 වැඩි වන සෑම ච.මී. 100 ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු. 500/- බැගින්
	ගෙබිම් ප්‍රමාණය	*ගාස්තුව*
12. ඉහත 1 සිට 11 දක්වා සඳහන් නොවන වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා	i. ච.මී. 400 දක්වා	රු. 5,000/-
	ii. ච.මී. 401 - ච.මී. 500	රු. 10,000/-
	iii. ච.මී. 501 - ච.මී. 750	රු. 25,000/-
	iv. ච.මී. 751 - ච.මී. 1000	රු. 50,000/-
	v. ච.මී. 1001 ට වැඩි	රු. 50,000/- + ච.මී. 1000 වැඩි වන සෑම ච.මී. 100 ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු. 500/- බැගින්
13. ගෙබිම් ප්‍රමාණය වෙනස් නොවී අනුමත සැලැස්මේ සිදු කරනු ලබන අභ්‍යන්තර වෙනස් කිරීම්	වර්ග මීටර් 1000 ක් දක්වා වර්ග මීටර් 1000 ට වැඩි	රු. 5,000/- රු. 10,000/-
14. රථවාහන ඇගයීම් වාර්තාව සඳහා වන නිරවුල් සහතිකය (Traffic Impact Assessment Clearance)	රු. 60,000/-	
15. පාරිසරික ඇගයීම් වාර්තාව සඳහා වන නිරවුල් සහතිකය	ECC - රු. 50,000/-	EIA - රු. 150,000/-
16. මූලික සැලසුම් නිරාකරණය අලුත් කිරීම	i. වසරක වලංගු කාලය ඉක්මවීමට පෙර අයදුම් කරන්නේ නම් මූලික සැලසුම් නිරාකරණ සහතිකය සඳහා ගෙවූ මුදලින් 25% ක මුදලක් ii. වසරක වලංගු කාලය ඉක්මවා ගොස් වසරක් තුළ අයදුම් කරන්නේ නම් - මූලික සැලසුම් නිරාකරණ සහතිකය සඳහා ගෙවූ මුදලින් 50% ක මුදලක් iii. වසරක වලංගු කාලය ඉක්මවීමෙන් පසු අයදුම් කරන්නේ නම් - මූලික සැලසුම් නිරාකරණය සඳහාවන සම්පූර්ණ ගාස්තුව	
17. මූලික සැලසුම් නිරාකරණ සහතිකයේ සහතික කරන ලද පිටපත් සඳහා	රු. 10,000/-	
18. මූලික සැලසුම් නිරාකරණය වෙනත් පාර්ශවයකට පැවරීම	රු. 25,000/-	

මූලික සැලසුම් නිරාකරණය, නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහාවන ගාස්තු	
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*පෙරසැරි ගාස්තු (බදු රහිත)*
19. කඩිනම් සේවය - (සියලුම අවශ්‍යතා හා අදාළ අනෙකුත් ලේඛන සම්පූර්ණ කරන ලද දින සිට වැඩ කරන ලද දින 07 ක් තුළ)	සාමාන්‍ය ගාස්තුව මෙන් හතර ගුණයක් අය කළ යුතු වේ.
20. පරිපාලන වියදම්	රු. 5,000/-
21. ආගමික කටයුතු හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිවලට අදාළ ගාස්තු	රු. 5,000/- ක පරිපාලන ගාස්තුවකට යටත් වේ.

සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහාවන පෙරසැරි ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු	
1. ඉඩම් අනුබෙදුම් සඳහා	ඉඩමේ ප්‍රමාණය ව. මී.	පෙරසැරි ගාස්තු
	ව. මී. 150 - ව. මී 300	කැබලි 1ක් සඳහා රු. 1,000
	ව. මී. 301 - ව. මී 600	කැබලි 1ක් සඳහා රු. 800
	ව. මී. 601 - ව. මී 900	කැබලි 1ක් සඳහා රු. 600
	ව. මී. 900ට වැඩි	කැබලි 1ක් සඳහා රු. 500
2. මායිම් තාප්ප/රැඳවුම් බැමි ඉදිකිරීම	දික් මීටර් 1ක් සඳහා	රු. 100
3. සන්නිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම	රු. 40,000	
4. ඉන්ධන පිරවුම්හල්/ වාහන සේවා ස්ථාන/දුම් පරීක්ෂා කරන ස්ථාන	ව.මී. 1 කට	රු. 100/-
5. දැන්වීම් පුවරු	i. ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී. 1 කට)	රු. 2,500/-
	ii. ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (ව.මී. 1 කට)	රු. 1,500/-
	iii. නාම පුවරු (ව.මී 1 කට)	රු. 500/-
	iv. මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (Gentries) (ව.මී. 1 කට)	රු. 1,000/-

<table>
<tr><td colspan="5">සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහාවන පෙරසැරි ගාස්තු</td></tr>
<tr><td>සංවර්ධන කාර්යයේ ස්වභාවය</td><td colspan="4">අයකළ යුතු ගාස්තු</td></tr>
<tr><td>6. කසල බැහැර කිරීමේ අංගන/තාවකාලිකව රැස්කර තබන ස්ථාන/ කොම්පෝස්ට් අංගන/ සෞඛ්‍යාරක්ෂිතව කසල යොදා ඉඩම් ගොඩකිරීම</td><td colspan="2">හෙක්. 1 දක්වා</td><td colspan="2">රු. 25,000/-</td></tr>
<tr><td></td><td colspan="2">හෙක්. 1 ට වැඩි</td><td colspan="2">රු. 25,000/- + වැඩිවන සෑම හෙක් 1 කට හෝ ඉන් කොටසක් සඳහා රු. 5,000/- බැගින්</td></tr>
නිකුත් කිරීමේ දී හා සේවා පහසුකම් සැපයීමේ දී 2024 වර්ෂයට පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීම සඳහා සභාවට යෝජනා කරන්නීය :

උපලේඛනය

අනු අංකය	*විස්තරය*	*රු. ශත*
01	වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ දී අය කරන ලද ගාස්තුව	2,500 0
02	සභාවෙන් අවසර ලබා දී ඇති අංක 01 සිට 07 දක්වා ඇති මාළු ලෑලි සඳහා අනුපිලිවෙලින් මසකට අය කරන මුදල අංක 01 මාළු ලෑල්ල සඳහා රු. 6,000 ක් ද, අංක 02 මාළු ලෑල්ල රු. 5,000 ක් ද මාළු ලෑලි අංක 03 සිට 07 දක්වා මාළු ලෑලි සඳහා රු. 500.00 බැගින් අඩු වීමේ පදනම මත	6,000 0 5,000 0 4,500 0 4,000 0 3,500 0 3,000 0 2,500 0
03	තක්සේරු බදු ලේඛනයේ අයිතිවාසිකම් ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඔප්පු සංක්ෂිප්ත විස්තරය ඇතුළත් අයදුම් පත්‍ර ගාස්තුව	500 0
04	ගොඩනැගිලි සංවර්ධන කාර්යය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේදී අය කරනු ලබන ගාස්තුව	600 0
05	ඉඩමක් අනු කොටස්වලට බෙදීමේදී ඒ සඳහා වූ අයදුම්පත්‍ර ගාස්තු	500 0
06	ව්‍යාපාර, සංදර්ශන, සැනකෙළි කටයුතු සඳහා බඩල්කුඹුර ක්‍රීඩා පිටිය බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව	7,500 0
07	ක්‍රීඩාගාරය දිනකට අයකරන ගාස්තුව	2,500 0
08	ක්‍රීඩා කටයුතු සඳහා බඩල්කුඹුර ක්‍රීඩාපිටිය බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව	5,000 0
09	බඩල්කුඹුර නගරයේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා 15'x30' භූමි කොටසක් බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව	4,000 0
10	බඩල්කුඹුර නගරයෙන් පිටත අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා 15'x30' භූමි කොටසක් බදු දීමේදී දිනකට අයකරන ගාස්තුව	2,000 0
11	බඩල්කුඹුර ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටිය, ක්‍රීඩාගාරය සමග ලබා දීම එක් දිනක් (ක්‍රීඩාගාරය සඳහා අදාළ විදුලි ගාස්තු ගෙවීම)	7.000 0
12	ගැල්වනයිස් බටයක් ලබා දීම සඳහා	30 0
13	එක් ජල බවුසරයක් ලබා දීම වරිපනම් (සීමාව තුළ)	2.000 0
14	එක් ජල බවුසරයක් වරිපනම් බදු අයකරන සීමාවෙන් පිටත ලබා දීම - ධාවනය වන කි. මී. 01 ට	2,000 0 600 0
15	ජල බවුසරයක් රඳවා ගැනීමේ ගාස්තු එක් දිනක් සඳහා වරිපනම් බදු සීමාව - වරිපනම් බදු සීමාවෙන් පිටත	1,000 0 1,500 0
16	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය ලබා දීම (ක්‍රියාකරු සමග/ඉන්ධන නොමැතිව) දිනකට	4,000 0
17	JCB රථය ක්‍රියාකරවීම සඳහා (ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) පැයකට	5,500 0

අනු අංකය	*විස්තරය*	*රු. ශත*
18	ටිපර් රථය 0-5 (ගමන් කරන පළමු කි. මී. 5 සඳහා එක් කිලෝමීටරයකට ගාස්තුව (මෙයින් දෙපසට ගමන් කරන දුර ගණනය කරනු ලැබේ.) සෑම කි. මී. 01කට රු. 500 0 ක මුදලක් අය කිරීම (500x5) කිලෝමීටර් 05ට වැඩි (එක් කි. මී. සඳහා)	2,500 0 1,000 0
19	දීර්ඝ කාලීනව රථවාහන බදු දීමේදී මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ තීරණය මත හා සභා තීරණය මත මිල ගණන් වෙනස් කළ හැකි වේ.	
20	වයිබ්‍රේටින් රෝලර් (ඉන්ධන සහිතව) පැයකට	5,000 0
21	රැස්වීම් ශාලාව වෙන් කිරීම (පැයකට)	1,500 0
22	රැස්වීම් ශාලාව ව්‍යාපාර කටයුත්තක් සඳහා දිනකට ඇප තැන්පත් මුදල එම කටයුත්ත සඳහා දිනකට අය කිරීම	10,000 0 2,500 0
23	සියලුම ඛනිජ (වැලි, ගල්, පස්, ෆෙල්ස්පාර්, ග්‍රැවල්) කියුබ් 01ක් ප්‍රවාහනය සඳහා	200 0
24	දූව ලොරියක් ප්‍රවාහනය සඳහා	5,000 0
25	කටුගහගල්ගේ වැව ආශ්‍රිතව - * උද්‍යානය සඳහා ඇතුළත් වීමේ ගාස්තු (වැඩිහිටි/ළමා) * අවුරුදු 05ට අඩු ළමයින් සඳහා අය කිරීමක් නොමැත * හංස බෝට්ටුව දෙදෙනෙකු සඳහා විනාඩි 20කට * මංගල අවස්ථාවක දී ඡායාරූප ගැනීම සඳහා * මංගල අවස්ථාවක දී වැව් භූමිය, බෝට්ටු සවාරිය හා ඡායාරූප ගැනීම සඳහා * හංස බෝට්ටුව සඳහා විදේශිකයින් 01 (එක) පුද්ගලයෙකු සඳහා * විදේශිකයින් 01 (එක) පුද්ගලයෙකු වැවට ඇතුල්වීම සඳහා * වෙනත් උත්සව සඳහා පැයකට අය කිරීම	20 0 - 500 0 5,000 0 10,000 0 1,000 0 500 0 1.500 0
26	වරිපනම් නාම සංශෝධන ගාස්තු	500 0
27	බඩල්කුඹුර නගරයේ පොදු වැසිකිලිය සඳහා සේවා ගාස්තු එක් අයෙකුගෙන් එක් වරකට	20 0
28	කටුගහගල්ගේ වැව් පරිශ්‍රයේ ඉදිකර ඇති වැසිකිලි සඳහා සේවා ගාස්තු එක් අයකුගෙන් එක් වරකට (පිටස්තර අයගෙන්)	30 0
29	ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් සඳහා අයදුම්පත්‍ර ගාස්තු පෙර පාසල් මාසික ගාස්තු	1,000 0 500 0
30	ප්‍රාදේශීය සභාවට අයත් අතුරු මාර්ග හා පවරා ගෙන ඇති අතුරු මාර්ග පලුදු කිරීම් වෙනුවෙන් වර්ග මීටර් 01කට අය කිරීම පස් කොන්ක්‍රීට් තාර කාපට්	 2,500 0 6,000 0 8,000 0 12,500 0
31	වරිපනම් ලේඛනයේ උද්ෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව	500 0
32	ගෝඝාතක ආඥාපනත යටතේ ආගමික උත්සව හා වෙනත් උත්සවයන් සඳහා ගවයකු ඝාතනය කිරීමේ තාවකාලික බලපත්‍ර ගාස්තු ගෝඝාතක අයදුම්පත්‍ර ගාසතු	4,000 0 500 0
33	ගවමස් ප්‍රවාහනය කිරීමේ තාවකාලික බලපත්‍ර ගාස්තු	10,000 0

අනු අංකය	*විස්තරය*	*රු. ශත*
34	පරිසර ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්ත වසර 03ක වලංගු කාලය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පරීක්ෂණ ගාස්තු - අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපෘතියේ මූලික ප්‍රාග්ධන අයෝජනය පදනම් කොටගෙන නිශ්චය කරනු ලැබේ. *ආයෝජනය* — *පරීක්ෂා කිරීමේ ගාස්තු* 1,000,000 ට වැඩි — 8,000.00 500,001 - 1,000,000 — 4,000.00 250,001 - 500,000 — 3,000.00 100,000 - 250,000 — 750.00 100,000 ට අඩු — 400.00	200 0 100 0 4,500 0 3,000 0
35	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු පුස්තකාල සාමාජික ගාස්තු පුස්තකාල ප්‍රමාද දඩ මුදල් එක පොතක් සඳහා දිනකට නැතිවූ පොත් සඳහා අය කිරීම - පොතේ මිල, 25% දෙපාර්තමේන්තු ගාස්තු, ප්‍රමාද ගාස්තු, රෙජිස්ටර් ගාස්තු වර්ණ පින්තූරයක මුද්‍රිත පිටපතක් ලබා ගැනීම සඳහා (A4x1 තනි පැත්තක්) (A3x1 තනි පැත්තක්) අකුරු මුද්‍රණය කරන ලද මුද්‍රිත පිටපතක් සඳහා (A4x1 තනි පැත්තක්) (A3x1 තනි පැත්තක්)	2 0 100 0 5 0 60 0 100 0 30 0 50 0
36	තිරුවානා ගල් විකිණීම කිලෝග්‍රෑම් 1ක් සඳහා	3 0 - 5 0
37	එළිමහන් LED වීඩියෝපටයක් ප්‍රචාරය කරවා ගැනීම සඳහා අදාළ දැන්වීම ප්‍රචාරනය වන මිනිත්තු ගණන, දවසේ ප්‍රචාරනය වන වාර ගණන හා ප්‍රචාරනය වන කාලය අනුව අය කරන අවම මුදල රු. 5,000.00 (කමිටුව මඟින් මිල ගණන් තීරණය වේ.)	5,000 0

12 - 768/8

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දීමට අදාළ ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී යෝජනා අංක 09 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. පී. ඉනෝකා,
සභාලේකම්.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදු 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව පිළිගෙන 2014 අගෝස්තු මස 01 වැනි දින අංක 1874 දරන පළාත් සභා *ගැසට් පත්‍රයේ* දැන්වීමක් පළකර ඇත. ඉහත සඳහන් දැන්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා අනුව බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා පහත සඳහන් උපලේඛනයේ ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනයේ II වන කොටස

අවසර පත්‍රය සඳහා අයකරන ගාස්තු පැනවීම

අනු අංකය	*ප්‍රචාරක දැන්වීම් විස්තරය*	*2023 වර්ෂයේ අවසර පත්‍රය සඳහා අයකරන ගාස්තු*		
		දින 01 සිට දින 15 දක්වා	*දින 15 සිට දින 30 දක්වා*	*මාසයක කාලයකට වැඩි හෝ වර්ෂයක කාලයක් සඳහා*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බිත්තියක හෝ තාප්පයක ප්‍රදර්ශනය කරන එක් හතරැස් අඩියකට (චිත්‍රපටි පෙන්වීම සම්බන්ධ දැන්වීම නොවන)	20 0	40 0	50 0
02.	පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා	50 0	75 0	150 0
03.	යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවි කොට ඇති දැන්වීමක් සඳහා වර්ග අඩියකට (වෙළෙඳ ව්‍යාපාර සඳහා භාවිතා කරන වාහන සඳහා අදාළ නොවේ.)	15 0	30 0	50 0
04.	චිත්‍රපට පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට	10 0	15 0	20 0
05.	ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට	30 0	50 0	75 0
06.	දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන විද්‍යුත් ප්‍රචාරක එම පුවරුවක් සඳහා වර්ග අඩියකට	50 0	100 0	250 0

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කසල ඉවත් කිරීම පිළිබඳ ගාස්තු පැනවීමේ යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී යෝජනා අංක 10 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. පී. ඉනෝකා,
සභාලේකම්.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් උඟව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් සාදු අංක 1816/43 හා 2013 ජූනි 28 වැනි දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කසළ ශෝධන අතුරු ව්‍යවස්ථා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගෙන අංක 1901/15 හා 2015 පෙබරවාරි මස 11 වැනි දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටස දැන්වීමක් පළ කර ඇත. කසළ ශෝධන අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි උපවගන්තියේ මෙම අතුරු ව්‍යවස්ථාව බලපැවැත්වෙන බල ප්‍රදේශය වශයෙන්,

(1) බඩල්කුඹුර ග්‍රාම නිලධාරී වසම

ලෙසටත් පහත සඳහන් 2 වැනි උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

2 වන උපලේඛනය

කසළ ඉවත් කිරීම සඳහා වූ ගාස්තු	*ගාස්තු රු. ශත*
වරිපනම් සීමාව තුළ සියලුම වාණිජ හා දේපල පවත්වාගෙන යන ස්ථානවලින් කාර්තුවකට අයකරන ගාස්තුව	500 0

12-768/10

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පීඩාකාරී හා අන්තරායක ව්‍යාපාර සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී යෝජනා අංක 11 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. පී. ඉනෝකා,
සභාලේකම්.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් උඟව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදු 2013 ජූනි මස 28 වැනි දින අංක 1816/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති පීඩාකාරී හා අන්තරායක වෙළෙඳාම පිළිබඳව අතුරු ව්‍යවස්ථා බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 2015.02.11 වැනි දින අංක 1901/15 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති දැන්වීම හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු පනතේ 147 වැනි වගන්තිය යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් පහත අංක 01 උපලේඛනය පීඩාකාරී කර්මාන්ත හා අංක 02 උපලේඛනයේ අන්තරායක කර්මාන්ත සඳහා එම උපලේඛනවල සඳහන් බලපත්‍ර ගාස්තුවක් අයකළ යුතු බව බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛන අංක 01

අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු.750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	කුකුළන් 50ට වැඩි කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
02	ඌරන් 05ට වැඩි ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
03	යෝගට් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
04	ආහාර පිණිස කිරි මිදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
05	අයිස්ක්‍රීම් හෝ බීම පැකට් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
06	ගව කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
07	ධාන්‍ය හෝ මාංශ භෝග තොග හොන්ඩර් 02ට වඩා වැඩි ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
08	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
09	යන්ත්‍රානුසාරයෙන් මිරිස්, කුළුබඩු, ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් හෝ ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	800 0
10	අබලි යකඩ හා අබලි ද්‍රව්‍ය ගබඩාකර ලබා ගැනීම හා එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
11	පාවහන් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
12	පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
13	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
14	සිල්ලර බඩු හා තොග බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
15	තොග වශයෙන් ධාන්‍ය හා එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
16	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
17	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
18	බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
19	රබර් ෂීට් නිෂ්පාදනය හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0

උපලේඛන අංක 02

01	යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
02	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
03	ගඩොල් හෝ වළං පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
04	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05	ලෝහ පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
06	විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
07	වායු සමීකරණ හෝ ශීතකරණ අලුත්වැඩියා කරන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08	විදුලි බලය භාවිත නොකරන වී මෝලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
09	විදුලි බලයෙන් ක්‍රියා කරන වී මෝලක් පවත්වාගෙන යාම සඳහා	500 0	600 0	1,000 0
10	යන්ත්‍රෝපකරණ මගින් ක්‍රියාකරන උක් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
11	වෙනත් ක්‍රම මගින් ක්‍රියාත්මක කරන උක් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	II වැනි තීරුව		
අනු. අංකය	බලය දෙනු ලබන කාර්යය	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු.750 නොඉක්මවන අවස්ථාවක	රු.750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු.1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
12	රටකජු පොතු ඉවත් කිරීමේ මෝලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
13	මෝටර් වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
14	කෝපි හෝ ධාන්‍ය, මාංශ භෝග, කුළුබඩු ඇඹරීම හෝ ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
16	විද්‍යුත් ලෝහ ආලේපිත ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
17	ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
18	රසායනික පොහොර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19	කෘෂි රසායනික ද්‍රව්‍ය විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20	විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
21	අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22	ශිල්පීය ක්‍රම යොදා ගනිමින් (අත් යන්ත්‍ර භාවිතා නොකරන) කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0 500 0	700 0 750 0	1,000 0 1,000 0
23	කාර්මික කැනීම් සහිත කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
24	ගෑස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
25	කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
26	බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
27	යන්ත්‍රෝපකරණ මගින් ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
28	ඉන්ජෙක්ටර් පොම්ප අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
29	මෝටර් සයිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
30	පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0

12 - 768/11

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අල්ලන ලද අයාලේ යන ගවයින් නිදහස් කිරීමේ ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී යෝජනා අංක 12 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. පී. ඉනෝකා,
සභාලේකම්.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් මාර්ගයක හෝ මාර්ගයට යා හැකි වන පරිදි බැද දිගේලි කර හෝ නිදැල්ලේ යාමට සලස්වා ඇති ගවයකු, මී ගවයෙකු, එළුවකු හෝ වෙනත් සතෙකු නිසා මාර්ගයේ අනතුරු සිදු වීමට ඉඩ ඇත. එබැවින් ඉහත කී ස්ථානවල බැඳ දිගේලි කර හෝ නිදැල්ලේ යාමට සලස්වා ඇති සතුන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66(2) වන වගන්තිය ප්‍රකාර අල්ලා ගාල් කිරීමටත් එවැනි අල්ලා ගත් සතුන් නිදහස් කිරීමේ දී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *විස්තරය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01	ලොකු ගවයෙකු, මී ගවයෙකු අල්ලා නිදහස් කිරීමේ දී අය කරන ගාස්තුව	3,000 0
02	කුඩා ගවයෙකු හෝ කුඩා මී ගවයෙකු අල්ලා නිදහස් කිරීමේදී අයකරන ගාස්තුව	1,500 0
03	එළුවකු අල්ලා නිදහස් කිරීමේ ගාස්තුව	1,500 0
04	ගවයෙකු, මී ගවයෙකු, එළුවෙකු, කුඩා ගවයෙකු, කුඩා මී ගවයෙකු, ගාලෙහි එක් දිනක් රඳවා ගැනීමේ ගාස්තුව	2,000 0

12 - 768/12

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සතිපොළ බදු අය කිරීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී යෝජනා අංක 13 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. පී. ඉනෝකා,
සභාලේකම්.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් උඟව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදු 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති පොදු හෝ පෞද්ගලික වෙළඳපොලවල් අතුරු ව්‍යවස්ථා බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 2015.02.11 වැනි දින අංක 1901/15 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති දැන්වීම හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වැනි වගන්තිය ප්‍රකාරව බඩල්කුඹුර සතිපොළ බදු අය කිරීමේ ගාස්තු උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට සුදුසු බව බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

අනු. අංකය	*වෙළෙඳ ස්වභාවය*	*බිම් වර්ග අඩි 1සිට සිට 25 දක්වා හෝ වෙළඳ ස්වභාවය මත ගාස්තු රු. ශත*	*බිම් වර්ග අඩි 25 සිට 50 දක්වා හෝ වෙළඳ ස්වභාවය මත ගාස්තු රු. ශත*	*බිම් වර්ග අඩි 50 සිට අඩි 100 දක්වා හෝ වෙළඳ ස්වභාවය මත ගාස්තු රු. ශත*
1.	සිල්ලර මාළු වෙළෙඳුන්ගෙන්	735 0	1,050 0	1,365 0
2.	තොග මාලු වෙළෙඳුන්ගෙන්	525 0	735 0	1,500 0
3.	කුළු බඩු තොග සහ සිල්ලර	315 0	420 0	630 0
4.	කුළු බඩු සිල්ලර	250 0	350 0	450 0
5.	අල බී එෑණු වෙළෙඳුන්ගෙන්	600 0	850 0	1,200 0
6.	මිශ්‍ර එළවළු වෙළෙඳුන්ගෙන්	250 0	400 0	500 0
7.	එළවළු තොග වෙළෙඳුන්ගෙන්	315 0	420 0	525 0
8.	පළා වෙළෙඳුන්ගෙන්	100 0	200 0	250 0
9.	කරවල වෙළෙඳුන්ගෙන්	500 0	700 0	1,000 0
10.	රෙදි වෙළෙඳුන්ගෙන්	400 0	500 0	600 0
11.	විසිතුරු භාණ්ඩ වෙළෙඳුන්ගෙන්	300 0	400 0	550 0
12.	මනි බඩු වෙළෙඳුන්ගෙන්	350 0	450 0	700 0
13.	පළතුරු වෙළෙඳුන්ගෙන්	250 0	400 0	550 0
14.	රසකැවිලි වෙළෙඳුන්ගෙන්	250 0	300 0	450 0
15.	එක් කෙසෙල් කැනකින් (තොග මිලදී ගැනීම)	8 0 (කුඩා)	9 0 (මධ්‍යම)	10 0 (ලොකු)
16.	වට්ටක්කා ගෙඩි 1කට (තොග මිලදී ගැනීම)	6 0 (කුඩා)	7 0 (මධ්‍යම)	10 0 (ලොකු)
17.	ඉහත වර්ග නොකළ වෙනත් වෙළෙඳුන්ගෙන් ස්වභාවය මත අය කිරීම	300 0	500 0	600 0

සති පොළ සීමා :

උතුරට - බදුල්ල, මොණරාගල මාර්ගයේ කරවිල හන්දිය
නැගෙනහිරට - බදුල්ල මොණරාගල මාර්ගයේ පන්සල් හන්දිය
දකුණට - බඩල්කුඹුර බුත්තල මාර්ගයේ පාසල් හන්දිය
බස්නාහිර - බදුල්ල මොණරාගල මාර්ගයේ බෝගහපැලැස්ස හන්දිය

12 - 768/13

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී යෝජනා අංක 14 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. පී. ඉනෝකා,
සභාලේකම්.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තියෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැනහොන් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10:1ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එකී සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1%ක වාර්ෂික බද්දක් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

12 - 768/14

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු පැනවීමේ යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී යෝජනා අංක 15 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. පී. ඉනෝකා,
සභාලේකම්.

2023 ඔක්තෝබර් මස 24 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

(267 අධිකාරිය වන) විනෝද බදු ආඥාපනතේ කාර්යය සඳහා අදාළවන කිසියම් විනෝද කටයුත්තක් බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරන සෑම තැනැත්තෙකු විසින්ම එම විනෝද කටයුත්ත -

(අ) සිනමා දර්ශනයක්වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට හතයි දශම පහක (7.5%) ප්‍රමාණයට සමාන මුදලක් ද,

සහ

(ආ) වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ප්‍රමාණයට සමාන මුදලක් ද,

ඉහත කී විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියෙන් පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර විනෝද බද්ද වශයෙන් පනවා අයකර ගත යුතු බවත්, විනෝද බද්ද බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරන්නීය.

12 - 768/15

හාලිඇල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උපවගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 31 වැනි දින අංක 384 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. සී. ඩී. ජයසිංහ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය යටතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයන්හි (1) වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනය 11 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පලක් වැනි අවස්ථාවක දී ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ලැබීම් වලින් 1% බලපත්‍ර ගාස්තුව ලෙස 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		වාර්ෂික වටිනාකම		
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	තේ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ගවමස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කුකුල් මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කබොක් ගල් හෝ කළුගල් ගබඩා කිරීම (අලෙවි කිරීම)	500 0	750 0	1,000 0
8.	බොරළු පස් කැපීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ගැළුම් 50 ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩාකර තැබීම හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ධාන්‍ය හෝ මාංශ වර්ග 50Kg ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		වාර්ෂික වටිනාකම		
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
11.	දැව ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හො.15ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම හා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	අලුත් හෝ පරණ ටයර් හෝ ටියුබ් 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම හා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සිමෙන්ති කොට්ට 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම හා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වානේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනය හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පාවහන් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	දේශීය වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	අයිස්ක්‍රීම් හා ශීතකළ බීම වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ශීතකරණවල බහා මාළු/මස් විකිණීම (අවසරලත්) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	සාප්පු බඩු අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ඇලුමිනියම්, ප්ලාස්ටික් ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	පිඟන් හා වීදුරු අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	යකඩ බඩු අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	වැලි කියුබ් 05ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	සත්ත්ව ආහාර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	මත්පැන් විකුණන සමාජ ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	බටහිර වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	රේස් ඔට්ටු පළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	රස කැවිලි අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	වීඩියෝ කිරීම හා වීඩියෝ පටි අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	පොල් තෙල් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	ඇස්බැස්ටෝස් ෂීට් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	කරවල වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	තාවකාලික අලෙවි ප්‍රවර්ධන කුටි පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	කඩල/බයිට්ස් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
43.	පිත්තල ඇලුමිනියම් වාත්තු කර භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම			
44.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ගඩොල් හෝ උළු ගබඩා කර තැබීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	දර විකිණීම සඳහා ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මධ්‍යම ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
49.	සිමෙන්තිවලින් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	පොත් හා ලිපි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	මහන මැෂින් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	සිංහල බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	ඉංග්‍රීසි බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	ඡායා පිටපත් කිරීමේ හා රෝනියෝ කිරීම/බයින්ඩින් කිරීමේ ලැමිනේටින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	සුළු පරිමාණයේ සිල්ලර බඩු අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	සුරතල් සතුන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	බුලත්, පුවක් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	එළවළු හෝ පළතුරු වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (සිල්ලර)	500 0	750 0	1,000 0
62.	සිමෙන්ති විකිණීම හෝ ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	දුම්කොළ ගබඩා කිරීම හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	තීන්ත හා සායම් වර්ග ගබඩා කිරීම හා අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	රබර් සීල් තැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	පැණි හකුරු නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	කුළු බඩු වර්ග නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	ලියුම් කවර නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	කෝපි, ගම්මිරිස් ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	තේ කුඩු පැකට් කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	සමුපකාර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	පූජා භාණ්ඩ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	භූමිතෙල් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	ස්ප්‍රිතු වර්ග ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	ඉන්ධන ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
77.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	හුණු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	විවිධ පැල තවාන් හා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	විදුලි උපකරණ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	මධ්‍යම ප්‍රමාණයේ සිල්ලර බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	ටින් කරන ලද ආහාර ද්‍රව්‍ය ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	කිරුම් මිනුම් උපකරණ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	යෝගට් අයිස්ක්‍රීම් ජෑම් නිෂ්පාදනය හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	පී.වී.සී බට ගබඩාව හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	පාරිභෝගික ද්‍රව්‍ය තොග වශයෙන් අලෙවිය හා බෙදාහැරීම	500 0	750 0	1,000 0
87.	මංගල සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	සාත්තු සේවක මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	දුරකතන අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	පිත්තල භාණ්ඩ පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	බ්ලොක් ගල් නිපදවීම හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	කෘෂි රසායනික යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීම (පරිගණක ද ඇතුළුව) මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	ජංගම මාලු වෙළඳසැල් පවත්වාගෙන යාම			
95.	ජංගම විසිතුරු භාණ්ඩ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	ජංගම රස කැවිලි හා පළතුරු අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	මදුරු දැල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	රසකාරක වර්ග/ජෙලි වර්ග නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	මල් පැළ වර්ග අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	පෞද්ගලික දුරකතන හා ෆැක්ස් පණිවිඩ යැවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	තහඩු කැපීම, නැවීම මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103.	වාහන පින්තාරු කිරීමේ හා ස්ටිකර් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104.	විදුරු කැපීම සහ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105.	ත්‍රිරෝද රථ හා යතුරු පැදි අමතර කොටස් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
106.	මුළුතැන්ගේ/ගෘහ උපකරණ නිෂ්පාදනය හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
107.	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
108.	සිම් කාඩ්/රීලෝඩ් කාඩ්පත් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
109.	පිඟන් ගඩොල් හා ඒ ආශ්‍රිත උපාංග අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
110.	කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
111.	ඩොලමයිට් ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
112.	ගුවන් විදුලි හා රූපවාහිනී අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
113.	තරාදි අලුත්වැඩියාව හා අලෙවිය	500 0	750 0	1,000 0
114.	වැලි ගොඩ දැමීමේ තොටුපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
115.	වැලි/ගඩොල් ගබඩා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
116.	ජල ටැංකි ගඩබා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
117.	ගුවන් විදුලි යන්ත්‍ර අලෙවිය	500 0	750 0	1,000 0
118.	ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
119.	පරිගණක ආශ්‍රිත සේවාවන්	500 0	750 0	1,000 0
120.	මංගල උත්සව සඳහා භාණ්ඩ සැපයීම (සැරසිලි පෝරු)	500 0	750 0	1,000 0
121.	දුරකතන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
122.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
123.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම	500 0	750 0	1,000 0
124.	ජංගම වෙළඳාම	500 0	750 0	1,000 0
125.	ජංගම මාළු අලෙවිය	500 0	750 0	1,000 0
126.	ඇලුමිනියම් දෙර ජනෙල් සවි කිරීම	500 0	750 0	1,000 0
127.	වැහිපීලි සවි කිරීම	500 0	750 0	1,000 0
128.	කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
129.	වටු කුකුල් ගොවිපලක් පවතවාගෙන යාම	500 0	750 0	1,000 0
130.	බිත්තර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
	පළමු උපලේඛනය - ජීඩාකාරී ව්‍යාපාර			
01.	මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
03.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලන (මස්, කිරි, බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන	500 0	750 0	1,000 0
05.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කි. 50ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
06.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනීම	500 0	750 0	1,000 0
07.	පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම	500 0	750 0	1,000 0
09.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, මාළු හෝ ජාඩි කි. 100ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම, අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි නිපදවීම	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0

12-672/1

හාලිඇල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ (150 (1) වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතෙන් 9(3) උපවගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ 10.31 වැනි දින අංක 385 යටතේ පහත දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. සී. ඩී. ජයසිංහ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ යටතේ, හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 තීරුවේ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ගමන් මළු නිපදවන ස්ථානයක් හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	මැටි භාණ්ඩ නිපදවන ස්ථානයක් හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	බීඩි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	රබර් මුද්‍රා අංක තහඩු නාම පුවරු හෝ අකුරු ඇලවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කුළුබඩු වර්ග, බෙහෙත් බඩු වර්ග හා පහන් තිර ආදී ද්‍රව්‍යන් ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	හඳුන්කුරු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පරිගණක, පරිගණක උපාංග හෝ ජංගම දුරකතන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මහන මැෂින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	සුළු පරිමාණ පාවහන් අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	මැණික් ගල් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	වායුසමීකරණ හා ශීතකරණ යන්ත්‍ර අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
18.	කුෂන් වැඩ කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	මිරිස් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	බිම් මල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ඇස් කණ්ණාඩි රාමු සැකසීම සහ අලෙවි කිරීමෙ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
22.	බේකරියක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
23.	පරිගණක මාර්ගයෙන් ප්‍රචාරක දැන්වීම් පුවරු සැකසීමේ (නව) මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
24.	නිදන මෙට්ට/පුටු කොට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
25.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම (සුළු ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
26.	මැටි වලං නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
27.	ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	වින්කලයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
29.	හඳුන්කුරු නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	දැව කැටයම් (විසිතුරු) කැපීමේ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
31.	මිනිරන් උපයෝගි කර ගෙන කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
32.	ෆයිබර් වැඩපලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
33.	වාහන සයිලන්සර් නිෂ්පාදිත මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
34.	කොන්ක්‍රීට් වැඩපලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම	
		රු.750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
35.	බැටරි චතුර නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
36.	මෝටර් රථ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
37.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	නිකල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	පිත්තල පෑස්සුම් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	වී ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	මෝටර් රථ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
43.	වී ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	මෝටර් රථ ටිංකරින් පේන්ටින් කිරීම	500 0	750 0	1,000 0

12-672/2

හාලිඇල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152(1) වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල එකී පනතේ 9 (3) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභා ලේකම්ට පැවරී ඇති බලතල ප්‍රකාර 2023.10.31 වැනි දින අංක 386 අනුව පහත උපලේඛනයේ දක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. සී. ඩී. ජයසිංහ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වැනි වගන්තිය යටතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා යම් වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2024 වර්ෂයේ දී පවත්වා ගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂය අංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරන්නේ ය.

ඉහත කී උපලේඛනය

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම්*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද*
	රු. ශත
01. රු. 6,000 නොඉක්මවූ අවස්ථාවක්	කිසිවක් නැත
02. රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවූ විට	90 0
03. රු. 12,001 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවූ විට	180 0
04. රු. 18,751 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවූ විට	360 0
05. රු. 75,001 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවූ විට	1,200 0
06. රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

12 - 672/3

හාලිඇල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 146(1) සහ 34(1) වැනි වගන්තියෙන් හාලි ඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ 9(3) උපවගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ 10.31 වැනි දින අංක 387 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත්බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. සී. ඩී. ජයසිංහ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවැරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 වගන්තියේ 3 වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි නිවාසවල, ඉඩම්වල, ගොඩනැගිලිවල හා ගෙවතුවල 2022 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් පහත උපලේඛනයේ අනුප්‍රමාණ යටතේ වූ වරිපනමක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළ දී සමාන වාරික 04කින් ගෙවීමට විධාන කිරීමටත් තීරණය කරන්නේ ය.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් මුදල 2024 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

(1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව,

(I) හාලිඇල සහ ඇටම්පිටිය යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළකටම සියයට හතරක (4%) වරිපනම් බද්දක් ද,

(II) ස්ප්‍රිංවැලි නගරය සහ උඩුවර 05 කණුව සිට උඩුවර 07 කණුව දක්වා යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළක්ම සියයට තුනක (3%) ක වරිපනම් බද්දක් ද පනවා අය කළ යුතු බවටත් තීරණය කරමි.

12 - 672/4

හාලිඇල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උපවගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ 10.31 දින අංක 388 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත්බව මජහනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. සී. ඩී. ජයසිංහ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උපවගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වගන්තිය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ,

(අ) හෙක්ටයාර 05ක් වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2024 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 (iii) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් හාලිඇල බල සභා ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 4(අ) වන කොටසේ 1989.04.28 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර 05ට අඩු සෑම ඉඩමක් මත ද 2024 වර්ෂය සඳහා රු. 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (vi) වන උපවගන්තියේ විධිවිධාන යටතේ, එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික 04කින් හාලිඇල ප්‍රදේශීය සභාවට ගෙවීමට විධානය කළ යුතු යැයි තීරණය කරන්නේ ය. එකී තීරණය සඳහා 1989 අංක 12 දරන පළාත් සභා අනුෂාංගික විධිවිධාන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ III වන උපවගන්තිය ප්‍රකාර ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත්, 2024 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 04කින් හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර ගෙවනු ලැබුවහොත් මෙම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයට සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

උපලේඛනය

ඉඩම් ප්‍රමාණය	*බදු අනු ප්‍රමාණය වර්ෂයකට*
	රු. ශත
01. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 කට අඩු නමුත් හෙක්ටයාර් 01ට නොඅඩු අවස්ථාවක හෙක්ටයාර් එකකට	50 0
02. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක හෙක්ටයාර් එකකට	10 0

12 - 672/5

හාලිඇල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 වැනි වගන්තිය යටතේ කියවිය යුතු එම පනතේ 148 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උපවගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ 10.31 දින අංක 389 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත්බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. සී. ඩී. ජයසිංහ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේදී පහත උපලේඛනයේ සඳහන් පරිදි කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම බද්දක් අයකළ යුතු යැයි තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
I.	මෝටර් රථයක් - මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
II.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	25 0
	(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්යය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	04 0
සෑම කරත්තයක් සඳහා		20 0
සෑම අත් කරත්තයක් සඳහා		10 0
සෑම රික්ෂෝවක් සඳහා		7 50

	රු. ශත
සෑම අශ්වයකු හෝ පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම අලියෙකු හෝ ඇතෙකු සඳහා	50 0

2. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-672/6

හාලිඇල ප්‍රාදේශීය සභාව

2024 වසර සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 (1) වැනි වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත එකී පනතට සිදුකර ඇති සංශෝධන අනුව සහ ඒ යටතේ සකස් කරන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1534/18 දරන වර්ෂ 2008 ක් වූ පෙබරවාරි මස 01 දිනැති ගැසට් පත්‍රයේ හා අංක 1533/16 දරන 2008.01.25 දිනැති ගැසට් පත්‍රයේ හා 2264/18 හා 2022.02.27 දිනැති ගැසට් පත්‍රයේ "ඇ" ලේඛනයේ හා මෙහි "අ" උපලේඛනයේ සඳහන් කර්මාන්තයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අවලංගු කිරීම හා අත්හිටුවීම සඳහා හාලිඇල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව හා එකී පනතේ 9(3) උපවගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ 10.31 දින අංක 390 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත්බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. සී. ඩී. ජයසිංහ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත එකී පනතට සිදුකර ඇති සංශෝධන අනුව සහ ඒ යටතේ සකස් කරන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1534/18 දරන වර්ෂ 2008 ක් වූ පෙබරවාරි මස 01 දිනැති ගැසට් පත්‍රයේ හා අංක 1533/16 දරන 2008.01.25 දිනැති ගැසට් පත්‍රයේ "ඇ" ලේඛනයේ හා මෙහි "අ" උපලේඛනයේ සඳහන් කර්මාන්තයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අවලංගු කිරීම හා අත්හිටුවීම මෙම අධිකාරි බලය යටතේ සිදු කරනු ලැබේ. හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ ඉහත කී පනත් හා අදාළ සංශෝධන යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුව ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2024.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව වසර 03ක් හෝ ඊට අඩු කාලයක් සඳහා රු. 4000.00 ක බලපත්‍ර ගාස්තුවක් ද රු. 500.00 ක අයදුම්පත්‍ර ගාස්තුවක් ද "ආ" උපලේඛනයේ සඳහන් පරීක්ෂණ ගාස්තුවක් පනවා අය කිරීමට යෝජනා කරමි.

"ඇ" උපලේඛනය

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වානිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි සෝදන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එබ්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත

8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලී සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයක් කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සිහින කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සටින ඌරු හෝ ගව ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවලු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන.

    * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x (ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීමේ කටයුතු
255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ අංක 1725/16 සහ 2011 සැප්තැම්බර් මස 29 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ සහ ඉහත කී පනතේ 3 වන වගන්තියේ ප්‍රකාරව 2012.01.30 වැනි දින පැවති මහා සභාවේ යෝජනා සම්මුතියකින් මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ බලාත්මකව ක්‍රියාත්මක කිරීම පිණිස පිළිගෙන වැළඳ ගත් "නගර සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහනවලින් ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ පස්වන වගන්තියේ සඳහන් පරිදි එක් එක් වාහන අවසර පත්‍ර සඳහා අය කරන ගාස්තු 2023 දෙසැම්බර් මස 06 වැනි දින තීරණ අංක 654 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

තවද, පහත උපලේඛනයේ සඳහන් පරිදි අදළ ගාස්තු 2024.01.01 වැනි දින සිට අයකිරීම ක්‍රියාත්මක කරනු ලබන බව ද මෙයින් නිවේදනය කරමි.

එච්. එල්. ප්‍රශාන්තිනී,
ලේකම් හා සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිනුවන්ගොඩ නගර සභාව.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

මිනුවන්ගොඩ නගර සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ ලේකම් එච්. එල්. ප්‍රශාන්තිනී වන මම, 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ අංක 1725/16 සහ 2011 සැප්තැම්බර් මස 29 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ සහ ඉහත කී පනතේ 3 වන වගන්තියේ ප්‍රකාරව 2012.01.30 වැනි දින පැවති මහා සභාවේ යෝජනා සම්මුතියකින් මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ බලාත්මකව ක්‍රියාත්මක කිරීම පිණිස පිළිගෙන වැළඳ ගත් "නගර සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ

වාහනවලින් ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ පස්වන වගන්තියේ සඳහන් පරිදි එක් එක් වාහන අවසර පත්‍ර සඳහා අය කරන ගාස්තු අය කිරීමට තීරණය කරමි.

උපලේඛනය

1.	මෝටර් බයිසිකලයක් සඳහා	රථගාල් ඇතුළත	රු. 10 0 (පැයකට)
2.	මෝටර් රථයක් සඳහා	රථගාල් ඇතුළත	රු. 20 0 (පැයකට)
3.	ත්‍රිරෝද රථයක් සඳහා	රථගාල් ඇතුළත	රු. 20 0 (පැයකට)
4.	වෑන් හා ලොරි රථ සඳහා (මිනුවන්ගොඩ නගර සභාවේ ලියාපදිංචි ලොරි හා වෑන් රථ සංගම් සඳහා පමණි)	රථගාල් ඇතුළත	රු. 900 0 (මාසිකව)
5.	ත්‍රිරෝද රථයක් සඳහා (මිනුවන්ගොඩ නගර සභාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථ සංගම් සඳහා පමණි)	ත්‍රිරෝද රථගාල් ඇතුළත	රු. 300 0 (මාසිකව)

* වැඩිවන සෑම පැයකට රු. 10

සණස ග්‍රීඩම් පාර්ක් රථ වාහන සඳහා

1.	මෝටර් රථයක් සඳහා	රථගාල් ඇතුළත	රු. 50 0 (දිනකට)
2.	මෝටර් බයිසිකලයක් සඳහා	රථගාල් ඇතුළත	රු. 30 0 (දිනකට)
3.	ත්‍රිරෝද රථයක් සඳහා	රථගාල් ඇතුළත	රු. 40 0 (දිනකට)

12-705/8

මිනුවන්ගොඩ නගර සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත පරිදි විනෝද බදු අයකිරීම - 2024

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සහ ප්‍රසිද්ධ රඟදැක්වීමේ ආඥාපනතේ 176 වැනි අධිකාරි 3 වන වගන්තිය යටතේ මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන සෑම චිත්‍රපට දර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් දර්ශනයක්, නාට්‍ය දර්ශනයක්, මාරක ළිඳ සංදර්ශනයක්, මෝටර් සයිකල් ධාවන වැනි ඕනෑම සැණකෙළි සංදර්ශනයක් සඳහා මුද්‍රණය කර අලෙවි කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට විසිපහක (25%) විනෝද බද්දක් 2024 වර්ෂය සඳහා 2023 දෙසැම්බර් මස 06 වැනි දින තීරණ අංක 654 යටතේ පනවා අය කිරීමට මෙයින් නිවේදනය කරමි.

එච්. එල්. ප්‍රශාන්තිනී,
ලේකම් හා සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිනුවන්ගොඩ නගර සභාව.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

මිනුවන්ගොඩ නගර සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ ලේකම් එච්. එල්. ප්‍රශාන්තිනී වන මම, ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 වැනි අධිකාරය) 3 වන වගන්තිය යටතේ මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන සෑම චිත්‍රපට දර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් දර්ශනයක්, නාට්‍ය දර්ශනයක්, සංගීත සංදර්ශනයක්, මාරක ළිඳ සංදර්ශනයක්, මෝටර් සයිකල් ධාවන වැනි ඕනෑම සැණකෙළි සංදර්ශනයක් සඳහා මුද්‍රණය කර අලෙවි කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට විසිපහක (25%) විනෝද බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට මෙයින් තීරණය කරමි.

12-705/9

මිනුවන්ගොඩ නගර සභාව

2024 වර්ෂයට සේවා ගාස්තු අය කිරීම

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව 2016.10.28 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (iv) (අ) කොටස මගින් නිවේදනය කර පනවා ඇති අතුරු ව්‍යවස්ථා අනුව 2024 වර්ෂය සඳහා මිනුවන්ගොඩ නගර සභාව මගින් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි අදාළ සේවා ගාස්තු අයකිරීම 2023 දෙසැම්බර් මස 06 වැනි දින තීරණ අංක 654 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එච්. එල්. ප්‍රශාන්තිනී,
ලේකම් හා සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිනුවන්ගොඩ නගර සභාව.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මිනුවන්ගොඩ නගර සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ ලේකම් එච්. එල්. ප්‍රශාන්තිනී වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/46 හා 2014.11.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධිවිධාන පනතේ 2 වන වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ, පළාත් සභාව විසින් අනුමත කර ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/7 හා 2015.12.28 වැනි දිනැති *ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කර ඇති එකී සම්මත අතුරු ව්‍යවස්ථා මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2018.01.01 වැනි දින සිට අදාළ විය යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව 2016.10.28 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (iv) (අ) කොටස මගින් නිවේදනය කර පනවා ඇති අතුරු ව්‍යවස්ථා අනුව 2024 වර්ෂය සඳහා මිනුවන්ගොඩ නගර සභාව මගින් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි අදාළ සේවා ගාස්තු අයකිරීමට තීරණය කරමි.

ඒ අනුව 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් සේවා ගාස්තු අය කරනු ලබන ස්වභාවය අනුව,

I. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 4.1 හි නගර සීමාව තුළ රජයේ ආයතනවල සේවය කරනු ලබන පුද්ගලයන් සඳහා අය කරනු ලබන ඇප මුදල් ගාස්තු රු. 3,000.00 ක මුදල 2023.11.29 වැනි දින තීරණ අංක 643 යටතේ අය කිරීමටත්,

II. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 4.8 හි පුස්තකාලය මගින් පවත්වනු ලබන පරිගණක පාඨමාලාව සඳහා මාසිකව එක් අයෙක් සඳහා රු. 500.00ක මුදල 2023.07.26 වැනි දින තීරණ අංක 331 යටතේ අය කිරීමටත්,

III. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 9.1 යටතේ බැකෝ ලෝඩරය - මීටර් පැයට රියදුරු හා යාමට ඒමට ඉන්ධන සමග (අවම මීටර් පැය 4 සඳහා) ගාස්තු ලෙස රු. 6,700.00ක මුදලක් 2023.08.08 වැනි දින තීරණ අංක 358 යටතේ අය කිරීමටත්,

IV. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 9.3 යටතේ චතුර බවුසරය (ලීටර් 6000) - දිනකට රියදුරු හා යාමට ඒමට ඉන්ධන සමග, එක් ගමන් වාරයක් සඳහා ගාස්තු ලෙස රු. 7,500.00 මුදල් 2023.08.08 වැනි දින තීරණ අංක 360 යටතේ අය කිරීමටත්,

V. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 9.3 යටතේ චතුර බවුසරය (ලීටර් 6000) - දිනකට රියදුරු හා යාමට ඒමට ඉන්ධන සමග, එක් ගමන් වාරයක් සඳහා - නගර සීමාවෙන් පිටත ප්‍රවාහන ගාස්තු ලෙස කිලෝ මීටර 1 සඳහා රු.60.00 ක මුදලක් 2023.08.08 වැනි දින තීරණ අංක 360 යටතේ අය කිරීමටත්,

VI. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 9.4 යටතේ මාර්ග පළුදු කිරීමේ ගාස්තු - බොරළු මාර්ග වර්ග මීටර් 1ක් සඳහා රු. 1,250.00ක මුදලක් 2023.08.08 වැනි දින තීරණ අංක 361 යටතේ අය කිරීමටත්,

VII. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 9.4 යටතේ මාර්ග පළුදු කිරීමේ ගාස්තු - තාර/කාපට්/කොන්ක්‍රීට්/ඉන්ටලොක් මාර්ග වර්ග මීටර් 1ක් සඳහා රු. 4,500.00 ක මුදලක් 2023.08.08 වැනි දින තීරණ අංක 361 යටතේ අය කිරීමටත්,

VIII. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 10.1 යටතේ පෙර පාසල් සඳහා ඇතුලත් වීමේ ගාස්තු ලෙස රු. 1,000.00ක මුදලක් 2023.07.26 වැනි දින තීරණ අංක 335 යටතේ අය කිරීමටත්,

IX. ගාස්තු අය කරනු ලබන සේවාවේ ස්වභාවය අංක 10.2 යටතේ පෙර පාසැල් සඳහා මාසික ගාස්තු ලෙස රු. 300.00 ක මුදලක් 2023.07.26 වැනි දින තීරණ අංක 335 යටතේ අය කිරීමටත්,

X. ගලි බවුසරය කුලියට දීම යටතේ පහත පරිදි ගාස්තු අය කිරීමට 2023.08.08 වැනි දින තීරණ අංක 359 යටතේ අය කිරීමටත්,

ස්ථානයේ ස්වභාවය	*බල ප්‍රදේශය තුළ*		*බල ප්‍රදේශයෙන් පිටත*	
	මුල් වාරය රු. ශත	*අතිරේක වාරය රු. ශත*	*මුල් වාරය රු. ශත*	*අතිරේක වාරය රු. ශත*
නිවසක් සඳහා	1,750.00	1,000.00	2,500.00	1,500.00
ව්‍යාපාරික ස්ථාන	2,500.00	1,750.00	4,000.00	2,000.00
කර්මාන්ත ශාලා / සංචාරක හෝටල්	3,000.00	2,250.00	5,000.00	2,500.00
රජයේ ආයතන	1,250.00	750.00	2,000.00	1,500.00
ආගමික ස්ථාන / වෙනත් සුභසාධන ස්ථාන	1,000.00	750.00	1,500.00	1,000.00

මීට අමතරව ප්‍රවාහන ගාස්තුව ලෙස නගර සභා බල ප්‍රදේශය තුළ 1,000.0ක් ද, නගර සභා බල ප්‍රදේශයෙන් පිටත කි.මී. 01කට රු. 60/-බැගින් ද, බැහැරලීමේ ගාස්තුව රු. 2,000.00 බැගින් ද අයකිරීමට 2023.08.08 වැනි දින තීරණ අංක 359 යටතේ අය කිරීමටත් තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*ගාස්තු අයකරනු ලබන සේවාවේ ස්වභාවය*					*රු. ශත*
1	ක්‍රීඩාපිටි හා සභාව සතු භූමි කුලියට දීම	1.1	ඇලිස් පිටිය (දිනකට)			5,000 0
		1.2	පරාක්‍රම පිටිය (දිනකට)			3,000 0
		1.3	සභාව සතු භූමි කුළියට දීම වර්ග අඩි 1ක් සඳහා			5 0
		1.4	උත්සව අවස්ථාවන් සඳහා සතිපොළ පරිශ්‍රය කුලියට දීම (දිනකට)			5,000 0
2	සුසාන භූමි ගාස්තු	2.1	භූමිදන සඳහා	මිනුවන්ගොඩ නගරයේ කනත්ත	නගර සීමාව තුළ	2,500 0
					නගර සීමාවෙන් පිටත	3,500 0
				වැගොව්ව රාජසිංහපුර කනත්ත	නගර සීමාව තුළ	2,500 0
					නගර සීමාවෙන් පිටත	3,500 0
				නිල්පනාගොඩ කනත්ත	නගර සීමාව තුළ	2,500 0
					නගර සීමාවෙන් පිටත	3,500 0
		2.2	ආදහනය සඳහා	නගර සීමාව තුළ		15,000 0
				නගර සීමාවෙන් පිටත		17,500 0
		2.3	සුසාන භූමියේ තාප්පයේ සිහිවටන ඵලක සෑදීම සඳහා (2'x2' ප්‍රමාණයක් සඳහා)	මිනුවන්ගොඩ නගරයේ කනත්ත		25,000 0
				වැගොව්ව රාජසිංහපුර කනත්ත		25,000 0
				නිල්පනාගොඩ කනත්ත		25,000 0
3	වැසිකිලි ගාස්තු	3.1	පොදු වැසිකිළිය (එක් අයෙකුගෙන්)			30 0
		3.2	ඇවැසි පියස (එක් අයෙකුගෙන්)			50 0

අනු. අංකය	ගාස්තු අයකරනු ලබන සේවාවේ ස්වභාවය					රු. ශත
4	පුස්තකාල සේවා ගාස්තු	4.1	පුස්තකාල සාමාජික ගාස්තු	නගර සීමාව තුළ	ළමා	100 0
					වැඩිහිටි	300 0
				නගර සීමාවෙන් පිටත	ළමා	200 0
					වැඩිහිටි	500 0
				නගර සීමාව තුල රජයේ ආයතන	වැඩිහිටි	3000 0
				නගර සීමාව තුළ පාසල්	ළමා	100 0
					වැඩිහිටි	100 0
		4.2	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ/දීර්ඝ කිරීමේ ගාස්තු	නගර සීමාව තුළ	ළමා	50 0
					වැඩිහිටි	100 0
				නගර සීමාවෙන් පිටත	ළමා	100 0
					වැඩිහිටි	200 0
				නගර සීමාව තුල රජයේ ආයතන		3,000 0
				නගර සීමාව තුළ පාසල්	ළමා	50 0
					වැඩිහිටි	100 0
		4.3	පුස්තකාල සාමාජික විද්‍යුත් හැඳුනුම්පත් ගාස්තු			225 0
		4.4	පුස්තකාල ඇප තැන්පතු ගාස්තු	නගර සීමාව තුළ	ළමා	300 0
					වැඩිහිටි	1,000 0
				නගර සීමාවෙන් පිටත	ළමා	500 0
					වැඩිහිටි	1,500 0
				නගර සීමාව තුළ රජයේ ආයතන	වැඩිහිටි	2,000 0
				නගර සීමාව තුළ පාසල්	ළමා	750 0
					වැඩිහිටි	750 0
		4.5	පුස්තකාල බැහැර දීමේ සේවා සඳහා ප්‍රමාද ගාස්තු (දිනකට)			1 0
		4.6	පුස්තකාල ඡායා පිටපත් ගාස්තු	A4 ප්‍රමාණය	තනිපිට	4 0
					දෙපිට	6 0
				A3 ප්‍රමාණය		9 0
				Legal ප්‍රමාණය		9 0

		4.7	රැකියා තොරතුරු සහිත ඇබෑර්තු අයදුම්පත් ගාස්තු (9'' x 4'' ප්‍රමාණයේ ලිපි කවරය සමග)	පිටු 4 දක්වා	25 0
				පිටු 5-8	35 0
				පිටු 9-10	45 0
5	ප්‍රජාශාලා කුලියට දීම	5.1	ජුම්මා මස්ජිද් ප්‍රජාශාලාව (විවාහ උත්සව සඳහා දිනකට)		5,000 0
			ජුම්මා මස්ජිද් ප්‍රජාශාලාව (දිනකට)		500 0
6	ශාලා කුලියට දීම	6.1	නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඇති ශාලාව කුලියට දීම (පුටු 70ක් සමග)		3,000 0
		6.2	බස් නැවතුම්පල ඉදිරිපිට නව වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ රැස්වීම් ශාලාව (පැයකට)		5,000 0
		6.3	නව පුස්තකාලයේ උඩු මහල දේශන ශාලාව කුලියට දීම	වරුවක් සඳහා පැය 04	15,000 0
				වැඩිවන සෑම පැයක් සඳහාම	2,000 0
7	විවිධ ආකෘති පත්‍ර	7.1	ඔප්පු සාරාංශ ඉල්ලුම් පත		500 0
		7.2	පිඹුරුපත් (අනුබෙදුම්) අනුමත කිරීමේ ඉල්ලුම්පත		500 0
		7.3	ගොඩනැගිලි අනුමත කිරීමේ ඉල්ලුම්පත		500 0
		7.4	පරිසර බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු		100 0
		7.5	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර		50 0
		7.6	ගලි බවුසර් අයදුම්පත් ගාස්තු		50 0
		7.7	වීථි රේඛා අයදුම්පත් ගාස්තු		50 0
		7.8	පුස්තකාල අයදුම්පත් ගාස්තු		10 0
		7.9	ලංසු පෝරම ගාස්තු		3,000 0
8	වෙළඳ කුටි සඳහා	8.1	දෛනික වෙළෙඳ කුටි		200 0
		8.2	ලොතරැයි කුටි සඳහා		100 0
		8.3	සංචාරක/ජංගම වෙළඳ වාහන සඳහා		200 0
9	නගර සභාව සතු යන්ත්‍ර කුලියට දීම (නගර සභා බල ප්‍රදේශය තුළ පමණයි)	9.1	බැකෝ ලෝඩරය - මීටර් පැයට රියදුරු හා යාමට ඒමට ඉන්ධන සමග (අවම මීටර් පැය 04 සඳහා ගෙවීම කළ යුතුය.		6,700 0
		9.2	ටිපර් රථය (කියුබ් 3) - දිනකට (රියදුරු හා යාමට ඒමට ඉන්ධන සමග)		10,800 0
		9.3	චතුර බවුසරය (ලී. 6,000) - දිනකට (රියදුරු හා යාමට ඒමට ඉන්ධන සමග, එක් ගමන් වාරයක් සඳහා)		7,500 0
			ප්‍රවාහන ගාස්තු - නගර සීමාවෙන් පිටත1 කිලෝ මීටරයක් සඳහා		60 0
		9.4	මාර්ග පළුදු කිරීමේ ගාස්තු බොරළු මාර්ග වර්ග මීටර් 1ක් සඳහා)		1,250 0
			මාර්ග පළුදු කිරීමේ ගාස්තු - තාර/කාපට්/කොන්ක්‍රීට්/ඉන්ටලොක් මාර්ග වර්ග මීටර 1ක් සඳහා)		4,500 0

10	පෙර පාසල් ගාස්තු අය කිරීම	10.1	ඇතුළත් වීමේ ගාස්තු		1,000 0
		10.2	මාසික ගාස්තුව		300 0
11	ශරීර සුවතා මධ්‍යස්ථානයට ගාස්තු අය කිරීම	11.1	ඇතුළත් වීමේ ගාස්තු		1,000 0
		11.2	මාසික ගාස්තුව		1,200 0
12	වරිපනම් අංශය ආශ්‍රිත සේවා ගාස්තු	12.1	අමතර වරිපනම් උධෘත ලබාදීම (වසරකට)		10 0
13	කර්මාන්ත අංශය ආශ්‍රිත සේවා ගාස්තු	13.1	අනුමත සැලසුම්වල සහතික කළ පිටපත් ලබා දීම	අනුබෙදුම්/අනුකූලතා සැලසුම් පිටපත් සහතික කර ලබා දීම	100 0
				ගොඩනැගිලි සැලසුම් A3 ප්‍රමාණය හෝ ඊට අඩු	100 0
		13.2	වීථි රේඛා ලබාදීම		500 0
14	වෙනත් ගාස්තු	14.1	ගස් අතු කපා ඉවත් කිරීම (ට්‍රැක්ටරය මගින් එක් ගමන් වාරයක් සඳහා)		2,000 0
		14.2	කොඩි කනු	එක් කනුවක් සඳහා (දිනකට)	20 0
				එක් කණුවක් සඳහා තැන්පතු	200 0

15. සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා ගාස්තු අයකිරීම ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත සමග කියවිය යුතු 2021.07.08 වන දිනැති අංක 2235/54 යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* ප්‍රකාරව ගාස්තු අය කිරීමට තීරණය කරමි.

16. ප්‍රචාරක ගාස්තු :

අනු. අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
I.	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 200 බැගින්		
II.	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 200 බැගින්		
III.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 300 බැගින්		

අනු. අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
IV.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 300 බැගින්		
V.	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 200 බැගින්		
VI.	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 200 බැගින්		
VII.	විද්‍යුත් උපකරණ යොදාකරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

17. කසළ සඳහා මුදල් අය කිරීම. -

නගර සභා බල ප්‍රදේශයේ නගර මධ්‍යයේ ඇති සුපර් මාර්කට්, හෝටල් හා බේකරි, එළවළු වෙළඳසැල් ආශ්‍රිතව සිදු කරන ලද සමීක්ෂණයට අනුව දෛනිකව ඉවත් කරන කසල බර මත පහත පරිදි මාසිකව මුදල් අය කිරීමට මම තීරණය කරමි :

අනු. අංකය	*දෛනික ජනනය*	*මුදල රු. ශත*
1	කිලෝ 00-10	1,000 0
2	කිලෝ 11-20	2,000 0
3	කිලෝ 21-30	3,000 0
4	කිලෝ 31-40	4,000 0
5	කිලෝ 41-50	5,000 0
6	කිලෝ 51-60	6,000 0
7	කිලෝ 61-80	7,000 0
8	කිලෝ 81-100	8,000 0
9	කිලෝ 101-150	9,000 0
10	කිලෝ 151-200	10,000 0
11	කිලෝ 201 ට වැඩි	12,000 0

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණ පොතෙහි 2023.12.27 දිනැතිව තීරණ අංක 1401 යටතේ කර්මාන්ත බද්ද පැනවීම සඳහා පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව

ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී ලෙස, ඊ.ඩී. දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි 2 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

	1 තීරුව	*2 තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1500 0 ඉක්මවන අවස්ථාවක*
1.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
2.	බතික් පිත්තල විසිතුරු භාණ්ඩ වෙස්මූණු, ලී කැටයම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1000 0
3.	ඇලුමිනියම් හෝ වෙනත් ලෝහ භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1000 0
4.	සෙල්ලම් බඩු ක්‍රීඩා භාණ්ඩ නිශ්පාදනය	500 0	750 0	1000 0
5.	තේ පැකට් කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1000 0
6.	යකඩ, ගැල්වනයිස් යොදා ගෘහ භාණ්ඩ සැදීම.	500 0	750 0	1000 0
7.	රබර් දුමාංගයක් හෝ රබර් රෝලක් පවත්වාගෙන යාම.	500 0	750 0	1000 0
8.	නූල් වර්ග නිෂ්පාදනය.	500 0	750 0	1000 0
9.	බීරළු කැපීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1000 0
10.	පාවහන් නිපදවීම	500 0	750 0	1000 0
11.	පැරෂුට් හෝ බැලුන් නිපදවීම.	500 0	750 0	1000 0
12.	කුෂන් වැඩපල.	500 0	750 0	1000 0

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව තීරණ පොතෙහි 2023.12.27 දිනැතිව තීරණ අංක 1402 යටතේ 2024 වර්ෂය සඳහා ව්‍යාපාර බදු නියම කිරීමට පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව

ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා 2024 වර්ෂයට ව්‍යාපාර බදු නියම කිරීමට පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් කළුතර ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත 2024 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී 2 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය,

1 තීරුව - 2023 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	2 තීරුව - ගෙවිය යුතු වාර්ෂික බද්ද රුපියල්
රු. 6000.00 නොයික්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
රු. 6000.00 ඉක්මවන එහෙත් රු. 12000.00 නොයික්මවන අවස්ථාවක	90
රු. 12,000.00 ඉක්මවන එහෙත් රු. 18,750.00 නොයික්මවන අවස්ථාවක	180
රු. 18,750.00 ඉක්මවන එහෙත් රු.75,000.00 නොයික්මවන අවස්ථාවක	360
රු. 75,000.00 ඉක්මවන එහෙත් රු.150,000.00 නොයික්මවන අවස්ථාවක	1200
රු. 1,50,000.00 ඉක්මවන අවස්ථාවක	3000

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බද්ද පැනවීම

කළුතර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන,කාර්යය කර්තව්‍ය ඉටු කරන කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ.ඩී.දේවපුර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (3) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව තීරණ පොතෙහි 2023.12.27 දිනැතිව තීරණ අංක 1403 යටතේ 2024 වර්ෂය සඳහා අක්කර බදු නියම කිරීමට පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද එම අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක්ද, එක් එක් කාර්තුවට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුව හොත් සියයට පහක (5%) ක වට්ටමක්ද ගෙවනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව

ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ.ඩී.දේවපුර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (3) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 2024 වර්ෂය සඳහා අක්කර බදු නියම කිරීමට පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි. එනම්,

කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තේ වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් 01 ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම , එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2024 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්, ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 6 වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දින වලට පෙර සමාන වාරික 04 කින් ගෙවීමට විධානය කළ යුතු බවට මම තීරණය කරමි.

12-635/3

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පනවා අය කිරීම

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් ගාස්තු පනවා අය කිරීම් පහත සඳහන් ආකාරයට විය යුතු බව 2023.12.27 දිනැතිව තීරණ අංක 1404 පරිදි පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව

ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස,ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් ගාස්තු පනවා අය කිරීම් පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ අංක 122(I) වැනි වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.12.28 වැනි දින අංක 1947/6 දරන පළාත් පාලන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* iv (ඇ) කොටසේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ හා 2016.08.03 වැනි දින 1978/22 දරන *ගැසට් පත්‍රය* මගින් ඉහත කී 1947/6 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* නිවැරදි කිරීමේ විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශීය තුළ යම් වීථියකට,පාරකට,ඇළකට , මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදි කිරීම හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු කළුතර ප්‍රාදේශීය සභාව විසින් 2024.01.01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු අය කළයුතු බවට මම තීරණය කරමි.

අනු. අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
1	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250/-	350/-	500/-
		1 ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 200/- ක් බැගින්		
2	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250/-	350/-	500/-
		3 ට වැඩි	3ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 200/- බැගින්		
3	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500/-	750/-	1000/-
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 300/- බැගින්		
4	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	500/-	750/-	1000/-
		1 ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා 300/- බැගින්		

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
5	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මඟින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250/-	350/-	500/-
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා 200/- බැගින්		
6	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750/-	850/-	1000/-
		1 ට වැඩි	1ට වැඩි වන සෑම වර්ගමීටරයක් හෝ එයින් කොටසක් සඳහා 500/- බැගින්		

12-635/4

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 හා 148 වැනි වගන්තීන්හි විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බද්දක් පහත සඳහන් ආකාරයට අය විය යුතු බව 2023.12.27 දිනැතිව තීරණ අංක 1405 පරිදි පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවනු ලබන වාහන හා සතුන් පිළිබඳ බද්ද යටතේ කිසියම් වාහනයක් හෝ සතකු තමා භාරයේ තබා ගන්නා දින ගණන දින 30 ක් වූ වහාම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව.

ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 හා 148 වැනි වගන්තීන්හි විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බද්දක් පහත සඳහන් ආකාරයට අය විය යුතු බව මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ සඳහන් සෑම වාහනයක්ම හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු මතම එහි 2 වන තීරුවේ නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

1 තීරුව	*2 තීරුව* *රු.ශත*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක් , මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින්රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	25.00
(අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18.00
(ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4.00
සෑම කරත්තයක් සඳහා	20.00
සෑම අත්කරත්තයක් සඳහා	10.00
සෑම රික්ෂෝවක් සඳහා	7.00
සෑම අශ්වයෙකු ,පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15.00
සෑම ඇතෙකු සඳහා	50.00

විෂ්කම්භය අඟල් 26 නොයික්මවන රෝද ඇති ළමා වාහන ,වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-635/5

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වන වගන්තියේ 1 වන උප වගන්තිය අනුව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව 2023.12.27 දිනැති තීරණ අංක 1406 පරිදි පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව

ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වන වගන්තියේ 1 වන උප වගන්තිය අනුව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි.එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වන වගන්තියේ 1 වන උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට, ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

ඒ. එකී ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැත්තේ නම් හෝ

ආ. ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක

ඇ. ඒ ඉඩමේ ඉදි කර ඇති ගොඩනැගිලි වලින් ආවරණය වූ ඉඩමේ බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1/3 ප්‍රමාණයට වඩා වන්නේ නම්,

එකී ඉඩම , සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහක (0.5%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ධ කළුතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

12-635/6

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ පනතේ 147 හා 149 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තුව පහත සඳහන් ආකාරයට විය යුතු බව 2023.12.27 දිනැති තීරණ අංක 1407 පරිදි පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව.

ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉහත කී තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ පනතේ 147 හා 149 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තුව පහත සඳහන් ආකාරයට විය යුතු මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය යටතේ කියවිය යුතු 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛණයෙහි 1 තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කළුතර ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයේ 2 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක් , ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී , ඊට අදාල බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය.	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන රු. 1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
2.	බත් කඩයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
3.	හෝටලයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
4.	නවාතැන් පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
5.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
6.	බේකරියක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
7.	පළතුරු බීම නිෂ්පාදනය හා පැකට් කර විකිණීම.	500 0	750 0	1,000 0
8.	ලැගුම්හලක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
9.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
10.	මාළු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.			
11.	යෝගට් නිෂ්පාදනය කිරීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
12.	අයිස් නිපදවීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
13.	බාබර් සැප්පුවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
14.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
15.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
16.	මල් ශාලාවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
17.	එළහරක් මස් විකිණීම.	500 0	750 0	1,000 0
18.	සංචාරක වෙළඳාම.	500 0	750 0	1,000 0
19.	ශබ්ද විකාශන යන්ත්‍ර ක්‍රියාකරවීම.	500 0	750 0	1,000 0
	පහත සඳහන් ව්‍යාපාර පීඩාකාරී ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය.			
1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	II වැනි තීරුව	
අනු. අංකය.	බලය දෙනු ලබන කාර්යය	වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන රු. 1,500 නොඉක්මවන විට	වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
2.	සම් පදම් කිරීම.	500 0	750 0	1,000 0
3.	සම් විකිණීම.	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
5.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
6.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
7.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
8.	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම.	500 0	750 0	1,000 0
9.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
13.	සබන් නිශ්පාදනය කිරීම.	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම.	500 0	750 0	1,000 0
15.	අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම.	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම.	500 0	750 0	1,000 0
21.	රසකැවිලි වර්ග නිපදවීම.	500 0	750 0	1,000 0
22.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම.	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම.	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර ගැනීම.	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම.	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම.	500 0	750 0	1,000 0
31.	පළතුරු. මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම.	500 0	750 0	1,000 0

අනු. අංකය.	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	II වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන රු. 1,500 නොඉක්මවන විට	වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම.	500 0	750 0	1,000 0
34.	කපුරු නිපදවීම.	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම.	500 0	750 0	1,000 0
37.	ලාකඩ නිපදවීම.	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
39.	පාසැල් රටහුණු නිපදවීම.	500 0	750 0	1,000 0
40.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.	500 0	750 0	1,000 0
41.	ටයර් නැවත පිරවීම.	500 0	750 0	1,000 0
42.	ටයර් ටියුබ් වොල්කනිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.	500 0	750 0	1,000 0
45.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම.	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම.	500 0	750 0	1,000 0
49.	ධාන්‍ය හෝ මාෂභෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය.				
1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර ගැනීම.	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිශ්පාදනය කිරීම.	500 0	750 0	1,000 0
3.	මුද්‍රණාලයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
4.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
5.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
6.	ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.	500 0	750 0	1,000 0
7.	දර ගබඩාවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0

අනු. අංකය.	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	II වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන රු. 1,500 නොඉක්මවන විට	III වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
8.	කළු ගල් කැණීම හෝ කැඩීම(යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්)	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම නිශ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිශ්පාදනය.	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිශ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	ගිණිපෙට්ටි නිශ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිශ්පාදනය හෝ ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම.	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම.	500 0	750 0	1,000 0
19.	පා පැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම.	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් මීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
24.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
25.	දැව ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
මෙම ව්‍යාපාර පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය.				
1.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් කිරීම.	500 0	750 0	1,000 0
3.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම.	500 0	750 0	1,000 0
4.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
5.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම.			
6.	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0

අනු. අංකය.	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන රු. 1,500 නොඉක්මවන විට	වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
7.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
8.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
9.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
10.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිශ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම.	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිශ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර ගැනීම.	500 0	750 0	1,000 0
16.	වෑල්ඩින් සඳහා සථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
18.	පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
19.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
20.	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.	500 0	750 0	1,000 0
21.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
22.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0

12-635/7

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනතේ බදු අය කිරීම

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලෙස, ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියේ බලතල ප්‍රකාරව 1912 අංක 12 දරන විනෝද බදු ආඥාපනත ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව විනෝද බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව 2023.12.27 දිනැති තීරණ අංක 1409 පරිදි තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර ප්‍රාදේශීය සභාව.

ගාලු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස, ඊ.ඩී.දේවපුර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියේ බලතල ප්‍රකාරව 1912 අංක 12 දරන විනෝද බදු ආඥා පනත ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව විනෝද බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි.එනම්,

කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රේක්ෂකයන්ගෙන් මුදල් අය කර පෙන්වනු ලබන ඕනෑම දර්ශනයක් වෙනුවෙන් සභාවේ මුද්‍රා තබනු ලබන ටිකට්පත්වල මුළු වටිනාකමින් 15% ක විනෝද බද්දක් 2024 වර්ෂයට පනවා අය කළ යුතු බවටත්,

විනෝද බදු ආඥා පනතේ 02 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය ප්‍රාකාරව, චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්,සර්කස් දර්ශනයක්, සෑම සංගීත දර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 15 % ක විනෝද බද්දක් ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

12-635/8

කළුතර ප්‍රාදේශීය සභාව

ක්‍රීඩා පිටි පරිහරණය කිරීමේ ගාස්තු පැනවීම - 2024 වර්ෂය

කළුතර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන,කාර්යය කර්තව්‍ය ඉටු කරන කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ.ඩී.දේවපුර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන අනුශාංගික කාර්යයන් ඉටු කිරීමේදී ක්‍රීඩා භූමි පරිහරණය කිරීම වෙනුවෙන් කළුතර ප්‍රාදේශීය සභාවට අය කර ගත යුතු ගාස්තු නැවත සංශෝධනය කරන තෙක් මෙහි පහත උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවටත් 2023.12.27 දිනැතිව තීරණ අංක 1410 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව.

ගාලු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් 14 දාතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා හා 1989 අංක 12 දරන ප්‍රාදේශීය සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 1947/6 හා 2015.12.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* නිවේදනයට අනුව සාදන ලද 2015 සැප්තැම්බර් 22 බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා අංක 1995 හා 2016. 11.25 දිනැති *ගැසට්* නිවේදනය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව වැළඳ ගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අය කිරීමට යෝජනා කරමි.

ක්‍රීඩා පිටිය වෙන් කිරීම (දිනකට)		*රු.ශත*
ව්‍යාපාරික කටයුතු සඳහා	-	5000.00
ව්‍යාපාරික නොවන කටයුතු සඳහා	-	1000.00

12-635/9

කළුතර ප්‍රාදේශීය සභාව

සේවා සඳහා අයකර ගත යුතු ගාස්තු පැනවීම - 2024 වර්ෂය

කළුතර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන,කාර්යය කර්තව්‍ය ඉටු කරන කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන අනුශාංගික කාර්යයන් ඉටු කිරීමේදී කළුතර ප්‍රාදේශීය සභාවට අය කර ගත යුතු ගාස්තු මෙහි පහත උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවටත් 2023.12.27 දිනැතිව තීරණ අංක 1411 යටතේ තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව

ගාලු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

අනු අංකය	*සේවාව*	*ගාස්තුව රු.*
01	සභාව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසැල් සඳහා ඇතුලත් වීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	250.00
02	පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත්‍ර	100.00
03	වරිපනම් ලේඛනයෙහි උද්ධෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු	ගාස්තු අය නොකෙරේ
04	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	ගාස්තු අය නොකෙරේ
05	වීථි රේඛා සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු	200.00
06	නොපරවා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර	200.00
07	වීථි රේඛා සහතික පත්‍ර නිකුත් කිරීම ගාස්තු	400.00
08	නොපරවා ගැනීමේ සහතික පත්‍ර නිකුත් කිරීම ගාස්තු	400.00
09	වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික නිකුත් කිරීම	200.00
10	වරිපනම් ලේඛනවල උද්ධෘත සනාථ කරන සහතික නිකුත් කිරීම පළමු වසර වැඩි වන වර්ෂයක් සඳහා	200.00 100.00
11	නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික නිකුත් කිරීම (අමතර තක්සේරු නිවේදනයක් නිකුත් කිරීම)	100.00

12-635/10

කළුතර ප්‍රාදේශීය සභාව

පොදු උපයෝගී සේවා, සුභ සාධක සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේදී
අයකර ගත යුතු ගාස්තු පැනවීම - 2024 වර්ෂය

කළුතර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන,කාර්යය කර්තව්‍ය ඉටු කරන කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන අනුශාංගික කාර්යයන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය සභා පනතට අය කර ගත යුතු ගාස්තු මෙහි පහත උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවටත් 2023.12.27 දිනැතිව තීරණ අංක 1412 යටතේ තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව.

ගාලු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

සේවාව	*ගාස්තුව රු.*
දේපළ හැරවීමේ අයදුම්පත්‍රය නිකුත් කිරීම	300.00
දේපළ හැරවීමේ අයදුම්පත්‍රය ලියා පදිංචි කිරීම	300.00
වරිපනම් නොගෙවන බවට සහතික නිකුත් කිරීම	500.00
අනතුරුදායක ගස් පෝරම ගාස්තු	150.00
අනතුරුදායක ගස් ලියාපදිංචිය - පළමු ගස සඳහා වැඩි වන එක් ගසක් සඳහා	400.00 150.00
අනුමත ගොඩනැගිලි සැලසුම් සත්‍ය පිටපතක් බව සහතික කිරීම - - නේවාසික - වාණිජ	 250.00 500.00
ගොඩනැගිලි සැලසුම් අතිරේක පිටපත් නිකුත් කිරීම නේවාසික වානිජ	250.00 500.00
අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා සභාව සතු ඉඩම් ලබා දීම (දිනකට)	3,000.00
පරිසර බලපත්‍ර ගාස්තු ස්ථානීය පරීක්ෂණ ගාස්තු	 3,000.00
පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු	4,500.00
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	1000
ඉදිකිරීම් කොන්ත්‍රාත් 01. රු.50,000.00 දක්වා 02. රු. 50,000 .00 සිට 100,000.00 දක්වා 03. 100,000.00 සිට 200,000.00 දක්වා 04. 100,000.00 සිට 1000,000.00 දක්වා 05. 100,000.00 ට වැඩි	1,000.00 1,000.00 2,000.00

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ආදායනය කිරීමේ ගාස්තු පැනවීම

කළුතර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන,කාර්යය කර්තව්‍ය ඉටු කරන කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් ඊ.ඩී.දේවපුර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ පැවරී ඇති බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී කළුතර ප්‍රාදේශීය සභාවට පහත සඳහන් සේවා හා වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන අනුශාංගික කාර්යයන් ඉටු කිරීමේදී කළුතර ප්‍රාදේශීය සභාවට අය කර ගත යුතු ගාස්තු මෙහි පහත උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත්,ආදායනාගාර පරිහරණය කිරීමේදී මෙම සේවා ගාස්තු අය කිරීම 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවටත් 2023.12.27දිනැතිව තීරණ අංක 1413 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව.

ගාලු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් සාදන ලදුව අංක 1888/47 හා 2014 නොවැම්බර් 14 දාතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළ ප්‍රාදේශීය සභා කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා සංශෝධන සහිතව පහත උපලේඛනයෙහි සඳහන් ආකාරයට 1989 අංක 12 දරන ප්‍රාදේශීය සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව 1947/6 හා 2015.12.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* නිවේදනයට අනුව සාදන ලද අතුරු ව්‍යවස්ථා අංක 1995 හා 2016. 11.25 දිනැති *ගැසට්* නිවේදනය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව වැළඳ ගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ පහත පරිදි ගාස්තු අය කිරීම මම තීරණය කරමි.

සේවාව	*ගාස්තුව* *රු. ශත*
ආදායනය කිරීමේ ගාස්තු බලප්‍රදේශය තුල බල ප්‍රදේශයෙන් පිටත	 10,000.00 20,000.00
අළු තැන්පත් කිරීම (2 x 2 බිම් කොටසක් වෙන් කිරීම)	5000.00
දර සෑය සඳහා අවසර ලබා දීම	500.00
භූමි දානය සඳහා අවසර ලබා දීම	500.00

12-635/12

කළුතර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල,කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස ඊ.ඩී.දේවපුර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව

තීරණ පොතෙහි 2023.12.27 දිනැතිව තීරණ අංක 1408 යටතේ 2024 වර්ෂය සඳහා වරිපනම් බදු නියම කිරීමට පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.තවද එකී තීරණයට අදාළව 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලැබී ඇති බැව් වැඩිදුරටත් නිවේදනය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බදු මාර්තු 31, ජුනි 30,සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුලදී සමාන වාරික 04 න් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. ඩී. දේවපුර,
කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා
කළුතර ප්‍රාදේශීය සභාවේ,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කළුතර ප්‍රාදේශීය සභාව.

ගාලු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

තීරණය

කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස ඊ.ඩී.දේවපුර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව2024 වර්ෂය සඳහා වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි.

